


# ශ්‍රී ලංකා තේ මණ්ඩලය
# වාර්ෂික වාර්තාව
# 2013

**තැපැල් ලිපිනය:**
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574, ගාලු පාර
කොළඹ - 03
ශ්‍රී ලංකාව.

**කේබල්:**
තේ මණ්ඩලය , කොළඹ.

**දුරකථන:**
+94-11-2587814
+94-11-2582121
+94-11-2583687

**ෆැක්ස්:**
+94 112587341
+94 112589132

**විද්‍යුත් තැපෑල:**
teaboard@pureceylontea.com

**අන්තර්ජාලය:**
www.pureceylontea.com

# පටුන


| | | |
|---|---|---|
| දැක්ම සහ මෙහෙවර | ------- | 04 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින් | ------- | 05 |
| විගණන කමිටුවේ සාමාජිකයින් | ------- | 06 |
| ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුවේ සාමාජිකයින් | ------- | 07 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය | ------- | 09 |
| සභාපතිගේ පණිවුඩය | ------- | 10 |
| මූලික සංසන්ධනාත්මක දර්ශක | ------- | 14 |
| සංස්ථාපිත පසුබිම | ------- | 15 |
| කර්මාන්ත පැතිකඩ - 2013 | ------- | 18 |
| මණ්ඩලය විසින් ඉටුකරන ලද කාර්යයන් | ------- | 49 |
| තේ කොමසාරිස් අංශය | ------- | 49 |
| තේ අපනයන ශාඛාව | ------- | 55 |
| තේ ප්‍රවර්ධන අංශය | ------- | 57 |
| තේ රස පිරික්සුම් ඒකකය | ------- | 71 |
| විශ්ලේෂණ රසායනාගාරය | ------- | 74 |
| පරිපාලන අංශය | ------- | 78 |
| අභ්‍යන්තර විගණන අංශය | ------- | 80 |
| තොරතුරු විද්‍යා අංශය | ------- | 80 |
| මූල්‍ය සමාලෝචනය | ------- | 82 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල | ------- | 98 |

# දැක්ම

ශ්‍රී ලාංකීය තේ ගෝලීය වෙළඳපොලේ වඩාත් ආකර්ෂණීය පානයන් අතර ප්‍රමුඛතම ස්ථානයට පත්කරලීම.

# මෙහෙවර

කර්මාන්තයේ තිරසර සංවර්ධනය තුළින් රටට ලැබෙන විදේශ විනිමය ඉපැයීම් ඉහළ නංවා ගැනීම හා එමඟින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සහතික වීම.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | ජානකී කුරුප්පු මිය |
| **මණ්ඩලයේ ලේකම්** | ඩී. ඩබ්. එස්. නාරංගොඩ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය.<br>(2013.08.21 දක්වා) |
| **මණ්ඩලයේ සාමාජිකයින්** | |
| සාමාජික | පී.එල්.යූ. දිසානායක මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නියෝජනය<br>(2013.05.16 දක්වා)<br>පී.ඩී.ඩබ්.ජයවර්ධන (2013.05.17 සිට 2013.09.12 දක්වා)<br>ඒ.එන්.යූ.කේ.එස්.මිහිඳුකුලසූරිය මහතා<br>(2013.09.13 සිට) |
| සාමාජික | මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නියෝජනය<br>පුෂ්පා වෙල්ලප්පිලි මිය<br>මහාභාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්<br>රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| සාමාජික | එන්.පී.කාරියවසම් මහතා<br>සභාපති, ශ්‍රී ලංකා කුඩා තේවතු සංවර්ධන අධිකාරිය |
| සාමාජික | ජයන්ත කැරගල මහතා<br>සභාපති, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය |
| සාමාජික | එස්.කේ.එල්.ඔබේසේකර මහතා<br>සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (2013.09.26 දක්වා)<br>රොෂාන් රාජදුරේ මහතා (2013.09.27 සිට) |
| සාමාජික | දිපාල් ජයමාන්න මහතා<br>සභාපති, කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය (2013.05.16 දක්වා)<br>ජෙහාන් අල්ගම මහතා (2013.05.17 සිට) |
| සාමාජික | රොහාන් ප්‍රනාන්දු මහතා<br>සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය (2012.11.14 සිට) |
| සාමාජික | සංවර්ධන සමිති නියෝජිත<br>නෙවිල් රත්නායක මහතා<br>සභාපති, ශ්‍රී ලංකා කුඩා තේවතු හිමියන්ගේ සංගමය (2012.12.31 සිට) |
| සාමාජික | අනිල් පෙරේරා මහතා<br>සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය |
| නිරීක්ෂකයින් | ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් නම් කරන ලද සාමාජික<br>ජෙෆ් ඇලෝසියස් මහතා<br>ආචාර්ය එස්.එස්.බී.පී. ජයවර්ධන<br>ටී. සම්බසිවම් මහතා |

# විගණන කමිටුවේ සාමාජිකයන්

| | |
|---|---|
| සභාපති | **පුෂ්පා වෙල්ලප්පිලි මිය**<br>මහාභාණ්ඩාගාර ලේකම්<br>රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව<br>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය |
| කමිටුවේ සාමාජිකයින් | |
| සාමාජික | **පී.එල්.යූ. දිසානායක මහතා**<br>අතිරේක ලේකම් (සංවර්ධන) (2013.03.25 දක්වා)<br><br>**පී.ඩී.ඩබ්.ජයවර්ධන මහතා**<br>අතිරේක ලේකම් (පරිපාලන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2013.05.22 සිට 2013.08.23 දක්වා) |
| සාමාජික | **ජයන්ත කැරගල මහතා**<br>සභාපති,<br>තේ අපනයනකරුවන්ගේ සංගමය |
| සාමාජික | **අනිල් පෙරේරා මහතා**<br>සභාපතිගේ නියෝජිත<br>ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය |
| නිරීක්ෂක | **සී.එම්.එස්.ඇන්තනී මහත්මිය**<br>විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| කැඳවුම්කරු | **ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා**<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>(2013.01.01 සිට 2013.08.21 දක්වා)<br><br>**එන්.ඒ.යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා**<br>අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන)<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය (2013.09.23 සිට) |

# ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුවේ සාමාජිකයින්

ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුව වූකලි ලංකා තේ අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් ලබාදීම සඳහා පත්කරනු ලැබූ අනු කමිටුවකි.

**සභාපති**

**ජානකී කුරුප්පු මිය**
සභාපතිනි, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**කමිටුවේ සාමාජිකයින්**

**රාජ්‍ය අංශය**

**පී.එල්.යූ. දිසානායක මහතා**
අතිරේක ලේකම් (සංවර්ධන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
(2013.04.05 දින දක්වා)

**ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
(2013.04.05 දක්වා)

**හසිත ද අල්විස් මහතා**
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**එන්.ඒ.යූ.කේ.එස්.මිහිඳුකුලසූරිය මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
(2013.11.04 දින සිට)

**පී.ඩී.ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
වාණිජ දෙපාර්තමේන්තුව
(2013.04.05 දක්වා)

**ආර්.ඩී.එස්.කරුණාරත්න මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
වාණිජ දෙපාර්තමේන්තුව
(2013.11.04 සිට)

**පෞද්ගලික අංශය**

**මාලින් ගුණතිලක මහතා**
මහලේකම්
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

**රවී අබේවර්ධන මහතා**
සාමාජික
පුද්ගලික තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

**අනිල් කුක් මහතා**
නියෝජිත
කොළඹ බ්‍රෝකර්කරුවන්ගේ සංගමය
(2013.04.05 දින දක්වා)

**රොහාන්ත අතුකෝරාල මහතා**
ප්‍රධානි නැෂනල් පෝට්ෆෝලියෝ ඩිවෙලොප්මන්ට්" (UNOPS)

**ආචාර්ය එස්.එස්.බී.ඩී.ජී.ජයවර්ධන මහතා**
සභාපති,
තේ පර්යේෂණ මණ්ඩලය

**නෙවිල් රත්නායක මහතා**
සභාපති, ශ්‍රී ලංකා කුඩා තේවතු සංවර්ධන සමිති සම්මේලනය

**ආචාර්ය ගාමිණී අබේවික්‍රම මහතා**
කළමණාකාර අධ්‍යක්ෂ
සී.ස. බැසිලියර් තේ අපනයනකරුවෝ
(පුද්ගලික සමාගම)

**මුෆ්ඩෙල් ජෞෆර්ජී**
කළමණාකාර අධ්‍යක්ෂ
ජෞෆර්ජී බ්‍රදර්ස්

**රොමේෂ් මොරායස් මහතා**
අධ්‍යක්ෂක
ෆින්ලේස් කලම්බු පුද්. සමාගම

**ජයන්ත කරුණාරත්න මහතා**
ප්‍ර.වි.නි.
සී.ස.ඉම්පීරියල් ටී (පුද්ගලික) සමාගම

**මලික් ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ
එම්.ජේ.එෆ්.සමූහ ව්‍යාපාර

**රොහාන් ප්‍රනාන්දු මහතා**
ප්‍ර.වි.නි.
එච්.වී.ඒ.සමූහ ව්‍යාපාර

**නිරාජ් ද මෙල් මහතා**
කළමනාකාර අධ්‍යක්ෂ
සී.ස.වැන් රීස් සිලෝන් සමාගම

**ටියාබ් අක්බරාලි මහතා**
අධ්‍යක්ෂ
සී.ස.අක්බාර් බ්‍රදර්ස් සමාගම

**අයිවි ද සිල්වා මහතා**
අධ්‍යක්ෂ
තේ අංශ ප්‍රධානී
සී.ස.යුනිලිවර් සිලෝන් සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | **ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා** (2013.08.21) |
| අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) | **එන්.ඒ.යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා** (2013.09.23) |
| අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | **ඒ.එච්. ද අල්විස් මහතා** |
| තේ කොමසාරිස් | **ජ්.ඒ.ජේ.කේ. එදිරිසිංහ මහතා** |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) | **එස්.අයි.සී.පෙරේරා මහතා** |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) | **ඒ.ඩී.ඩබ්. බණ්ඩාරගේ මහත්මිය** |
| අධ්‍යක්ෂ (විශ්ලේෂණාත්මක සේවා) | **ආචාර්ය එම්.ඒ.එන්.ජයතිලක මහතා** |

# සභාපතිනියගේ පණිවුඩය



සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉටු කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් සහ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව වන මෙම පණිවුඩය මා ඔබ හමුවේ තබනුයේ ඉමහත් ප්‍රීතියෙනි. 2013 වර්ෂය වූ කලී ශ්‍රී ලංකා තේ කර්මාන්තය තුළ එතෙක් බිහිකර තිබූ ප්‍රධාන කාර්යසාධන දර්ශක අභිබවමින් නව වාර්තා බිහිකළ සුවිශේෂී වර්ෂයක් විය. වසර 146ක ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියන මෙම කර්මාන්තයේ එතෙක් මෙතෙක් වාර්තාකළ ඉහළම නිෂ්පාදිතය වූ තේ කිලෝ මිලියන 340ක ප්‍රමාණය එනම් 2012 වර්ෂයේ නිෂ්පාදනයට වඩා 3.5% ක වර්ධනයක් සහ තේ අපනයනයේ මෙතෙක් වාර්තා කළ ඉහළම ආදායම වූ රුපියල් බිලියන 199.44 ක ප්‍රමාණය එනම් 2012 වර්ෂයේ ආදායමට වඩා 10.5%ක වර්ධනය පිළිබඳ වාර්තා එකී වාර්තාවලට ඇතුළත් වේ. උන්නතාංශ අනුව ඉහළම නිෂ්පාදන වර්ධනය මධ්‍යම උන්නතාංශවලින් වාර්තා වන අතර අනතුරුව පිළිවෙලින් පහළ උන්නතාංශවල සහ ඉහළ උන්නතාංශවල නිෂ්පාදනයේ වර්ධනය පිළබිඹු කරයි. අපනයන ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ක්ෂණික තේ අපනයනයේ 19%ක වර්ධනයක් සහ හරිත තේ අපනයනයේ 21%ක වර්ධනයක් සිදු වී ඇති අතර නව වෙළඳපොල අවස්ථා අත්පත් කරගැනීම පිණිස නිෂ්පාදන විවිධාංගිකරණයක අවශ්‍යතාවය එමඟින් සනිටුහන් කරයි. තවද, 2013 වර්ෂයේ මාස 12 තුළ නැවතෙක් වියදම් රහිත සාමාන්‍ය මිල රු.623.91 ක් වූ අතර එය 2012 වර්ෂය හා සැසඳීමේදී 10.6% ක පමණ වර්ධනයකි. එනම් එ.ජ.ඩො. 4.8 ක් තුළ 9.3% ක වර්ධනයකි. මෙවන් වූ පසුබිමක් තුළ 2016 වර්ෂය වන විට රුපියල් බිලියන 260 ක අපනයන පිරිවැටුමක් සහ තේ කිලෝ මිලියන 358 ක නිෂ්පාදනයක් ළගාකර ගැනීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉලක්කය වී ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මානව සම්පත් සහ තොරතුරු තාක්ෂණයට අදාළව මෙහෙයුම් ක්‍රමවේදය වර්ධනය කිරීමේ

සැලසුම්වල අඛණ්ඩව නිරතව සිටී. මණ්ඩලය මේ වන විට එහි කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු බොහොමයක් පුරවා ඇති අතර එය කාර්ය සාධන වර්ධනය සඳහා අවශ්‍යවන එහෙත් බොහෝ කාලයක් පුරා සපුරා නොතිබූ නිර්ණායකයකි. තවද මේ වනවිට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය තාක්ෂණික සහ අනෙකුත් අංශවල පුහුණුවීම් සඳහා නිතිපතා යොමුකරනු ලැබේ. මණ්ඩල ඉතිහාසයේ ප්‍රථම වතාවට කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය උදෙසා බාහිර පුහුණු කඳවුරක් කුකුලේගඟ නිකේතනයේදී පවත්වන ලදී. මෙය ඔවුනට නවමු අත්දැකීමක් වූ අතර සියල්ලෝම තෘප්තිමත්ව පුහුණුවීම්වල නිරත වූහ.

සංවර්ධන අංශයෙන් බලනකල සමාලොචිත වර්ෂය තුළ දී හෙක්ටයාර 143.5 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි තේ නැවත වගාකිරීම සඳහා සහනාධාර වශයෙන් රුපියල් මිලියන 14 කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය කරන ලද අතර කර්මාන්තශාලා නවීකරණ සහනාධාර වශයෙන් කර්මාන්තශාලා 35ක් සඳහා ප්‍රදානය කිරීම පිණිස රුපියල් මිලියන 18ක් වැය කරන ලදි. මෙම සහනාධාර බොහොමයක් තේ මණ්ඩලයේ දී බෙදා දීමට අපට අවශ්‍ය වූ නමුත් එකී සහනාධාර ලබාදීම අවස්ථා කිහිපයකදී සිදුවීම නිසා සහනාධාර කඩිනමින් ලබාදීම සම්පූර්ණයෙන්ම මණ්ඩලයේ පාලනය යටතේ සිදු නොවුණි. එමෙන්ම සහනාධාර සඳහා අයදුම්කළ සමාගම්වලට සහ තේ වගාකරුවන්ට සහනාධාරයේ මුළු මුදල ලැබීමට පෙර නැවත වගාකිරීමේ සහ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ අදියරයන් කිහිපයක් සම්පූර්ණ කිරීමට සිදුවිය. පසු අස්වනු හානි අවමකිරීම සහ තේවල විශිෂ්ට තත්ත්වය වර්ධනය කිරීම අරඹයා ක්‍රියාත්මක කරන ලද B-Leaf 60 වැඩසටහන විශිෂ්ඨ ප්‍රතිඵල අත්පත් කරගත් අතර තේ පත්‍රවල තත්ත්වය සහ ලබාගත් මිල පිළිබඳව වූ යහපත් බලපෑම පිළිබඳ ප්‍රතිඵල දැකීමෙන් පසු බොහෝ කර්මාන්ශාලා තම ප්‍රයත්නය හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීමට තරම් ආකර්ෂණයක් එකී වැඩසටහන දිනාගන්නා ලදි.

2013

තවද, නියාමන කාර්යයේදී තේ මණ්ඩලයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇති 250කට වඩා වැඩි තේ මිශ්‍ර කිරීමේ සහ ඇසුරුම් කිරීමේ ගබඩා පරීක්ෂාවට ලක් කරන ලද අතර ඒවායේ තත්ත්වය අනුව ශ්‍රේණිගත කරන ලදී. අවම තත්ත්වයේ නොපවතින ගබඩා ඊළඟ වර්ෂය සඳහා ලියාපදිංචි වීමට ප්‍රථම ඒවායේ තත්ත්වය වර්ධනය කරගත යුතු බවට අවසන් නිවේදන නිකුත් කරන ලදී.

කර්මාන්තය සඳහා උසස් පරීක්ෂණ පහසුකම් ලබාදීම පිණිස මෙන්ම තත්ත්ව පරීක්ෂා සඳහා තේ මණ්ඩලයට අවශ්‍ය වන අතිරේක පරීක්ෂා කිරීම් සිදු කිරීමට හැකිවන පරිදි අතිරේක කාර්ය මණ්ඩලයක් සහ උපකරණ ද සහිතව තේ මණ්ඩලයේ පරීක්ෂණාගාරයද සවිබල ගන්වන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2013 වර්ෂයේදී ද සුවිශේෂී ඉතිහාසයක් නිර්මාණය කළේය. 2013 ජනවාරි මස 07 වැනි දින ජාත්‍යන්තර තේ නිෂ්පාදකයින්ගේ සංසදය ශ්‍රී ලංකාවේදී පිහිටුවනු ලැබූ අතර ශ්‍රී ලංකාව, ඉන්දියාව, කෙන්යාව, ඉන්දුනීසියාව, රුවන්ඩා, මලාවි සහ ඉරානය එහි ආරම්භක සාමාජිකයෝ වූහ. මෙය වූ කලී මෙවැනි සංසදයක් පිහිටුවීම සම්බන්ධයෙන් තේ නිපදවන රටවල් විසින් වසර 30ක පමණ කාලයක් පුරා දරන ලද අසාර්ථක ප්‍රයත්නයන්ගෙන් පසුව ලත් ජයග්‍රහණයකි. මෙහි සමාරම්භක උත්සවය තේ නිපදවන සියලුම රටවල්වල තේ මණ්ඩලවල සාමාජිකයින් පිරිසකගේ සහ කෙන්යාවේ, ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ විෂය භාර අමාත්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් කොළඹදී පවත්වන ලදී. මෙහි සුවිශේෂිත කරුණ වූයේ ගෝලීය තේ කර්මාන්තයේ යහපත උදෙසා වන සංසදයේ කෙටුම්පත් ව්‍යවස්ථාවට සහ අවබෝධතා ගිවිසුමකට එකී රටවල් 7 අත්සන් තැබීමයි.

අනෙකුත් ඓතිහාසික කරුණ වන්නේ ශ්‍රී ලංකාවට අයත් ලෝක ප්‍රචලිත අසමසම සන්නම් දෙකක් එක්කරමින් වසර 03ක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ජාත්‍යන්තර අනුග්‍රාහකයා බවට පත් වීමයි.

මෙය ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රචාරණය කිරීම උදෙසා දරන ලද ප්‍රථම ප්‍රධාන ප්‍රයත්නය ලෙස සඳහන් කරනු ලැබිය හැකි අතර විශේෂයෙන් ලංකා තේ සඳහා නව වෙළඳපොලවල් සහ පෙර පැවති වෙළඳපොලවල් ඉලක්ක කරගනිමින් ජාත්‍යන්තර රූපවාහිනී නාලිකා හරහා සන්නම් පිළිබඳ දැනුවත් කිරීමේ කාර්යය උපරිම ලෙස ඉටුකර ගැනීම පිණිස ලංකා තේ හා ශ්‍රී ලංකා නාමය එකට යා කිරීමේ අභිමතාර්ථය ඇතිව එය ක්‍රියාත්මක කරන ලදි. එයට අමතරව ලංකා තේ 2013 චෝගම් සමුළුවේ ව්‍යාපාරික සංසදයේ සුවිශේෂී අනුග්‍රාහකයෙකු බවට පත්වූ අතර ව්‍යාපාරික සංසදයට, මාධ්‍ය සංසදයට සහ ජනකලා කේන්ද්‍රයේ පැවැති ප්‍රදර්ශනයට සහභාගි වූ විදේශීය ව්‍යාපාරිකයින් දහස් ගණනක් අතර ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා එය අවස්ථාවක් කරගන්නා ලදි.

ශ්‍රී ලංකා තේ කර්මාන්තය සහ එහි ලංකා තේ සන්නම සඳහා ලෝකයේ තේ ප්‍රභේදනයක හිමිකාරීත්වය සඳහා ශක්තිමත් පදනමක් පවතින බව මාගේ විශ්වාසයයි.

ලංකා තේ කර්මාන්තයේ නව පිබිදීමක් මේ වනවිට අපි දකිමින් සිටින්නෙමු. නියමිත අවස්ථාවන්හිදී අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට අපි ඉමහත් කැමැත්තකින් පසුවන අතර ඒ සඳහා අවැසි අවස්ථාවන් ලබාගැනීමට අපට හැකිවනු ඇත.

**ජානකී කුරුප්පු**
සභාපතිනිය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# මූලික සංසන්ධනාත්මක දර්ශක

| තේ නිෂ්පාදනය | | | | |
|---|---|---|---|---|
| තේ නිෂ්පාදනය | 2011 | 2012 | 2013 | 2012 හා 2013 වසර සංසන්ධනය (%) |
| මුළු තේ නිෂ්පාදනය (කිලෝ.මිලි.) | 327.5 | 328.3 | 340.0 | 3.5 |
| උන්නතාංශ අනුව වර්ගීකරණය (කිලෝ.මිලි.) | | | | |
| ඉහළ | 78.2 | 73.6 | 75.8 | 2.9 |
| මධ්‍යම | 52.6 | 52.6 | 56.1 | 6.6 |
| පහළ | 196.7 | 202.1 | 208.1 | 2.9 |
| පිරිසැකසුම් ක්‍රමවේදය අනුව වර්ගීකරණය (කිලෝ.මිලි.) | | | | |
| සාම්ප්‍රදායික (ජෛව, ක්ෂණික, නැවත ලබාගත්) | 302.0 | 302.1 | 314.0 | 3.9 |
| සී.ටී.සී. | 22.6 | 23.3 | 13.7 | 41.2 |
| හරිත | 3.0 | 3.0 | 3.7 | 23.3 |
| තේ විකුණුම් | | | | |
| සමස්ත තේ විකුණුම් ප්‍රමාණය (කිලෝ.මිලි.) | 323.3 | 325.4 | 335.5 | 3.1 |
| සමස්ත තේ විකුණුම් ඒකක මිල (රු.කිලෝ.) | 360.53 | 392.03 | 444.75 | 13.4 |
| උන්නතාංශ අනුව විකුණුම් ප්‍රමාණය (කිලෝ.මිලි.) | | | | |
| ඉහළ | 73.8 | 69.8 | 71.4 | 2.3 |
| මධ්‍යම | 52.4 | 52.4 | 54.4 | 3.8 |
| පහළ | 197.1 | 203.2 | 209.8 | 3.2 |
| උන්නතාංශ අනුව ඒකක මිල (රු.කිලෝ.) | | | | |
| ඉහළ | 333.28 | 379.18 | 407.91 | 7.6 |
| මධ්‍යම | 319.48 | 350.86 | 396.97 | 13.1 |
| පහළ | 381.65 | 407.06 | 469.67 | 15.4 |
| තේ අපනයනය (ප්‍රති අපනයනය හැර) | | | | |
| ප්‍රමාණය (කිලෝ.මිලි.) | 303.2 | 306.0 | 311.1 | 1.7 |
| අගය (රු.බිලි.) | 151.8 | 169.0 | 190.8 | 12.9 |
| කලු තේ | 298.8 | 302.0 | 306.3 | 1.4 |
| හරිත තේ | 2.5 | 2.4 | 2.9 | 20.8 |
| ක්ෂණික තේ | 1.9 | 1.6 | 1.9 | 18.8 |
| මුළු තේ අපනයනය (ප්‍රති අපනයනය සමඟ) | | | | |
| ප්‍රමාණය (කිලෝ.මිලි.) | 322.6 | 319.9 | 319.7 | 0.1 |
| අගය (රු.බිලි.) | 164.9 | 180.4 | 199.4 | 10.5 |

# 01 සංස්ථාපිත පසුබිම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය 1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 සහ 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 වැනි දින ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සහ ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම තේ මණ්ඩල පනත යටතේ තේ මණ්ඩලයේ ප්‍රධාන අභිමතාර්ථයන් වේ. මෙම කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරන බලධරයා වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිෂ්පාදනය අධීක්ෂණය කිරීම, තත්ත්ව සහතික කිරීම, තේ අලුතින් වගාකිරීම, නැවත වගාකිරීම, පැරණි තේවතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා ස්ථාපිත කිරීම සහ මෙහෙයුම් සිදු කිරීම, කර්මාන්තශාලා ඉහළ නැංවීම සඳහා ලබාදෙන සහනාධාර පිළිබඳ අධීක්ෂණය කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ තේවල තත්ත්ව සහතිකකරණය ක්‍රියාත්මක කිරීම යන කටයුතු සිදුකරනු ලබයි.

විකුණුම් අවස්ථාවේ තේවල ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම, අපනයනයට පෙර තේ අධීක්ෂණය කිරීම, බ්‍රෝකර්කරුවන්ගේ, මිශ්‍රකරන්නන්ගේ සහ අපනයනකරුවන්ගේ ගබඩා පරීක්ෂා කිරීම සහ සෞඛ්‍යාරක්ෂිත ලෙස තේ මිශ්‍ර කිරීම සහ ඇසුරුම් කිරීම පිළිබඳ උපදේශන සේවා සැපයීම යන කාර්යයන් පිළිබඳවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය සම්බන්ධ වී කටයුතු කරයි. මෙයට අමතරව තේ වතු කළමනාකරණයේ සහ තේ නිෂ්පාදනයේ හා අලෙවිකරණයේ යෙදී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීම ද මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

උනන්දුකාර පාර්ශවකරුවන් සහ අපනයන සංවර්ධන මණ්ඩලය, විදේශ කටයුතු අමාත්‍යාංශය, වෙළඳ හා වානිජ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය වැනි රජයේ අනෙකුත් සංවිධානවල සහයෝගය ඇතිව "ලංකා තේ" ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ කටයුතු තිවු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සැලසුම් කරමින් සිටී. මෙයට අමතරව ලංකා තේ නාමය ගෝලීයව හා දේශීයව ආරක්ෂා කිරීම සඳහා දැනටමත් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ප්‍රධාන ලේකම් කාර්යාලය, තේ කොමසාරිස්වරයාගේ අංශය, තේ ප්‍රවර්ධන අංශය සහ විශ්ලේෂණාත්මක පරීක්ෂණාගාරය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංග ලෙස ක්‍රියාත්මක වන අතර මෙම සියලුම අංග තේ කර්මාන්තයේ උන්නතිය උදෙසා කටයුතු කරමින් සිටී.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ව්‍යුහය

## 1.1 ප්‍රධාන ලේකම් කාර්යාලය

මණ්ඩලය විසින් සිදුකරනු ලබන සියලුම කටයුතු පිළිබඳ සමස්ත අධීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය වගකීම දරයි. ප්‍රධාන ලේකම් කාර්යාලය සභාපතිගේ කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, පරිපාලන අංශය, මූල්‍ය අංශය, අභ්‍යන්තර විගණන ඒකකය, සංඛ්‍යාලේඛන සහ තොරතුරු තාක්ෂණ ඒකකය සහ පුස්තකාලය යන අංශවලින් සමන්විත වේ.

### 1.1.1 පරිපාලන අංශය

මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය, ප්‍රසම්පාදනය සහ ගබඩා, නඩත්තු, මෙහෙයුම්, යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් සමස්ත වගකීම පරිපාලන අංශය විසින් දරනු ලබයි.

### 1.1.2 මූල්‍ය අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමස්ත මූල්‍ය පාලනය සහ කළමනාකරණය පිළිබඳ වගකීම දරනුයේ මූල්‍ය අංශයයි. මණ්ඩලය සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම, වාර්ෂික අයවැය, වාර්ෂික මූල්‍ය වාර්තා, මාසික ගිණුම් සහ අතුරු වාර්තා සකස් කිරීම, ඉන්වෙන්ටරි සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පවත්වාගෙන යාම සහ වාර්ෂික ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රධාන කටයුතු වේ.

## 1.2 තේ කොමසාරිස් අංශය

තේ වගා කිරීම, නිෂ්පාදනය, ගුණාත්මක සංවර්ධනය, නිමි තේ අපහරණය කිරීම, තේ ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, ආනයනය සහ අපනයනය හා සම්බන්ධ සියලුම කටයුතු නියාමනය කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. ප්‍රාදේශීය කාර්යාල හයක ජාලයක් හරහා මෙම අංශයේ මෙහෙයුම් සිදුකෙරේ.

## 1.3 තේ ප්‍රවර්ධන අංශය

විදේශීය කාර්යාලවලද සහයෝගය ඇතිව ශ්‍රී ලංකා තේ දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ සියලුම කටයුතු පිළිබඳ වගකීම මෙම අංශය විසින් දරනු ලබයි. තවද කර්මාන්තයේ ඉල්ලුම පරිදි විටින්විට වෙළඳපොල පිළිබඳ දැනුම ලබාදීමද මෙම අංශය විසින් සිදුකරනු ලබයි. දේශීය ගැනුම්කරුවන්ට මෙන්ම විදේශිකයන්ටද ප්‍රයෝජනවත් වන තේ අලෙවිකුටියක්ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ. තේ රස පරීක්ෂකයන්ගෙන් සැදුම්ලත් ස්වාධීන මණ්ඩලයක් මගින් තේවල අවම ගුණාත්මක තත්ත්වය, සිංහ ලාංඡනය යටතේ නියමිත තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීම මෙන්ම අනෙකුත් තේ ප්‍රභව පිළිබඳ පරීක්ෂා කිරීම පිළිබඳ වගකීම තේ

ප්‍රවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන තේ පිරික්සුම් ඒකකය විසින් දරනු ලබයි. එමෙන්ම මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, විදේශයන්හි ශ්‍රී ලංකා ධූත මණ්ඩල සේවාවන්ට අනුයුක්ත තේ ප්‍රවර්ධන කාර්යාලවල සහ වාණිජ කාර්යාලවල සහාය ඇතිව ජාත්‍යන්තර ආහාර පාන පොළවල්වලට සහභාගිවීම, සන්නම් ප්‍රවර්ධන සහ වර්ග ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගිවීම මෙම අංශය විසින් සිදුකරනු ලබයි. ජාත්‍යන්තර තේ සංගම් සහ සභා, තේ පිළිබද අන්තර් රාජ්‍ය කණ්ඩායම් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමද මෙම අංශය සිදුකරයි.

## 1.4 විශ්ලේෂණ රසායනාගාරය


තේවල තත්ත්වය පවත්වාගෙන යාම පිණිස උසස් තාක්ෂණික උපකරණ භාවිතා කොට තේවල රසායනික, ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක සහ පළිබෝධනාශක ශේෂ තත්ත්ව පරාමිතීන් පිළිබඳ පරීක්ෂා කිරීම සහ තත්ත්ව සහතික නිකුත්කිරීම මෙම අංශයේ වගකීම වේ. ඒ අනුව සෑම ඒකකයක් විසින්ම ගුණාත්මක තත්ත්ව සහතිකකරණ කාරණය සම්බන්ධයෙන් කේවල වශයෙන් සිය දායකත්වය ලබා දෙනු ලබන අතර එමඟින් “ලංකා තේ” නාමය සුරැකීම සඳහා සහාය ලැබෙනු ඇත.

# 02 කර්මාන්ත පැතිකඩ-2013

ක්ෂේත්‍රයේ පවත්වාගෙන යනු ලැබූ නිදහස් යෙදවුම් සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත්වලට අමතරව පැවැති හිතකර කාළගුණික තත්ත්වය හේතු කොටගෙන මෙම වර්ෂයේදී තේ නිෂ්පාදනයේ වර්ධනයක් ඇතිවිය. පොහොර සහනාධාරය අඛණ්ඩව ලබාදීමද වර්ෂයේදී මෙම වර්ධනය අත්පත් කරගැනීමට ඉවහල් විය. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කිලෝ මිලි. 340.0 ක් වූ අතර එය 2012 වර්ෂයේදී නිෂ්පාදනය කරනු ලැබූ කිලෝ මිලි. 328.3 හා සැසඳීමේදී 3.5% ක වර්ධනයක් පිළිබිඹු කරයි. වර්තමානයේ පරිනත (අස්වනු නෙලන) තේ හෙක්ටයාර ප්‍රමාණය 194,508 කි. 2013 වර්ෂයේදී හෙක්ටයාරයක තේ නිෂ්පාදන ප්‍රමාණ කිලෝග්‍රෑම් 1688 සිට 1748 දක්වා (පරිනත තේ ප්‍රමාණය මත) වර්ධනය වී ඇත. වර්ෂය අවසානයේදී කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක මිල රු. 444.42 ක සාමාන්‍යයක් පවත්වා ගෙන යනු ලැබූ අතර එය පූර්ව වර්ෂයට වඩා රුපියල් 52.19 ක වර්ධනයකි.

## 2.1.තේ ඉඩම් ව්‍යාප්තිය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ තේ වගාකර ඇති මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 204,406 කි. අනතුරුව ඒවායේ කළමනාකරණ නිර්ණායක අනුව එම ප්‍රමාණයෙන් (59%) පුද්ගලික අංශයෙන්ද, (36%) සංස්ථාවලින්ද, (5%) ක් රාජ්‍ය අංශයෙන්ද සමන්විත වේ. තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්ත්වයක් පැවතිම හේතුකොටගෙන ප්‍රධාන වශයෙන් තෙත්කලාපයේ ප්‍රදේශ ඇතුළුව දිස්ත්‍රික්ක කිහිපයක් තුළ තේ වගාව ව්‍යාප්තකර ඇත.




වගුව 2.1 තේ ඉඩම් හිමිකාරිත්වය

## 2.2.ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය

වගුව 2.2 සමස්ත තේ නිෂ්පාදනය

| උන්නතාංශය | නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|
| ඉහළ | 75,776,81 |
| මධ්‍යම | 56,127,36 |
| පහළ | 208,122,3 |
| එකතුව | 340,026,480.77 |

2013 වර්ෂයේ ප්‍රථම භාගයේදී තේ වගාකරන ප්‍රදේශවල පැවැති අතිශය අහිතකර කාලගුණික තත්ත්වයට අනතුරුව වර්ෂයේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 340.0 ක් දක්වා වර්ධනය වූ අතර එය 2012 වර්ෂයේ වාර්තා වූ කිලෝ මිලියන 328.3 ක තේ නිෂ්පාදනය සමඟ සැසඳීමේදී 3.5% ක අතිශය ඉහළ වර්ධනයකි.

ශ්‍රී ලංකාව විවිධ උන්නතාංශවල වගාකරනු ලබන තේ නිෂ්පාදනය කරනු ලබන අතර ඉන් වැඩි ප්‍රමාණයක් පහත්බිම්වලින් නිෂ්පාදනය කරයි. මෙම වගාබිම් පිහිටීම මුහුදු මට්ටමේ සිට මීටර් 600ක උසක් දක්වා වන පරාසයක විහිදී යන අතර මෙම තේ ප්‍රභල රසයකින් මෙන්ම වර්ණයකින්ද යුක්ත වේ.


එම නිසා මෑත කාලයේදී ඉහළ ආදායම් මට්ටම මෙන්ම සම්ප්‍රයුක්ත ඉල්ලුමේ ඉහළ යාම පහත්බිම්වල වගාකරන තේ කෙරෙහි ඇතිවී ඇත. ඒ අතර උස් බිම් තේ මීටර් 1,200ට වඩා ඉහළ භූමිවල වගාකරනු ලබන අතර සාමාන්‍යයෙන් එම තේ උසස්ම තත්ත්වයෙන් සහ අනන්‍ය රසයකින් සහ සුවඳකින් යුක්තවන බවට සැලකේ.

ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් (62%) සඳහා පහත් බිම්වල තේ නිෂ්පාදනයෙන් දායකත්වය ලැබෙන අතර ඉහළ හා මධ්‍යම උස් බිම්වල තේ නිෂ්පාදනයෙන් පිළිවෙලින් 22% ක හා 16% ක ප්‍රමාණයක දායකත්වයක් ලැබේ.

### 2.2.1. මාසික තේ නිෂ්පාදනය

2013 වසරේ මාසිකව නිෂ්පාදනය කළ මුළු තේ නිෂ්පාධිතය ප්‍රස්තාරය මඟින් දැක්වේ. 2012 වර්ෂය හා සැසඳීමේදී ජුනි, ජූලි හා සැප්තැම්බර් යන මාස වලදී හැරුනුකොට 2013 වර්ෂයේදී මුළු මාසික තේ නිෂ්පාදනයේ සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. පසුගිය අනුගාමී වර්ෂවලදී උන්නතාංශ අනුව මාසික මුළු තේ නිෂ්පාදනය 2.2 සටහන මඟින් දැක්වේ.

**සටහන 2.2 උන්නතාංශ අනුව මාසික තේ නිෂ්පාදනය**




### 2.2.2. කෘෂි දේශගුණික දිස්ත්‍රික් අනුව විශ්ලේෂණය

තේ කිලෝ මිලියන 56 ක් සහ 47.4 ක් නිෂ්පාදනය කරමින් පිළිවෙලින් රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක දෙක කෘෂි දිස්ත්‍රික් අනුව තේ නිෂ්පාදන ලැයිස්තුවේ ඉහළින්ම සිටී. පූර්ව වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ දී තේ නිෂ්පාදනයේ ඉහළ යාමේ ප්‍රවණතාවයක් බස්නාහිර උප දිස්ත්‍රික්කයන්හි සියලුම කෘෂි දේශගුණික දිස්ත්‍රික්කවල පවතින බව අනාවරණය කරගත හැකිය. මධ්‍යම කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක යටතේ එනම් හුන්නස්ගිරිය/ නකල්ස්/ යද්දෙස්ස යන ප්‍රදේශවල තේ නිෂ්පාදනය අනෙකුත් කෘෂි කලාපවලට වඩා ඉහළතම වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය.

**වගුව 2.3 කෘෂි දේශගුණික දිස්ත්‍රික් අනුව තේ නිෂ්පාදනය**

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | | වෙනස | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | ප්‍රමාණය (මෙ.ටො.) | % |
| අ. නුවර එළිය | 4,241 | 3,564 | 677 | 19 |
| ආ. බටහිර | | | | |
| 1. රම්බොඩ | 2,643 | 3,139 | -496 | -15.8 |
| 2. පුඩලු ඔය | 2,693 | 2,498 | 195 | 7.8 |
| 3. ආගරපතන | 7,084 | 6,834 | 250 | 3.7 |
| 4. නානුඔය/ ලිඳුල/ තලවකැලේ | 11,737 | 11,820 | -83 | -0.7 |
| 5. පතන/ කොටගල | 6,263 | 6,232 | 31 | 0.5 |
| 6. හැටන් /දික්ඔය | 8,465 | 8,595 | -130 | -1.5 |
| 7. බොගවන්තලාව | 5,603 | 5,410 | 193 | 3.6 |
| 8. ඉහළ කොත්මලේ/ මස්කෙළිය | 8,487 | 8,541 | -54 | -0.6 |
| මුළු බටහිර | 52,975 | 53,069 | -94 | -0.2 |
| ඇ. මධ්‍යම | | | | |
| 1. වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ් | 3,028 | 2,837 | 191 | 6.7 |
| 2. පුස්සැල්ලාව/ හේවාහැට | 7,053 | 6,548 | 505 | 7.7 |
| 3. කොත්මලේ | 2,068 | 2201 | -133 | -6.0 |
| 4. ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ | 14,725 | 14523 | 202 | 1.4 |
| 5. නිලඹෙ/ හන්තාන/ ගලහ | 1,396 | 1,255 | 141 | 11.2 |
| 6. කඩුගන්නාව | 8,055 | 7,796 | 259 | 3.3 |
| 7. මඩුල්කැලේ/ නකල්ස්/ රන්ගල | 5,043 | 5,458 | -415 | -7.6 |
| 8. හුන්නස්ගිරිය/ නකල්ස්/ යද්දෙස්ස | 1441 | 994 | 447 | 45.0 |
| 9. බලංගොඩ/ රක්වාන | 3,398 | 3,569 | -171 | -4.8 |
| මුළු මධ්‍යම | 46,207 | 45,180 | 1,027 | 2.3 |
| ඈ. උඩපුස්සැල්ලාව | | | | |
| 1. උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය | 5,309 | 4,870 | 439 | 9.0 |
| 2. මතුරට | 2,887 | 2,827 | 60 | 2.1 |
| මුළු උඩපුස්සැල්ලාව | 8,196 | 7,698 | 498 | 6.5 |
| ඉ. ඌව | | | | |
| 1. කොස්ලන්ද/ හල්දුම්මල | 412 | 314 | 98 | 31.2 |
| 2. හපුතලේ | 4,513 | 3,771 | 742 | 19.7 |
| 3. බණ්ඩාරවෙල/ පූනගල්ල | 3,065 | 2,953 | 112 | 3.8 |
| 4. මල්වත්ත/ වැලිමඩ | 3,264 | 3,197 | 67 | 2.1 |
| 5. දෙමෝදර/ හාලිඇල/ බදුල්ල | 9,256 | 7,767 | 1,489 | 19.2 |
| 6. ඇල්ල/ නමුනුකුළ | 1,494 | 1,180 | 314 | 26.6 |
| 7. පස්සර/ ලුනුගල | 4,583 | 4,004 | 579 | 14.5 |
| 8. මඩුල්සිම | 2,575 | 2,368 | 207 | 8.7 |
| මුළු ඌව | 29,162 | 25,554 | 3,608 | 14.1 |
| ඊ.පහත් බිම් | | | | |
| 1. දෙනියාය | 15,655 | 16,545 | -890 | -5.4 |
| 2. ගාල්ල | 47,491 | 44,393 | 3,098 | 7.0 |
| 3. කළුතර | 23,744 | 21,553 | 2,191 | 10.2 |
| 4. කෑගල්ල | 10,798 | 10,817 | -19 | -0.2 |
| 5. කැලණිවැලි | 894 | 829 | 65 | 7.8 |

| | | | | |
|---|---|---|---|---|
| 6. මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 3,924 | 3,572 | 352 | 9.9 |
| 7. මාතර | 4,486 | 4,460 | 26 | 0.6 |
| 8. මොරවක | 26,619 | 25,488 | 1 ,131 | 4.4 |
| 9. රත්නපුර | 56,152 | 57,042 | -890 | -1.6 |
| 10. බලන්ගොඩ | 9,478 | 8,633 | 845 | 9.8 |
| මුළු පහත් බිම් | 199,241 | 193,333 | 5,908 | 3.1 |
| මුළු එකතුව | 340,022 | 328,397 | 11,625 | 3.5 |

මූලාශ්‍රය:- ශ්‍රී. ලං. තේ. ම. නිෂ්පාදන වාර්තා

### 2.2.3. දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ප්‍රධාන උස්බිම් තේ වැඩිම නිෂ්පාදනය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්ද පහත් බිම් තේ වැඩිම නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද වාර්තා වී ඇති බව පෙනේ.

**වගුව 2.4: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කිලෝ)**

| දිස්ත්‍රික්කය | ඉහළ | මධ්‍යම | පහළ | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 15,252,863 | 15,097,375 | | 30,350,239 |
| කොළඹ | 0 | 0 | 645,20 | 645,206 |
| ගාල්ල | 0 | 0 | 52,861,55 | 52,861,550 |
| හම්බන්තොට | 0 | 0 | 256,60 | 256,603 |
| කළුතර | 0 | 0 | 18,657,95 | 18,657,951 |
| මහනුවර | 814,013 | 22,449,689 | 10,899,93 | 34,163,632 |
| කෑගල්ල | 0 | 738,654 | 10,917,59 | 11,656,252 |
| මාතලේ | 0 | 1,752,158 | 485,36 | 2,237,524 |
| මාතර | 0 | 105,242 | 44,684,27 | 44,789,512 |
| නුවරඑළිය | 58,799,039 | 13,607,092 | 894,376 | 73,300,507 |
| රත්නපුර | 910,894 | 2,377,151 | 67,819,46 | 71,107,510 |
| එකතුව | 75,776,809 | 56,127,361 | 208,122,315 | 340,026,486 |

### 2.2.4. අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදන විශ්ලේෂණය

කර්මාන්තශාලාවක සමස්ත තේ නිෂ්පාදනය සඳහා තම වතුවලින් හෝ අනෙක් වතුවලින් ලබාගන්නා තේ දළු හෝ අනෙකුත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගනු ලබන තේ දළු යොදාගනී. අමු තේ දළු රැස්කිරීමේ ඒ ඒ ක්‍රමවේදයන්ට අනුව ලබාගත් දළුවලින් නිෂ්පාදිත මුළු තේ නිෂ්පාදිතය පහත වගුව මඟින් පැහැදිළි කෙරේ.

**වගුව 2.5 දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය**

| පරිපාලන දිස්ත්‍රික්කය | තම වතුවලින් ලබාගත් දළු | අනෙක් වතුවලින් ලබාගත් දළු | මිලදී ගත් දළු | මුළු නිෂ්පාදනය |
|---|---|---|---|---|
| බදුල්ල | 12,746,603 | 7,264,547 | 10,339,089 | 30,350,239 |
| ගාල්ල | 1,460,619 | 357,303 | 51,043,628 | 52,861,550 |
| කොළඹ | - | - | 645,206 | 645,206 |
| හම්බන්තොට | - | - | 256,603 | 256,603 |
| කළුතර | 802,366 | 75,144 | 17,780,442 | 18,657,951 |
| මහනුවර | 6,262,668 | 1,921,030 | 25,979,935 | 34,163,633 |
| කෑගල්ල | 1,399,681 | 618,047 | 9,638,525 | 11,656,252 |
| මාතලේ | 387,852 | 198,418 | 1,651,254 | 2,237,524 |
| නුවරඑළිය | 46,956,331 | 11,106,525 | 15,237,651 | 73,300,507 |
| රත්නපුර | 6,532,857 | 1,808,360 | 62,766,294 | 71,107,511 |
| මාතර | 2,160,115 | 447,993 | 42,181,404 | 44,789,512 |
| මුළු නිෂ්පාදනය | 78,709,091 | 23,797,365 | 237,520,031 | 340,026,487 |

### 2.2.5. පරිසැකසුම් ක්‍රමවේදය අනුව නිෂ්පාදන විශ්ලේෂණය

#### 2.2.5.1. කලු තේ සහ හරිත තේ නිෂ්පාදනය



සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය 2013 වර්ෂයේදී 4%ක (කි. ග්‍රෑ. 11,941,554) වර්ධනයක් අත් කරගත් අතර සී.ටී.සී නිෂ්පාදනය 2012 වර්ෂයට වඩා 4% ක අඩුවීමක් පෙන්නුම් කරනු ලැබිය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී කලුතේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 11ක (3.4%) ක ප්‍රභල වර්ධනයක් වාර්තා කරන ලදී. හරිත තේ නිෂ්පාදනය කි. ග්‍රෑ. 693,150ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර එය පූර්ව වර්ෂය හා සැසඳීමේදී 23%ක වර්ධනයකි.

## 2.6 වගුව පරිසැකසුම් ක්‍රමවේදය අනුව තේ නිෂ්පාදනය

| පරිසැකසුම් ක්‍රමවේදය | 2012 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 2013 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 2012 - 2013 වෙනස | |
|---|---|---|---|---|
| | | | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය |
| සාම්ප්‍රදායික | 302,061,086 | 314,002,640 | 11,941,554 | 4.0 |
| සී.ටී.සී. | 23,303,833 | 22,298,582 | (1,005,251) | -4.3 |
| හරිත | 3,032,115 | 3,725,265 | 693,150 | 22.9 |
| එකතුව | 328,397,034 | 340,026,487 | 11,629,453 | 3.5 |

### 2.2.5.2. ක්ෂණික තේ සහ ජෛව තේ නිෂ්පාදනය


2012 වර්ෂය හා සංසන්දනය කිරීමේදී ක්ෂණික තේ සහ ජෛව තේ යන තේ වර්ග දෙකෙහිම නිෂ්පාදනයේ සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. 2013 වර්ෂයේදී ක්ෂණික තේ නිෂ්පාදනයේ කිලෝ මිලියන 0.1ක වර්ධනයක් ද ජෛව තේ නිෂ්පාදනයේ කිලෝ මිලියන 0.3ක වර්ධනයක්ද පෙන්නුම් කරයි.

### 2.2.6. නිමි තේවල නිෂ්පාදන පිරිවැය

ඵලදායිතාවය සහ නිෂ්පාදන පිරිවැය අතර අන්තර් සබඳතාවක් පවතී. නිෂ්පාදන පිරිවැය ඉහළයාම වැවිලි ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ කණගාටුදායක සංසිද්ධියක්ව පවතී. තේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා විශාල ප්‍රමාණයේ ශ්‍රම අවශ්‍යතාවක් පවතින හෙයින් නිෂ්පාදන පිරිවැය සහ ශ්‍රම ඵලදායිතාවය අතර ප්‍රභල සම්බන්ධතාවයක් පවතී. තේ නිපදවන අනෙකුත් ප්‍රධාන රටවල් අතර ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන පිරිවැය ඉහළ අගයක් ගනී. මෙම තත්ත්වය ගෝලීය වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය කෙරෙහි බලපා ඇත.

නිමි තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය පසුගිය දශකය තුළ ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ශ්‍රම පිරිවැයේ ඉහළයාමත් යෙදවුම් මිල ගණන් අධික වීමත් නිෂ්පාදන පිරිවැය කෙරෙහි විශේෂයෙන්ම බලපා ඇත. 2012/13 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත වාර්ෂික තේ නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 422.67ක් වන අතර එය 2011/12 වර්ෂයට සාපේක්ෂව 8%ක ඉහළ යාමකි.

සටහන 2.3: නිමි තේ කිලෝග්‍රෑමයක මුළු පිරිවැය




## 2.3. තේ අලෙවිය

2012 වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ කර්මාන්තය තේ සඳහා ප්‍රභල මිල සාමාන්‍යයක් වාර්තාකරනු ලැබිය. 2012 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් මිලියන 325.4ක් කිලෝග්‍රෑමයක් රු. 392.03ක සාමාන්‍ය මිලක් යටතේ අලෙවි කරන ලද අතර 2013 වර්ෂයේදී රාජ්‍ය පුද්ගලික හා සෘජු විකුණුම් මගින් තේ කිලෝග්‍රෑම් මිලියන 335.5ක් කිලෝග්‍රෑමයක් රු444.75ක සාමාන්‍ය මිලක් යටතේ අලෙවි කරන ලදී. පූර්ව වර්ෂය හා සැසඳීමේදී මෙම ඒකක වැඩිවීම කිලෝග්‍රෑමයක රු. 392.03 සිට රු444.75 දක්වා වූ රු52.72(13.4%) ප්‍රමාණයකින් විය.

### 2.3.1. අලෙවි ක්‍රමවේදය

කර්මාන්තශාලා මගින් නිෂ්පාධිත තේ අලෙවි කරන ප්‍රධාන ක්‍රමවේදය වනුයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි. 2013 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් මිලියන 330.0 ක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. තේ කිලෝග්‍රෑම් මිලියන 4.0ක් (1.1%)ක් පුද්ගලික අංශය මගින් අලෙවි කරන ලද අතර ඉතිරිය 0.5%ක් පමණ සෘජු අලෙවිය මගින් සිදුකරන ලදී.

### 2.3.2. කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය යටතේ ලංකා වානිජ මණ්ඩලය විසින් 2013 වර්ෂයේදී තේ වෙන්දේසි 51 පවත්වන ලද අතර රාජ්‍ය සහ

පෞද්ගලික අලෙවිය සඳහා කිලෝ මිලියන 11 ක (3.4%)ක ප්‍රහල වර්ධනයක් වාර්තා කරන ලදි. කෙසේ නමුත් 2013 වර්ෂයේදී කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය විකුණුම් මිල සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනු ලබන අතර එමඟින් කිලෝග්‍රෑමයක මිල රු.391.64 සිට 444.42 දක්වා වූ වාර්ෂික ඉහළයාමක් සිදුවිය.

### 2.3.3. උන්නතාංශ අනුව අලෙවිය

උන්නතාංශ අනුව තේ අලෙවිය පිළිබඳ විශ්ලේෂණයක් 2.7 වගුව මඟින් දැක්වේ. උන්නතාංශ තුනෙහි ඒකක මිලගණන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී වර්ධනයක් පෙන්නුම් කරනු ලැබූ අතර එය 2013 වර්ෂයේදී ධනාත්මක පිරිවැටුමක් ඇතිවීම කෙරෙහි හේතු සාධක විය.

**වගුව 2.7 භූමි පිහිටීම අනුව තේ අලෙවිය**

| පිහිටීම | ප්‍රමාණය(කි.මිලි) | | | | ඒකක මිල (රු/කි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | වෙනස | % | 2012 | 2013 | වෙනස | % |
| උස් බිම් | 69.8 | 71.4 | 1.6 | 2.3 | 379.18 | 407.91 | 28.73 | 7.6 |
| මධ්‍යම | 52.4 | 54.4 | 2.0 | 3.8 | 350.86 | 397.97 | 46.11 | 13.1 |
| පහත් බිම් | 203.2 | 209.8 | 6.6 | 3.2 | 407.06 | 469.67 | 62.61 | 15.4 |
| මුළු අලෙවිය | 325.4 | 335.6 | 10.2 | 3.1 | 392.03 | 444.75 | 52.72 | 13.4 |

## 2.4. තේ අපනයනය

රුපියල් බිලියන 199.4ක අපනයන ආදායමක් උපයාගනිමින් 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ අපනයනය (ප්‍රති අපනයනයද ඇතුළුව) තේ කිලෝ මිලියන 319ක් විය. තේ කිලෝග්‍රෑමයක නැව තෙක් වියදම් රහිත සාමාන්‍ය ඒකක මිල රු. 623.91 ක් විය. මෙය වුකලි අපනයන ඉපැයුම්වලින් තේ අපනයන ආදායම රුපියල් බිලියන 150 ඉක්මවූ අනුගාමී හතරවැනි වර්ෂයයි.

අනර්ඝ තේ නිපැයුම්කරු ලෙස තවමත් සැලකනු ලැබුවද ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ ස්වාවරත්වය ක්‍රමයෙන් පිරිහෙමින් පවති. ප්‍රතිවාදීන් විසින් එල්ල කර ඇති තිව්‍ර තරඟය ජාතියේ තරඟකාරී තත්ත්වය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇත. ශ්‍රී ලංකාව තුළ පවතින අධික නිෂ්පාදන පිරිවැයත් අඩු අස්වැන්නත් හේතුවෙන් මෙම තත්ත්වය වඩා අයහපත් බවට පත්කර ඇත. මේ අතර ගෝලීය පාරිභෝගිකයන් තම රුචි අරුචිකම් ඉතා ශීඝ්‍රයෙන් වෙනස්කරන්නාවූ කාලවකවානුවක සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය මත අඛණ්ඩව රැඳිසිටීමේ හේතුව නිසා තවදුරටත් එහි වෙළඳපොල කොටස අහිමි වී යා හැකිය.


### 2.4.1. වර්ග අනුව තේ අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් තේ ප්‍රභවයන් සහ ගුණාත්මක බව මත පදනම්ව තේ සඳහා වන කැමැත්ත සැලකිය යුතු ලෙස වෙනස් වේ. උදාහරණයක් ලෙස මැදපෙරදිග සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කරනු ලබන පහත් බිම්වල වැඩෙන සාම්ප්‍රදායික ප්‍රහල රසැති තේ සඳහා කැමැත්තක් දක්වයි.

2013 වර්ෂයේදී සමුච්චිත තේ අපනයනය (ප්‍රති අපනයනයද ඇතුළුව) (කලු, හරිත සහ ක්ෂණික තේ ඇසුරුම් පමණි) 2012 වර්ෂයට වඩා පිළිවෙලින් ප්‍රමාණයෙන් 0.06%ක අඩුවීමක් සහ ඉපැයුම් 10.5% වඩා වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබිය. තවද නැවතෙක් වියදම් රහිත මිල කිලෝග්‍රෑමයකට රු. 61 (8.10.4%) ක් වැනි ධනාත්මක තත්ත්වයකට පත්වුණි.

කෙසේවෙතත් 2013 වර්ෂයේදී සමුච්චිත අපනයන ඉපැයුම ඇ.ඩො. මිලියන 1,558.0ක් වූ අතර 2012 වර්ෂයේදී එය ඇ.ඩො. මිලියන 1,414.0ක් වීම නිසා 2013 වර්ෂයේදී 10.2% ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

සටහන 2.4 මාසික තේ අපනයනය ප්‍රමාණය සහ ඒකක අගය



## 2.4.2. වාර්ෂික තේ අපනයනය

**2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වර්ග අනුව තේ අපනයනය 2.8 වගුව මඟින් දැක්වේ'**

### 2.8 වගුව වාර්ෂික තේ අපනයනය 2013

| අපනයනය | 2013 දෙසැම්බර් වනවිට | | |
|---|---|---|---|
| කලු තේ ඇසුරුම් | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | නැ.වි.ස. (රු/කි) |
| ඡ්බෑග් | 23,210,382 | 25,476,608,354 | 1,097.64 |
| ඡ්තොග | 129,287,835 | 72,118,470,750 | 557.81 |
| තේ ඇසුරුම් (ග්‍රෑම් 4- ක් ග්‍රෑ.1) | 91,223,712 | 55,810,232,251 | 611.80 |
| තේ ඇසුරුම් (කි.1-කි.3) | 1,376,570 | 903,042,064 | 656.01 |
| තේ ඇසුරුම් (කි.3-කි.5) | 18,281,518 | 9,659,101,976 | 528.35 |
| තේ ඇසුරුම් (කි.5-කි.10) | 42,937,913 | 21,229,306,318 | 494.42 |
| කලු තේ එකතුව | 306,317,930 | 185,196,761,713 | 604.59 |
| හරිත තේ ඇසුරුම් | | | |
| තේ බෑග් | 862,587 | 1,536,758,686 | 1,781.57 |
| තේ තොග | 804,817 | 449,410,476 | 558.40 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.4-ග්‍රෑ.1) | 1,188,657 | 1,589,446,039 | 1,337.18 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.1-ග්‍රෑ.3) | 1,032 | 1,154,247 | 1,118.46 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.3-ග්‍රෑ.5) | 2,190 | 3,682,576 | 1,681.54 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.5-ග්‍රෑ.10) | 17,022 | 24,002,472 | 1,410.09 |
| හරිත තේ - එකතුව | 2,876,305 | 3,604,454,496 | 1,253.15 |
| ක්ෂණික තේ එකතුව | | | |
| මුළු අපනයනය | 1,950,649 | 2,002,724,122 | 1,026.70 |
| තේ ඇසුරුම් (ග්‍රෑම් 4- ක් ග්‍රෑ.1) | 311,144,884 | 190,803,940,331 | 613.23 |

### වගුව 2:9 වාර්ෂික ආනයනික අපනයනය (ප්‍රති අපනයනය)2013

| | 2013 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| කලු තේ ඇසුරුම් කිරීම | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම | නැ.වි.ර. (රු/කි.ග්‍රෑ.) |
| තේ බෑග් | 2,524,856 | 2,631,690,595 | 1,042.31 |
| තේ තොග | 516,471 | 354,447,294 | 686.29 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.4- කි.ග්‍රෑ.1) | 2,994,140 | 1,972,405,719 | 658.76 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.1- කි.ග්‍රෑ.3) | 4,665 | 5,051,763 | 1,082.91 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.3- කි.ග්‍රෑ.5) | 8,780 | 5,107,692 | 581.74 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.5- කි.ග්‍රෑ.10) | 107,973 | 58,385,777 | 540.74 |
| කලු තේ - එකතුව | 6,156,885 | 5,027,088,840 | 816.50 |
| හරිත තේ ඇසුරුම් කිරීම | | | |
| තේ බෑග් | 1,141,464 | 2,289,278,960 | 2,005.56 |
| තේ තොග | 208,143 | 119,230,219 | 572.83 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.4- කි.ග්‍රෑ.1) | 1,002,406 | 1,195,578,174 | 1,192.71 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.1- කි.ග්‍රෑ.3) | 5,935 | 3,597,011 | 606.07 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.3- කි.ග්‍රෑ.5) | 623 | 703,136 | 1,128.63 |
| තේ ඇසුරුම් (ග්‍රෑ.5- කි.ග්‍රෑ.10) | 279 | 437,199 | 1,567.02 |
| හරිත තේ - එකතුව | 2,358,850 | 3,608,824,699 | 1,529.91 |
| ක්ෂණික තේ - එකතුව | | | |
| මුළු තේ අපනයනය | 243 | 491,377 | 2,022.13 |
| මුළු එකතුව | | | |
| තේ බෑග් | 8,515,978 | 8,636,404,916 | 1,014.14 |

### 2.4.3. අගය එකතු කළ තේ අපනයනය

ගෝලීය රුචිකත්වය ඉතා ශීඝ්‍රයෙන් අගය එකතුකළ තේ ප්‍රභේද කෙරෙහි යොමුවන හෙයින් ශ්‍රී ලංකාව ලෝක වෙළඳපොල තුළ තම සාම්ප්‍රදායික අලෙවිකරණ තත්ත්වය පවත්වාගෙන යාම පිණිස මෙම වෙළඳපොල වෙනස්වීම් හා අනුගත වීම අවශ්‍යය. අගය එකතුකළ තේ, තේ ඇසුරුම්, තේ මලු සහ ක්ෂණික තේ අපනයනය සමස්ත අපනයන ප්‍රමාණයෙන් 58.2% ක් විය. කෙසේවෙතත් මුළු අපනයන ආදායමෙන් 62.0% අගය එකතුකළ තේ අපනයනයෙන් ලැබී ඇත.

### 2.4.4. ශ්‍රී ලංකා තේ අපනයනයේ ප්‍රධාන ගමනාන්ත

ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ අපනයන ස්ථානයන් වූයේ එක්සත් රාජධානියද ඇතුළුව යුරෝපීය රටවල්ය. කෙසේ නමුත් තේ ඇසුරුම් භාවිතය ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකාවේ තේ තොග අපනයන මේවන විට මැදපෙරදිග රටවල් වෙත යොමු වී ඇත.

ලෝකයේ විශාලතම තේ ආනයනකරු වන රුසියාව ශ්‍රී ලංකාවේ විශාලතම තනි තේ ගැනුම්කරුවා වේ. සමාලෝචනයට භාජනය වන කාලපරිච්ඡේදය තුළ තේ අපනයන ප්‍රමාණයෙන් 14.7% ක් පමණ රුසියාව විසින් මිලදීගනු ලැබූ අතර එමඟින් 15.8% ක අපනයන ආදායමක් හිමිවිය. ශ්‍රී ලංකාවේ තේ ගැනුම්කරුවන් අතර ඉරානය අඛණ්ඩව දෙවන ස්ථානය උසුලන අතර තේ අපනයන ප්‍රමාණයෙන් 10.3% අපනයනය කරනු ලබන තුර්කිය එහි තුන්වැනි ස්ථානය ගෙන සිටී. කලාපයක් වශයෙන් ගත්කළ මැදපෙරදිග කලාපය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තය වන අතර ශක්තිමත් තෙල් මිලක් පැවතීම හේතුකොටගෙන තේ සඳහා වන ඉල්ලුම ද විශාල ලෙස වැඩිවෙමින් පවතී.

මුළු තේ අපනයනයෙන් 70.8% ක් පමණ ඉහළම පවතු ශ්‍රී ලංකා තේ අපනයන ගමනාන්ත 10 විසින් මිලදී ගෙන ඇත. කෙසේවෙතත්, ලබාගත් සාමාන්‍ය නැ.වි.ර. ඒකක මිලට අදාළව ප්‍රහල නැ.වි.ර. මිලක් පවත්වාගෙන යනු ලැබුවේ රුසියාව සහ ජපානය පමණි. තවද එක්සත් ජනපදය පුරා පැවැති අයහපත් ආර්ථික තත්ත්වයත් යුරෝපයේ පැවැති ණය අර්බුදයත් නිසා අපනයනයෙන් උපයාගත හැකිව තිබූ ආදායම අඩපණ වී ඇත.

වගුව 2.10 2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ අපනයන ගමනාන්ත

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | අගය (රු.) | මුළු අපනයන ප්‍රමාණයේ ප්‍රතිශතය | මුළු අපනයන ප්‍රමාණයේ ප්‍රතිශතය | මුළු අපනයන අගයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| රුසියාව | 45.7 | 30.2 | 660.25 | 14.7 | 15.8 |
| ඉරානය | 38.4 | 24.4 | 635.11 | 12.3 | 12.8 |
| තුර්කිය | 32.2 | 18.2 | 564.07 | 10.3 | 9.5 |
| ඉරාකය | 22.3 | 11.1 | 500.61 | 7.2 | 5.8 |
| සිරියාව | 21.1 | 12.1 | 574.68 | 6.8 | 6.3 |
| එ.අ.එ. | 17.5 | 10.1 | 578.76 | 5.6 | 5.3 |
| කුවේටය | 16.0 | 6.4 | 401.68 | 5.1 | 3.4 |
| ඇසර්බයිජාන් | 10.8 | 6.4 | 595.98 | 3.5 | 3.4 |
| ජපානය | 8.8 | 6.0 | 683.12 | 2.8 | 3.2 |
| ජෝර්දානය | 7.6 | 4.6 | 598.74 | 2.5 | 2.4 |
| එකතුව | 220.4 | 129.6 | 587.88 | 70.8 | 67.9 |

#### 2.4.4.1. කලු තේ අපනයනය

2013 වර්ෂයේදී කිලෝ. මිලියන 44.9 ක් (14.3%) ක් ආනයනය කරමින් රුසියාව ශ්‍රී ලංකා කලු තේ ආනයනයේ ප්‍රමුඛස්ථානය අඛණ්ඩව පවත්වාගෙන ඇත. ඉරානය සහ තුර්කිය යන ශ්‍රී ලංකා කලු තේ ආනයනකරුවන් විසින් පිළිවෙලින් කි. මිලි. 38.4 (12.34%) ක් සහ කි. මිලි. 32.2 (10.35%) ක් ආනයනය කර තිබේ.

වගුව 2.11: ප්‍රධාන කලු තේ අපනයන ගමනාන්ත පහ

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | අගය (රු.) | නැ.වි.ර. (රු/කි.) | ප්‍රමාණයේ ප්‍රතිශතය (මුළු අපනයන | අගයේ ප්‍රතිශතය (මුළු අපනයන අගයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| රුසියාව | 44.9 | 29.1 | 648.14 | 14.4 | 15.3 |
| ඉරානය | 38.4 | 24.4 | 634.95 | 12.3 | 12.8 |
| තුර්කිය | 32.2 | 18.2 | 564.03 | 10.4 | 9.5 |
| ඉරාකය | 22.2 | 11.1 | 498.79 | 7.1 | 5.8 |
| සිරියාව | 21.1 | 12.1 | 574.56 | 6.8 | 6.3 |
| මුළු ප්‍රධාන ගමනාන්ත 05 | 158.8 | 94.8 | 597.24 | 51.0 | 49.7 |

## 2.4.4.2. හරිත තේ අපනයනය

ප්‍රධාන හරිත තේ ආනයනකරුවන් 10දෙනා අතරින් රුසියාව 2013 වර්ෂයේදි හරිත තේ කිලෝ.මිලි. 0.8 ක සැලකිය යුතු ආනයනයක් වාර්තා කළේය. තවත් සැලකිය යුතු සුවිශේෂිත කරුණක් වන්නේ මුළු හරිත තේ අපනයනයෙන් 50% කටත් වඩා ප්‍රධාන ගමනාන්ත 5කට අපනයනය කිරීමයි.

වගුව 2.12: ප්‍රධාන හරිත තේ අපනයන ගමනාන්ත පහ

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | අගය (රු.මිලි.) | නැ.වි.ර. (රු/කි.ග්‍රෑ.) | අපනයන ප්‍රමාණයේ ප්‍රතිශතය | අපනයන අගයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| රුසියාව | 782.2 | 1,060.1 | 1355.33 | 0.2 | 0.56 |
| එ.අ.එ. | 484.9 | 254.7 | 525.18 | 0.1 | 0.13 |
| යුක්රේනය | 315.6 | 392.4 | 1,243.15 | 0. | 0.21 |
| ඇ.එ.ජ | 109.1 | 131.6 | 1,206.77 | 0.0 | 0.07 |
| ජර්මනිය | 82.1 | 106.8 | 1,300.66 | 0.0 | 0.06 |
| මුළු ප්‍රධාන ගමනාන්ත 05 | 1,773.9 | 1,945.6 | 1,096.78 | 0.57 | 1.02 |

## 2.4.4.3. ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකාවේ ක්ෂණික තේ ආනයනකරුවන් අතර ප්‍රමුඛස්ථානයට අයර්ලන්තය පත්වූ අතර ආනයනය කරන ලද තේ ප්‍රමාණය කිලෝ. මිලියන 1.9 (97%) ක් විය. ඇ.එ.ජ. හා ඉන්දුනීසියාව ක්ෂණික තේ අපනයන ගමනාන්ත අතුරෙන් පිළිවෙලින් දෙවැනි සහ තෙවැනි ස්ථානවල පසුවිය.

## 2.4.4.4. ආර්.ටී.ඩී. තේ අපනයනය (පානය සඳහා පිළියෙල කළ)

2013 වර්ෂයේදි ගමනාන්ත 06ක් සඳහා ශ්‍රී ලංකාවේ ආර්.ටී.ඩී. තේ අපනයනය කළේය ශ්‍රී ලංකාවේ ආර්.ටී.ඩී. තේ ප්‍රධාන ගැනුම්කරු එක්සත් රාජධානිය වූ අතර මිලදී ගත් ප්‍රමාණය ලීටර දහස් 21.1 (71%) කි. ආනයන තේ අපනයනය (උදා:- ප්‍රති අපනයනය) පිළිබඳ සැලකීමේදී 2013 වර්ෂයේදී ඉරානයට පමණක් අපනයන කළ ප්‍රමාණය කිලෝ. මිලියන 1 ඉක්මවූ අතර ඉරානයට සහ උස්බෙකිස්තානයට ආසන්න වශයෙන් කිලෝ මිලියන 0.7 ක් සහ 0.6 ක් අපනයනය කළේය. එය ශ්‍රී ලංකාවේ මුළු ආනයනික තේ ප්‍රති අපනයන ප්‍රමාණයෙන් 32% ක් විය.

# 2.5. ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

තේ වූකලි ලෝකය පුරා අති මහත් ජනප්‍රිය එමෙන්ම විශාල ලෙස පරිභෝජනය කරනු ලබන උණුසුම් පානයයි. ශ්‍රී ලංකාවේ අපනයනයන් අතුරෙන් විශේෂයෙන්ම තේ අපනයනය එම කර්මාන්තයේ ආරම්භයේ සිටම ජාතික ආර්ථිකයට මෙන්ම සමාජ සංවර්ධනයට ඉමහත් කාර්යභාරයක් ඉටුකොට ඇත. මෙම වෙළඳ ද්‍රව්‍ය මූලික නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් සඳහා සුවිශාල දායකත්වයක් සපයා ඇති අතර මෙම ක්ෂේත්‍රය මෙරටේ විශාලතම සේවා නියුක්තියන් පිරිසක් සේවයේ යෙදී සිටින ක්ෂේත්‍රයයි.

තේ නිපදවන රටවල් අතරින් ප්‍රධාන තේ නිෂ්පාදනකරුවන් වන්නේ ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ ඉන්දුනීසියාවයි. ලෝක තේ නිෂ්පාදනයෙන් 77% ක් මෙම රටවල් පහ මඟින් නිපදවනු ලබන අතර ගෝලීය අපනයනයෙන් 80% ක් පමණ මෙම රටවල් මඟින් සිදුකරයි. චීනය

ලෝකයේ ඉහළම තේ ඵලදාවක් ලැබෙන රට වශයෙන් ප්‍රධාන වශයෙන් වැදගත් වන අතර අප්‍රිකානු මහද්වීපය, විශේෂයෙන්ම කෙන්යාව විශාල තේ අස්වැන්නක් ලැබෙන රටක් ලෙස ප්‍රචලිත වී ඇත. ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බැලීමේදී 2013 වර්ෂයේදී සාමාන්‍ය ඒකක මිලෙහි (වෙන්දේසි) අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබුණු අතර අනෙකුත් තේ නිෂ්පාදකයින් හා සැසඳීමේදී ආදායම් කාර්යසාධනයේ (අපනයන) ද වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.5.1. ගෝලීය තේ වගාව

2013 වර්ෂය අවසානය වන විට ලෝකයේ තේ වගාකොට ඇති මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර මිලියන 3කට අධික බව ඇස්තමේන්තු කොට ඇත.

**වගුව 2.13: ඉහළම තේ වගාබිම් වාර්තා**

| රට | 2010 හෙක්ටයාර | 2011 හෙක්ටයාර | 2012 හෙක්ටයාර |
|---|---|---|---|
| චීනය | 1,970,200 | 2,112,510 | 2,279,940 |
| ඉන්දියාව | 560,609 | 579,350 | 580,000 |
| ශ්‍රී ලංකාව* | 188,007 | 187,860 | 190,717 |
| කෙන්යාව | 171,916 | 187,855 | 187,000 |
| වියට්නාමය | 129,000 | 127,000 | 124,027 |
| ඉන්දුනීසියාව | 122,796 | 122,764 | 121,076 |
| මියන්මාරය | 78,400 | 78,500 | 78,500 |
| තුර්කිය | 77,500 | 77,700 | 77,800 |
| බංගලාදේශය | 54,900 | 54,400 | 54,500 |
| ජපානය | 46,800 | 46,200 | 45,900 |

මූලාශ්‍රය: ජා.තේ.ක. වාර්ෂික සංඛ්‍යාලේඛන- 2013

*වගාකරන ලදැයි ලියාපදිංචි වී ඇති ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යන්තර තේ කමිටු වාර්තාවලට අනුව ලෝකයේ විශාලතම තේ ඉඩම් ප්‍රමාණය චීනයෙන් හමුවන අතර පසුගිය දශකයේදී එම ප්‍රමාණය විශාල ලෙස ඉහළ ගියේය. කෙන්යාව තුළ තේ වගාකරන ලද භූමි ප්‍රමාණයද 2010 සිට 2012 දක්වා විශාල ලෙස වර්ධනය විය. 2009-2012 කාලය තුළ වැඩිම තේ ප්‍රමාණයක් වගාකර ඇති රටවල් 10 අනුව වගන ලද තේ බිම් ප්‍රමාණය 2.13 වගුවේ අන්තර්ගත කොට ඇත.

## 2.5.2. ගෝලීය තේ පරිභෝජනය

2010-2012 යන අවුරුදු තුනක කාලපරිච්ඡේදය තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ප්‍රතිශීර්ෂ තේ පරිභෝජනය සම්බන්ධයෙන් අනාවරණය වූයේ වාර්ෂික ඉහළම තේ පරිභෝජනය සිදුවන්නේ චීනයේ බවයි. එය තේ කිලෝ. මිලියන 1,279.33 කි. එසේවුවත් ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.95 ක තරම් පහළ අගයක වේ. අනතුරුව වැඩිම තේ පරිභෝජනය ඉන්දියාවෙන් වාර්තා වන අතර එය කිලෝ. මිලි. 871.67 ක් වේ. ඒක පුද්ගල පරිභෝජනය කි. ග්‍රෑ. 0.73 කි.

ජා.තේ.ක. විසින් 2009-11 සහ 2010-12 යන කාලපරිච්ඡේදයන්ට අදාළව ඉදිරිපත් කොට ඇති රටවල් අනුව ප්‍රති ශීර්ෂ තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛනවලට අනුව මොරොක්කෝවේ සහ කුවේටයේ තේ පාරිභෝගිකයන්ගේ ඒක පුද්ගල තේ පරිභෝජනය පිළිවෙලින් කි.ග්‍රෑ. 0.2 කින් හා 0.29 කින් අඩු වී ඇති අතර පසුගිය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී චීනයේ සහ ඊජිප්තුවේ වාර්ෂික ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.08 කින් හා 0.06 කින් වැඩි වී ඇත. පූර්ව කාලපරිච්ඡේදය හා සංසන්ධනය කිරීමේදී නවතම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ බහරේනයේ තේ පරිභෝජනය ස්ථාවර මට්ටමක පැවති ඇත.

කුවේටයේ, අයර්ලන්තයේ සහ ඇෆ්ගනිස්ථානයේ වාර්ෂික ප්‍රතිශීර්ෂ තේ පරිභෝජනය ඉහළ මට්ටමක පවතින අතර එය පිළිවෙලින් කි.ග්‍රෑ.

3.25, කි.ග්‍රෑ.1.90 ක් කි.ග්‍රෑ. 1.97 කි. ඉහළ ප්‍රතිශීර්ෂ තේ පරිභෝජනයක් සහිත රටවල් ලයිස්තුවක් 2.14 වගුවෙන් දැක්වේ.

වගුව 2.14: රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාදත්ත

| රට | 2009-11 | | 2010-12 | |
|---|---|---|---|---|
| | එකතුව (කිලෝ.මිලි.) | ප්‍රතිශීර්ෂ (කි.ග්‍රෑ.) | එකතුව (කිලෝ.මිලි.) | ප්‍රතිශීර්ෂ කි.ග්‍රෑ. |
| කුවේටය | 9.47 | 3.54 | 8.68 | 3.25 |
| අයර්ලන්ත ජනරජය | 9.85 | 2.18 | 8.51 | 1.90 |
| ඇෆ්ගනිස්ථානය | 50.37 | 2.06 | 49.27 | 1.97 |
| තුර්කිය | 150.10 | 2.06 | 151.57 | 2.04 |
| එක්සත් රාජධානිය | 122.46 | 1.92 | 123.51 | 1.97 |
| ලිබියාව | 10.23 | 1.72 | 13.60 | 2.39 |
| මොරොක්කෝව | 56.17 | 1.76 | 56.17 | 1.74 |
| තායිවානය | 44.18 | 1.65 | 44.00 | 1.64 |
| කටාර් | 2.43 | 1.42 | 2.53 | 1.46 |
| සිරියාව | 28.54 | 1.42 | 26.50 | 1.25 |
| හොංකොං | 9.64 | 1.36 | 9.48 | 1.34 |
| ශ්‍රී ලංකාව | 28.03 | 1.36 | 27.79 | 1.33 |
| ඉරාකය | 42.00 | 1.31 | 40.35 | 1.21 |
| චිලි | 20.45 | 1.20 | 21.40 | 1.24 |
| ඊජිප්තුව | 85.03 | 1.08 | 91.63 | 1.14 |
| නවසීලන්තය | 4.38 | 1.00 | 4.35 | 0.99 |

මූලාශ්‍රය: ජා.තේ.ක. වාර්ෂික සංඛ්‍යාලේඛන - 2013


## 2.5.3. ගෝලීය තේ නිෂ්පාදනය

ගෝලීය තේ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් ඉන්දියාව, චීනය, කෙන්යාව සහ ශ්‍රී ලංකාව යන රටවල් 4 වටා කේන්ද්‍රගතවී තිබෙන අතර 2013 වර්ෂයේදී ලෝක තේ නිෂ්පාදනයෙන් 79% ක ප්‍රමාණයක් සඳහා මෙම රටවල්වල දායකත්වය දරා ඇත. (2.6 සටහන). ගෝලීය තේ නිෂ්පාදනයේ සෑම කාලයකටම අදාළව වාර්තාවන ඉහළම නිෂ්පාදන ප්‍රමාණය වූ කිලෝ බිලියන 4.8 2013 වර්ෂයේදී වාර්තා විය. 2010-2013 කාලපරිච්ඡේදයේදී ගෝලීය නිෂ්පාදනයට ප්‍රධාන තේ නිෂ්පාදකයින් විසින් දැක්වූ දායකත්වය (කි.ග්‍රෑ.මිලි. 100 ඉක්මවූ) 2.6 සටහනින් දැක්වේ.

ඉන්දියාව හා චීනය තවමත් ලොව විශාලතම තේ නිෂ්පාදකයින් වුවද එම දෙරටෙහි සිදුවන සැලකිය යුතු වූ ප්‍රමාණයේ තේ පරිභෝජනය හේතුවෙන් කෙන්යාව සහ ශ්‍රී ලංකාව මෙම වෙළඳ භාණ්ඩයේ විශාලතම අපනයනකරුවන් බවට පත්වී ඇත.

2013 වර්ෂයේදී කිලෝග්‍රෑම් මිලියන 1,850.0 ක් නිෂ්පාදනය කරමින් චීනය තේ නිෂ්පාදනයේ ඉහළින්ම වැජඹුන අතර තේ කිලෝග්‍රෑම් මිලියන 1,200ක වාර්ෂික නිෂ්පාදනයක් සිදුකරමින් ඉන්දියාව එහි දෙවැනි ස්ථානයට පත්විය. 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව අභිබවා යමින් කෙන්යාව තේ නිෂ්පාදනයේ තෙවැනි තැනට පත්වූ අතර එහිදී නිපදවනු ලැබූ තේ ප්‍රමාණය කිලෝ මිලියන 432කි.

සටහන 2.6: ලෝක තේ නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යාලේඛන




| | චීනය | ඉන්දියාව | කෙන්යාව | ශ්‍රී ලංකාව | වියට්නාමය | තුර්කිය | ඉන්දුනීසියාව |
|---|---|---|---|---|---|---|---|
| 2010 | 1475 | 966 | 399 | 331 | 175 | 148 | 151 |
| 2011 | 1623 | 1116 | 378 | 329 | 178 | 145 | 142 |
| 2012 | 1790 | 1126 | 370 | 328 | 174 | 147 | 137 |
| 2013 | 1850 | 1200 | 432 | 340 | 170 | 149 | 134 |

රට

මූලාශ්‍රය: අ.තේ.ක. වාර්ෂික සංඛ්‍යාලේඛන -2013

## 2.5.4 ගෝලීය තේ අලෙවිය

2013 වර්ෂයේදී උපරිම විකුණුම් ප්‍රමාණයක් සිදු කරමින් ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථානය වශයෙන් කොළඹ තේ වෙන්දේසිය ඉහළ ස්ථානයකට පත්විය. කෙසේවෙතත් මොම්බාසා වෙන්දෙසියේදී අලෙවි කරනු ලැබූ තේ ප්‍රමාණය ද කිලෝ මිලියන 320 ඉක්මවා තිබුණි. 2012 වර්ෂයේදී කොල්කටා වෙන්දේසියේ විකුණුම්වල විශාල පසුබෑමක් දක්නට

ලැබුණ නමුදු 2013 වර්ෂයේදි විකුණුම් ප්‍රමාණය වැඩිකරමින් එය යථා තත්ත්වයට පත්කරගෙන තිබුණි.

වගුව 2.15: ප්‍රධාන තේ වෙන්දේසි පිළිබඳ සංඛ්‍යාලේඛන (ප්‍රමාණය- කි.මිලි., සාමාන්‍ය ඒකක මිල - එ.ජ.ඩො./ කි.ග්‍රෑ.)

| වෙන්දේසි මධ්‍යස්ථානය | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල |
| චිතගොං | 57 | 2.61 | 54 | 2.14 | 58 | 2.41 | 55 | 2.87 |
| කෝචින් | 61 | 1.71 | 59 | 1.73 | 57 | 1.8 | 53 | 1.94 |
| කොළඹ | 322 | 3.28 | 323 | 3.26 | 325 | 3.07 | 336 | 3.44 |
| ගුවාහාටි | 122 | 2.43 | 126 | 2.33 | 119 | 2.47 | 119 | 2.26 |
| ජාකර්තා | 39 | 1.82 | 33 | 1.97 | 32 | 1.97 | 33 | 1.98 |
| කොල්කටා | 155 | 2.86 | 166 | 2.78 | 151 | 2.81 | 163 | 2.72 |
| ලිම්බෙ | 16 | 1.58 | 13 | 1.61 | 13 | 1.7 | 10 | 1.82 |
| මොම්බාසා | 348 | 2.54 | 334 | 2.72 | 322 | 2.88 | 384 | 2.41 |


මූලාශ්‍රය: ජා.තේ.ක. වෙබ් අඩවිය

පසුගිය වසර හතරක කාලපරිච්ඡේදයක් පුරා ඉහළම වෙන්දේසි මිල සාමාන්‍යයක් පවත්වාගෙන යාම පිළිබඳ වාර්තාව කොළඹ තේ වෙන්දේසිය සතුවිය. එය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදි තේ කිලෝග්‍රෑමයකට එ.ජ.ඩො. 3.00 ඉක්මවා මිල පවත්වාගෙන යනු ලැබූ එකම වෙන්දේසි මධ්‍යස්ථානය විය. තේ කිලෝග්‍රෑමයකට ඇ.ඩො. 2.72ක ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිලක් පවත්වගෙන යමින් කොල්කටා වෙන්දේසිය දෙවැනි ස්ථානයට පත්වූ අතර මොම්බාසා තේ වෙන්දේසිය 2013 වර්ෂයේදි එහි තෙවැනි ස්ථානය අත්පත් කරගනු ලැබිය.

## 2.5.5 ගෝලිය තේ අපනයනය

පූර්ව වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදි ගෝලිය තේ අපනයනයේ කිලෝ මිලි.92.0 ක (5%) අඩුවීමක් පෙන්නුම් කෙරිණි. තේ අපනයනය කරන අනෙකුත් ප්‍රධාන රටවල් හා සංසන්ධනය කිරීමේදි 2013 වර්ෂයේදි කෙන්යාව සහ ශ්‍රී ලංකාව එහි අපනයන ප්‍රමාණයේ පිළිවෙළින් 14.9% ක හා 3.8%ක වර්ධනයක් අත්කරගෙන තිබුණි. කෙන්යාව, චීනය හා ශ්‍රී ලංකාව යන ප්‍රධාන අපනයනකරුවන් තිදෙනා විසින් ගෝලිය අපනයනයෙන් 61.4%කට වඩා වැඩි අපනයන ප්‍රමාණයක් සඳහා දායකත්වය සපයා තිබුණි.

සටහන 2.7: ප්‍රධාන තේ අපනයනකරුවන්





මූලාශ්‍රය: ජා.තේ.ක. වාර්ෂික සංඛ්‍යාලේඛන – 2013

සැ.යු. ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යාවල ප්‍රති අපනයනයට අදාළ සංඛ්‍යා ඇතුළත් නොවේ.

2012 වර්ෂයේ ප්‍රධාන තේ අපනයන රටවල් හා ඒවායේ අපනයන ආදායම පහතින් දැක්වේ. ශ්‍රී ලංකාව තේ අපනයනය තුළින් දෙවැනි විශාලතම ආදායම උපයන්නා බව ඉන් අනාවරණය වේ. දෙවැනි විශාලතම තේ අපනයන ඉපැයුම්කරු වූ ශ්‍රී ලංකාව හා සැසඳීමේදි කෙන්යාව එ.ජ.ඩො. මිලියන 3.3ක ආදායමක් උපයා ඇති බව පැහැදිළි වේ. පවිත්‍ර තේ අපනයනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ඩොලර් බිලියනයක ආදායම් උපයන කර්මාන්තයක තත්ත්වයක් අඛණ්ඩව රඳවාගෙන සිටී.

2.16: වගුව ඉහළම අපනයන ආදායම් (2012)

| රට | අපනයන ආදායම (එ.ජ.ඩො. මිලියන) |
|---|---|
| කෙන්යාව | 1,328.00 |
| ශ්‍රී ලංකාව | 1,324.70 |
| චීනය | 1,115.80 |
| ඉන්දියාව | 686.80 |
| වියට්නාමය | 227.00 |
| ඉන්දුනීසියාව | 156.70 |




# ලංකා තේ අපනයන වෙළඳපොළ

## 2.6 ලංකා තේ පිළිබඳ අපනයන වෙළඳපොළ සමාලෝචනය

### 2.6.1 රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලය

2013 වර්ෂයේදී ලෝකයට අපනයනය කරන ලද මුළු ලංකා තේ ප්‍රමාණයෙන් 22%ක් මිලදී ගනිමින් රුසියාව සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යයන් "ලංකා තේ" ප්‍රධාන ගැනුම්කරු වශයෙන් අඛණ්ඩව ප්‍රමුඛ ස්ථානයේ රැඳී සිටී. ලංකා තේ අපනයනයෙන් 15%ක් පමණ තනිව මිලදී ගනිමින් රුසියාව ශ්‍රී ලංකා තේ ගැනුම්කරුවන් අතර අංක එකේ ස්ථානය පවත්වාගෙන යන ලදී. මෙම කලාපය ලංකා තේ ආනයනය කරනු ලබන රටවල් 12කින් සමන්විත වේ.

වගුව 2.17 පොදුරාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය කලාපය වෙත ලංකා තේ අපනයනය කිරීම පිළිබඳ රටවල් අනුව සංසන්ධනය (2012/2013)

| රට | 2012 කි.ග්‍රෑ. | 2013 කි.ග්‍රෑ. | වෙනස ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| රුසියාව | 49,231,228 | 46,371,885 | (2,859,343) | -5.8 |
| යුක්රේනය | 9,792,151 | 9,342,238 | (449,913) | -4.6 |
| ඇසර්බෙයිජාන් | 10,691,045 | 10,780,779 | 89,734 | 0.8 |
| කසකස්ථානය | 991,480 | 867,949 | (123,531) | - 12.5 |
| උස්බෙකිස්ථානය | 1,932,078 | 1,259,839 | ( 672,239) | - 34.8 |
| කිර්ගිස්ථානය | 1,014,460 | 991,067 | (23,393) | - 2.3 |
| බෙලාරුස් | 579,162 | 638,247 | 59,085 | 10.2 |
| මෝල්ඩෝවා | 321,320 | 271,361 | (49,959) | - 15.5 |
| ජෝර්ජියා | 178,282 | 327,711 | 149,429 | 83.8 |
| ටජිකිස්ථානය | 41,013 | 30,663 | (10,350) | - 25.2 |
| ටර්ක්මෙනිස්ථානය | 130,425 | 46,151 | (84,274) | - 64.6 |
| ආර්මේනියාව | 222,781 | 70,198 | (152,583) | - 68.5 |
| එකතුව | 75,125,425 | 70,998,088 | ( 4,127,337 ) | - 5.5 |

දත්ත මූලාශ්‍ර : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

#### 2.6.1.1. රුසියාව



ලංකා තේ ගැනුම්කරුවන් අතරින් රුසියාව ලංකා තේ විශාල තනි ගැනුම්කරු වශයෙන් අඛණ්ඩව සිටී. ශ්‍රී ලංකාව විසින් 2013 වර්ෂයේදී ලෝකයට අපනයනය කරන ලද මුළු ලංකා තේ අපනයනයෙන් 15%ක් රුසියාවට අපනයනය කොට ඇත. එරටේ වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 181,000 කට ආසන්න වන බවට ඇස්තමේන්තු කර ඇති අතර ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 2.4 කි. රුසියානු රේගු බලධාරීන් ප්‍රකාශ කරන පරිදි 2012 හා 2013 වර්ෂවලදී ආසන්න වශයෙන් 33%ක් බැගින් වූ ප්‍රතිශතයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාව එම වර්ෂවලදී තේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වී ඇත.

ප්‍රමාණය පිළිබඳ සලකා බැලීමේදී රුසියාව 2012 වර්ෂයේදී තේ කිලෝ මිලියන 180.1 ක් ආනයනය කර තිබූ අතර ඉන් කිලෝ මිලි. 47ක් ශ්‍රී ලංකාවෙන්ද, කිලෝ මිලි. 46 ක් ඉන්දියාවෙන්ද, කිලෝ මිලි. 15.3 ක් චීනයෙන්ද, කිලෝ මිලි. 14 ක් ඉන්දුනීසියාවෙන්ද කිලෝ මිලි 19.3 ක් කෙන්යාවෙන්ද කිලෝ මිලි. 23 ක් වියට්නාමයෙන්ද ආනයනය කර තිබුණි.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් රුසියාවට සෘජුවම අපනයනය කරන ලද ලංකා තේ ප්‍රමාණය කිලෝ මිලි. 46 ක් වූ අතර එහි වටිනාකම ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 31.0 ක් පමණ විය. එමෙන්ම 2012 වර්ෂයේදී ලංකා තේ කිලෝ මිලි. 49.2 රුසියාවට අපනයනය කරන ලද අතර එහි වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 28.5ක් විය. රුසියාවේ රේගු දෙපාර්තමේන්තුවට අනුව 2012 වර්ෂයේදී තේ කිලෝ මිලියන 47 ක් සපයමින් ශ්‍රී ලංකාව විශාලතම සැපයුම්කරු වශයෙන් අංක එක ස්ථානය පවත්වාගෙන තිබුණි.

අගය එකතු කිරීමේ වර්ධනයක් පිළිබිඹු කරමින් නැවිගත තේ ඇසුරුම් සහ තේ බෑග් ප්‍රමාණය 2013 වර්ෂයේදී 13% කින් ඉහළ ගියේය. (ඇසුරුම්වලින් 2013 වර්ෂයේදී කිලෝ මිලි. 8.5 ක් හා 2012 වර්ෂයේදී කිලෝ මිලි. 7.5ක් ලෙස හා තේ බෑග්වලින් 2011 දි කිලෝ මිලි. 2.7ක් හා 2.6ක් ලෙස) "අක්බාර්" තේ තම ඇසුරුම් කිරීම වසර කීපයකට පෙරදී ඇරඹීමට අමතරව "රිස්ටන්" වැනි අපගේ ලංකා තේ සන්නම් රුසියාවේ ඇසුරුම් කිරීම ආරම්භ කර ඇති තත්ත්වයකදී වුවද මෙම තත්ත්වය ළඟා කරගෙන තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ කොන්ත්‍රාත් ඇසුරුම්කරුවන් වන "අහමඩ්" තේ ද රුසියාවේ තම ඇසුරුම් කිරීමේ ප්‍රමාණය ඉහළ දමා ඇත.

රුසියන් සමූහාණ්ඩුවේ ජනප්‍රිය සන්නම් අතර ඔරිම් ට්‍රේඩ් එල්.එල්.සී. (ග්‍රීන් ෆීල්ඩ්, මෙස්, ප්‍රින්සස් ගීතා, ප්‍රින්සස් නූරි සහ ප්‍රින්සස් ජාවා) පළමු ස්ථානයේ වැජඹෙන අතර ඉන් අනතුරුව “කොරෝනා” සහ “ලිස්මා” යන සන්නම් සහිතව May සමාගම, “ලිප්ටන්”, “බෲක් බොන්ඩ්” සහ “බෙසෙදා” යන සන්නම් සහිතව යුනිලිවර් සමාගම, “අහමඩ්” යන සන්නම සහිත AHMAD සමාගම, “අක්බාර්” සහ “බර්නෙලි” යන සන්නම් සහිත SAPSAN සමාගම ද ජනප්‍රිය සන්නම් අතර පසු වේ.

### 2.6.1.2. යුක්රේනය



යුක්රේනය වූ කලි පොදුරාජ්‍යමණ්ඩලීය ස්වාධීන රටවල් අතර සාම්ප්‍රදායික තේ පරිභෝජ්‍ය රටක් වන අතර කලාපයේ රුසියාව හැරුණු විට දෙවන විශාලතම තේ වෙළඳපොළද වේ. පුද්ගලයකුගේ වාර්ෂික සාමාන්‍ය තේ පරිභෝජනය ග්‍රෑම් 500-600ක් පමණ වන අතර එය සාපේක්ෂ වශයෙන් පහළ අගයකි. එබැවින් පරිභෝජනය පුළුල් කිරීමේ ශක්‍යතාවක් පවතී.

යුක්රේන ජාතිකයන් ප්‍රධාන වශයෙන් කළු තේ පානය කරන්නන් වන අතර තේ ආනයනයේ විශාල වර්ධනයක් ඇති වී තිබුණි. සාම්ප්‍රදායික තේ මෙරටේ ඉතා ජනප්‍රිය පානයකි. සියලුම යුක්රේන ජාතිකයන් උණුසුම් තේ පානය කරනු ලබන අතර තේ පරිභෝජනය සෘතු අනුව සිදු කිරීමේ ස්වභාවයක් දක්නට ලැබේ. තේ සඳහා වන උපරිම ඉල්ලුම සීත සෘතුවේදී පවතී.

එරටේ දේශීය වෙළඳපොළ වූ කලී ජාතික තේ සන්නම්ද සහිතව ශ්‍රී ලංකාවේ සහ රුසියාවේ ලෝක ප්‍රසිද්ධ සමාගම් සහ සන්නම් නිෂ්පාදකයින් ක්‍රියාත්මක වන ස්ථානයයි. May tea, ඔරිම්, අහමඩ් තේ සමාගම, සොලොම්යා සමාගම යන සමාගම් යුක්රේනයේ ඇසුරුම් කිරීමේ යන්ත්‍ර සහිත ප්‍රධාන සන්නම් හිමිකරුවන්ය.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛන අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 9,342,238 ක් වූ අතර එම ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 62% ක් තොග වශයෙන්ද,
22%ක් ඇසුරුම් ලෙසද, 6.5%ක් තේ බෑග් වශයෙන්ද, 3.4%ක් හරිත තේ වශයෙන්ද, 6.1%ක් වෙනත් ආකාරයෙන්ද අපනයනය කර ඇත. 2013 වර්ෂයේදී අපනයනය කරන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 9,342,238ක් වූ අතර එය 2012 වර්ෂයට වඩා 5%ක අඩුවීමකි.

ආර්ථික අර්බුදය සහ මුදල් අවප්‍රමාණය කිරීම එරටේ ආර්ථිකයට බලපෑම් එල්ල කිරීම නිසා එය ශ්‍රී ලංකා තේ අපනයනයට සෘජුවම බලපා තිබේ. ආනයනකරුවන් විසින් පෙර ඇසුරුම් තේ ඇනවුම් කිරීම අඩු කිරීමටත් දේශීයව ඇසුරුම් කිරීම සඳහා තේ තොග ආනයනය වැඩි කිරීමටත් එය හේතු සාධක වී ඇත. රටතුළ පවතින ව්‍යාකූල තත්ත්වය හේතුවෙන් ඉදිරි වර්ෂවලදී යුක්රේනයට සිදුකරනු ලබන තේ අපනයනයේ පහත බැසීමක් අපේක්ෂා කළ හැකිය.

### 2.6.1.3. ඇසර්බෙයිජාන්



ආගන්තුක සත්කාරයේ සංකේතයක් ලෙස ඇසර්බෙයිජාන් රට සැලකෙන අතර එරටේ තේ සම්ප්‍රදායක් දක්නට ලැබේ. ආගන්තුකයෙකු නිවසට පැමිණුන විට පළමුව තේ පිළිගැන්වීම එහි සිරිතයි. එක ඇසර්බේනියානු වැසියෙක් දිනකට ආසන්න වශයෙන් තේ කෝප්ප 10-15 ක් අතර ප්‍රමාණයක් පානය කරයි. ඇසර්බෙයිජානයේ වාර්ෂික තේ අලෙවිය මෙට්‍රික් ටොන් 9,000ක් පමණ වන අතර දේශසීමා හරහා (ප්‍රධාන වශයෙන් රුසියාව, ඉරානය, ජෝර්ජියාව සහ තුර්කිය) ආසන්න වශයෙන් තේ මෙට්‍රික් ටොන් 2000ක් පමණ අලෙවි වන බවට ඇස්තමේන්තු කොට ඇත. සංඛ්‍යාලේඛන කමිටුවට අනුව ඇසර්බෙයිජියානු පවුලක වාර්ෂික තේ පරිභෝජනය ග්‍රෑම් 700 සිට කිලෝ එකක ප්‍රමාණය අතර වේ. මෙමඟින් පැහැදිළි වනුයේ මාසික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය ග්‍රෑම් 145ක් පමණ වන බවයි.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී අපනයනය කරන ලද ප්‍රමාණයෙන් 95%ක් තොග වශයෙන් වූ අතර 5%ක් ඇසුරුම් වශයෙන් විය. 2013 වර්ෂයේදී තේ අපනයනය 1%කින් වර්ධනය වී ඇත.

### 2.6.1.4. කසකස්ථානය



කසකස්ථාන වෙළඳපොලේ අලෙවි වන මුළු තේ ප්‍රමාණය තේ මෙ.ටො. 26000-29000 අතර වන බව ඇස්තමේන්තු කර

ඇත. පොදුරාජ්‍යමණ්ඩලීය අනෙකුත් ස්වාධීන රටවල්වලට වඩා වෙනස් ලෙසට මෙරටේ කිරි සමඟ තේ පානය කිරීම සිදුවේ. කසකස්ථානයේ ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 1.8 ක ආසන්න මට්ටමක පවතී. කසකස්ථානයේ උණුසුම්පාන වෙළඳපොල විශාල වශයෙන් තේ මත රඳා පවතින අතර එරටේ සංස්කෘතිය සහ සම්ප්‍රදායයන් පහසුවෙන් වෙනස්වීම්වලට භාජනය නොවන හෙයින් තේ සඳහා වන ඉල්ලුම බොහෝ කාලයක් පුරා පවත්වාගෙන යනු ලබන බව දක්නට ලැබේ.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව කසකස්ථානය විසින් 2013 වර්ෂයේදී ආසන්න වශයෙන් ලංකා තේ කි. ග්‍රෑ. 867,949 ක් එරටට ආනයනය කොට ඇත. මෙය 2012 වර්ෂයට සාපේක්ෂව 12%ක අඩුවීමකි. කසකස්ථානයේ තේ වෙළඳපොල තුළ ප්‍රධාන වශයෙන් බලපැවැත්වෙන්නේ සී.ටී.සී. තේ ය. පවත්නා සංඛ්‍යාලේඛන දත්තවලට අනුව එරටේ සමස්ත සී.ටී.සී. තේ ආනයනයෙන් 85%ක් පමණ ඉන්දියාවෙන් සහ කෙන්යාවෙන් ආනයනය කරනු ලැබේ. මුළු වෙළඳපොළ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 6%ක ප්‍රමාණයක් හරිත තේවලින් යුක්ත වේ.

### 2.6.1.5. උස්බෙකිස්ථානය



උස්බෙකිස්ථානයේ ප්‍රධාන වශයෙන් පවතින්නේ හරිත තේ වෙළඳපොලක් වන අතර වාර්ෂික දේශීය තේ අලෙවිය ආසන්න වශයෙන් මෙ.ටො. 30,000ක් පමණ වන බවට ඇස්තමේන්තු කොට ඇත. ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී තේ කි.ග්‍රෑ. 1,259,839ක් එරටට අපනයනය කර ඇති අතර 2012 වර්ෂය හා සැසඳීමේදී එය 35%ක අඩුවීමකි. උස්බෙකිස්ථාන වෙළඳපොල තුළ හරිත තේ සඳහා ආධිපත්‍යයක් පැවතීම ඊට හේතුවයි

### 2.6.1.6. කිර්ගිස්ථානය



කිර්ගිස්ථානය ප්‍රධාන වශයෙන් කලු තේ පානය කරන රටක් වන අතර එරට වැසියෝ මඳ වර්ණ (කහ පැහැති) උණුසුම් කලු තේ වෙන කිසිවක් එක් නොකොට පානය කිරීමට ප්‍රිය කරති. වෙළඳපොල මූලාශ්‍ර සඳහන් කරන පරිදි ඇස්තමේන්තුගත වාර්ෂික තට්‍ය තේ පරිභෝජනය තේ මෙ.ටො. 4000කි. මිලියන 5.5ක ජනගහනයක් සිටින මෙරටේ ඒක පුද්ගල තේ පරිභෝජනය ග්‍රෑම් 700ක් පමණ වේ.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී කිර්ගිස්ථානයට අපනයනය කරන ලද සෘජු තේ අපනයනය කි.ග්‍රෑ. 991,067ක් වන අතර 2012 වර්ෂයේදී එම ප්‍රමාණය කි.ග්‍රෑ. 1,014,460ක් වී තිබුණි. ඒ අනුව 2012 වසරට සාපේක්ෂව තේ අපනයනයේ 2%ක අඩුවීමක් 2013 දී දක්නට ලැබේ. 2012 වර්ෂයේදී අපනයනය කරන ලද තේ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 92%ක් පමණ තොග වශයෙන් අපනයනය කර ඇත. කෙසේනමුදු පූර්ව වර්ෂයට වඩා තේ පැකට් අපනයනයේ 2%ක වර්ධනයක් 2013 වර්ෂයේදී ඇතිවී තිබුණි. එමෙන්ම නැවිගත තේ බෑග අපනයනය 2013 වර්ෂයේදී 2012 වර්ෂයට වඩා දෙගුණයකින් ඉහළ ගොස් තිබුණි. ඇසුරුම් නොකරන ලද තේ ග්‍රාමීය ප්‍රදේශවල අලෙවිය සඳහා තිබෙන අතර තේ බෑග් සහ රස මුසුකළ තේ සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බවට වාර්තා නොවේ. හරිත තේ සඳහා වන ඉල්ලුම වැඩිවෙමින් පවතින නමුදු එම තේ අපනයනයේ වර්ධනය වීමක් වාර්තා නොවේ. මෙරටේ ප්‍රධාන හරිත තේ සැපයුම්කරුවා චනුයේ චීනයයි.

### 2.6.1.7. බෙලාරුස්



තේ වූකලි ලාබදායී සහ සෞඛ්‍යසම්පන්න පානයක් වශයෙන් බෙලාරුසියානු ජනතාව අතර වඩාත් ජනප්‍රිය වී ඇති පානයකි. ජනගහනය මිලියන 9.48ක් පමණ සිටින බෙලාරුසයේ වාර්ෂික මුළු තේ අලෙවිය මෙ.ටො. 8000ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇති අතර එම ප්‍රමාණයෙන් 50%ක් පමණ රුසියානු හා යුක්රේන දේශසීමා හරහා මෙරටට සැපයේ.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් 638,247ක් සෘජුවම බෙලාරුසයට අපනයනය කොට ඇත. ශ්‍රී ලංකාවෙන් මෙම වෙළඳපොලට අපනයනය කරනු ලබන තේවලින් 84%කට වඩා වැඩි ප්‍රමාණයක් අගය එකතුකළ තේ ස්වරූපයෙන් වේ. (59% ඇසුරුම්, 23% තේ බෑග් සහ 9%ක් හරිත තේ). 2012 වර්ෂයට වඩා 2013 දී 9.7%ක තේ තොග අපනයනයේ පහත වැටීමක් සිදු වී තිබුණි.

### 2.6.1.8. මෝල්ඩෝවා



මෑතකාලයේ ආර්ථික පදනමේ සුළු ප්‍රගතියක් දක්නට ලැබුණද මෝල්ඩෝවා වූ කලී යුරෝපයේ ඇති දුප්පත්ම රාජ්‍යයයි. වාර්ෂිකව තේ සඳහා වන මුළු වෙළඳපොල මෙ.ටො. 2500-3500 අතර ප්‍රමාණයක වන බව ඇස්තමේන්තු කර ඇති අතර තත්‍ය අලෙවිය මත පදනම්ව බැලූ කළ ප්‍රති ශීර්ෂ තේ පරිභෝජනය තේ ග්‍රෑම් 500කි. කලු තේ හා හරිත තේ පරිභෝජන අනුපාතය 95:5ක් බවට ඇස්තමේන්තු කොට ඇත. රසගැන්වූ තේ පරිභෝජනය සිදුවන්නේද ඉතා සුළු ප්‍රමාණයකිනි. තේ බෑග සඳහා වන ඉල්ලුම නාගරික ප්‍රදේශවල ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. මෝල්ඩෝවාවට බොහොමයක් තේ සැපයෙන්නේ යුක්රේන දේශසීමාව හරහාය. ලංකා තේ මෙහි අතිශය ජනප්‍රිය වන අතර සියලුම අලෙවි කුටිවල පාහේ මෙම තේ විශාල ලෙස අලෙවිය සඳහා තබා ඇත.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් තේ කි.ග්‍රෑ. 271,361ක් මෙරටට අපනයනය කර ඇති අතර ඉන් 48%ක් ඇසුරුම් ස්වරූපයෙන්ද, 32%ක් තේ බෑග් වශයෙන්ද, 12%ක් හරිත තේ ලෙසද අපනයනය කොට තිබේ. 2012 වර්ෂයේදී අපනයනය කරන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 321,320ක් වන අතර ඊට පෙර වර්ෂයේ මෝල්ඩාවාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණයට වඩා 16%ක අඩුවීමක් එමගින් පෙන්නුම් කරයි.

### 2.6.1.9. ටර්ක්මෙනිස්ටාන්



ටර්ක්මෙනිස්ටානයේ වාර්ෂික තේ වෙළඳපොල මෙ.ටො.8000ක් බවට අස්තමේන්තු කොට ඇති අතර වාර්ෂික ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 1.5 කි. ටර්ක්මෙනිස්ටානයේ ප්‍රධාන වශයෙන්ම හරිත තේ වෙළඳපොලක් පවතින අතර ප්‍රධාන වශයෙන්ම එම තේ සැපයුම සිදුවන්නේ චීනයෙනි. එ.අ.එ., ඉරානය, ජෝර්ජියාව සහ ශ්‍රී ලංකාව යන රටවලින් එරටට කලු තේ ආනයනය සිදු වේ. වඩාත්ම මිල අඩුවීම හේතුකොටගෙන ඉරාන කලු තේ එරට ඉතා ප්‍රචලිත වී ඇත. හරිත තේ පරිභෝජනය ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන අතර කලු තේ පරිභෝජනය වැඩි වශයෙන් සිදුවන්නේ නාගරික ප්‍රදේශ තුළය.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාව විසින් 2012 හා 2013 යන වර්ෂවලදී ටර්ක්මෙනිස්ටානයට සෘජුවම අපනයනය කර ඇති තේ ප්‍රමාණය පිළිවෙලින් කි.ග්‍රෑ. 46,151 ක් හා 130,425 කි. ඒ අනුව පෙර වර්ෂයට වඩා 65%ක අඩුවීමක් 2013 වර්ෂයේදී වාර්තා විය. කෙසේනමුත් සියලුම අපනයනයන් එකතු කළ අගය ස්වරූපයෙන් සිදු කරන ලද අතර අගය එකතුකළ ස්වරූපයේ ලංකා තේ ඇසුරුම් සහ බෑග අපනයනය සඳහා අවකාශ තිබුණ බව පැහැදිළි විය.

### 2.6.1.10. ටජිකිස්ථානය



මිලියන 7ක ජනගහනයකින් යුත් ටජිකිස්ථානයේ වාර්ෂික සාමාන්‍ය තේ වෙළඳාම මෙ.ටො.6,000 සිට 7,000 අතර පරාසයක වන බව ඇස්තමේන්තු කොට ඇත. පොදුරාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය අතර පහළම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයක් පවතින්නේ ටජිකිස්ථානයේය. වෙළඳපොල මූලාශ්‍රවලින් අනාවරණය වන පරිදි මිලදී ගැනීමේ හැකියාව දුර්වල මට්ටමක පැවතීම නිසා වැඩි ඉල්ලුමක් පවතින්නේ අඩුමිල තේ සඳහාය.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2012 හා 2013 වර්ෂවලදී ශ්‍රී ලංකාව විසින් එරටට සිදු කරන ලද සෘජු අපනයන ප්‍රමාණය පිළිවෙලින් තේ කි.ග්‍රෑ. 41,013ක් හා 30,663ක් විය. 2013 වර්ෂයේදී තේ තොග අපනයනය සිදු නොවූ අතර නැව්ගත ඇසුරුම් අපනයනය මුළු අපනයනයෙන් 75%ක් විය. 2012 වර්ෂයේදී එම ප්‍රමාණය 32% ක් වී තිබුණි. එමනිසා 2012 වර්ෂය හා සැසඳීමේදී ලංකා තේ මුළු ආනයනය 25%කින් පහත බැස තිබුණි.

### 2.6.2. මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු වෙළඳපොල

2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය වෙත අපනයනය කරන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 172,072,205ක් වූ අතර 2012 වර්ෂයේ එම කාලපරිච්ඡේදයේදී එම කලාප වෙත අපනයනය කරන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 170,307,012 (ප්‍රති අපනයනයද ඇතුළත්ව) ක් විය. අපනයනයේ වැඩිවීම කි.ග්‍රෑ. 1,765,193 (1%) ක් තරම් වුවද කලාපයේ බොහෝ රටවල් තුළ

ඇති වී තිබූ වාතාවරණයන් පිළිබඳ සැලකිල්ල යොමු කිරීමේදී එය විශාල ජයග්‍රහණයකි.

2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයනයෙන් 53.83%ක් පමණ මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු රටවල් වෙත අපනයනය කරනු ලැබූ අතර විශේෂයෙන් පහළ උන්නතාංශවල වැඩෙන තේ වර්ග සඳහා වැඩි අලෙවියක් ඇති කරමින් ලංකා තේ සඳහා වන විශාලතම වෙළඳපොල යන තත්ත්වය එම කලාපය විසින් පවත්වාගෙන යන ලදි.

වගුව 2..18: මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු රටවල් වෙත ලංකා තේ අපනයනය කිරීම පිළිබඳ රටවල් අනුව සංසන්දනය

| රට | 2012 කි.ග්‍රෑ. | 2013 කි.ග්‍රෑ. | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| ඉරානය | 41,043,481 | 38,416,383 | -2,627,098 | -6.4 |
| තුර්කිය | 23,163,115 | 32,202,299 | 9,039,184 | 39.0 |
| ඉරාකය | 23,488,487 | 22,266,861 | -1,221,626 | -5.2 |
| සිරියාව | 24,741,383 | 21,058,862 | -3,682,521 | -14.9 |
| කුවේටය | 7,402,233 | 16,021,562 | 8,619,329 | 116.4 |
| එ.අ.එ. | 11,887,358 | 17,531,254 | 5,643,896 | 47.5 |
| ජෝර්දානය | 9,434,035 | 7,632,455 | -1,801,580 | -19.1 |
| ලිබියාව | 16,514,196 | 6,520,837 | -9,993,359 | -60.5 |
| සෞදි අරාබිය | 4,698,970 | 3,519,977 | -1,178,993 | -25.1 |
| ලෙබනනය | 2,156,770 | 2,815,634 | 658,864 | 30.5 |
| ඊජිප්තුව | 3,800,074 | 2,016,859 | -1,783,215 | -46.9 |
| වෙනත් | 1,976,910 | 2,069,222 | 92,312 | 4.7 |
| එකතුව | 170,307,012 | 172,072,205 | 1,765,193 | 1.0 |

### 2.6.2.1. ඉරානය



පහත සඳහන් ආර්ථික, මූල්‍ය සහ දේශපාලනික වෙනස්වීම් 2013 වර්ෂය තුළ ශ්‍රී ලංකාව සහ ඉරානය අතර තේ වෙළඳාම කෙරෙහි බලපෑම් ඇති කළේය.

ඉරානයේ මූල්‍ය ක්ෂේත්‍රය, රත්‍රන් අපනයනය සහ නැව් ක්ෂේත්‍රය ඉලක්ක කරගනිමින් ඇ.එ.ජ. විසින් නව සම්බාධක පැනවීම. 2013 වර්ෂයේ මැද සිට බොහෝ අන්තර්ජාතික නැව් සමාගම් ඉරානය වෙත සෘජු නැව් ගමන් නතර කරනු ලැබිය.

ඇ.එ.ජ. හා එ.යු. විසින් ඉරානයේ සම්බාධක තරකර තිබියදී මතභේදයට තුඩුදුන් ඉරාන න්‍යෂ්ඨික ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා ඉරානය සහ 5+1 කණ්ඩායම අතර අඛණ්ඩව සිදුවුණි. ඉරානය විසින් යුරේනියම් භාවිතය අඩු කිරීමට එකඟ වීමත් ඇ.එ.ජ./ එ.යු. විසින් මාස හයක කාලයක් ඇතුළත සම්බාධක ලිහිල් කිරීමට එකඟ වීමත් සමඟ එම කටයුත්ත 2013 නොවැම්බර් මාසයේදී නතර කරන ලදි.

2013 වර්ෂයේදී ඉරාන නව ජනාධිපතිවරයා පත්වීම එරටේ ආර්ථිකයට මෙන්ම අනෙකුත් රටවල් සමඟ පවතින දේශපාලන සබඳතා ආදිය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කළේය. ඉරානයේ සහ ඇ.එ.ජ. විදේශ ඇමතිවරුන් දෙදෙනා නිව්යෝක් නුවර එ.ජා. මහා සමුළු සැසියේදී පැවැත් වූ ඓතිහාසික හමුව දෙරට අතර සබඳතා වර්ධනය වීම උදෙසා ඉවහල් විය.

ඉරාන රජය විසින් එ.ජ. ඩොලරයට නිල හුවමාරු අනුපාතය වූ IR 12,260 2013 ජූලි මාසයේදී අවලංගු කරන ලද අතර IR 25,560 ක නව අනුපාතයක් හඳුන්වා දෙන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඩොලරයේ වෙළඳපොල අනුපාතය 2013 නොවැම්බර් මස වනවිට IR 36,000 සිට IR 29,000-30,000 දක්වා වර්ධනය විය.

ලංකා තේ ආනයනය කරන ඉරාන ආනයනකරුවන් සඳහා බැංකු පහසුකම් නොමැතිවීම නිසා ශ්‍රී ලංකා නිෂ්පාදනවල මිල ගණන් අධික වීමෙන් ඇතැම් පරිභෝගිකයන් මිල අඩු වෙනත් තේ සම්භව කරා යොමු වීම සිදුවිය. ඉරානයේ පවතින වර්තමාන තත්ත්වයෙන් කෙන්යානු තේ සඳහා වාසි සහගත අවස්ථාවක් උදාවිය.

2013 වර්ෂයේදී ඉරානයේ දේශීය තේ නිෂ්පාදනය මෙ.ටො. 15,000ක් වන බව එක්සත් රාජධානියේ තිබෙන ජාත්‍යන්තර තේ කමිටුවේ 2012 වාර්ෂික සංඛ්‍යාලේඛන මඟින් දක්වා ඇත. 100,000 කට අධික පිරිසක් තේ වගාවෙහි සේවා නියුක්තව සිටින නිසා අස්වනු පහළ මට්ටමක පැවතුන නමුදු රජය විසින් තේ වගාකරුවන්ට සහනාධාර ලබාදීම අඛණ්ඩව සිදු කෙරුනි.

මිලියන 70ක ජනගහනයක් සිටින ඉරානයේ වාර්ෂික දේශීය තේ පරිභෝජනය මෙ.ටො.110,000ට අධික වීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් තේ මෙ.ටො.100,000ක් පමණ ඉරානය ආනයනය කරයි. පෙර ඇසුරුම්

තේ ආනයනය කෙරෙහි පනවා ඇති සීමාවන් සහ තේ තොග ආනයනය කෙරෙහි පනවා ඇති 30%ක අධික තීරු බදු නිසා තේ මෙ.ටො. 40,000කට වඩා වැඩි ප්‍රමාණයක් නීති විරෝධී මාර්ග ඔස්සේ ඉරානයට සැපයේ. වාර්ෂිකව නිත්‍යානුකූල ලෙස ආනයනය කරනු ලබන තේ ප්‍රමාණය මෙ.ටො. 60,000-65,000 අතර වේ. සෘජු හා වක්‍ර අපනයනයන්හි නියැලෙමින් ශ්‍රී ලංකාව ඉරාන තේ වෙළඳපොලේ ප්‍රමුඛයා බවට පත්ව සිටින අතර ඉන් අනතුරුව ඉන්දියාව, කෙන්යාව හා චීනය යන රටවල් සිටී. කෙසේනමුත්, 2013 වර්ෂයේදී ඉරාන තේ වෙළඳපොලේ ස්ථාවරත්වයක් ගොඩනැඟීමට ඉන්දියාව සමත් විය.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ඉරානය විසින් තේ මෙ.ටො. 38,416ක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කර ඇත. 2012 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ මෙ.ටො. 2,627ක් නොහොත් 6%ක අඩුවීමක් එමඟින් පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාව තම අපනයන වියදමින් බොහෝ තේ ප්‍රමාණයක් ඉරානයට සහ එ.අ.එ. රාජ්‍යයට අපනයනය කර තිබෙන බව මෙහිදී සඳහන් කළයුතුය. ඉරානයට මූල්‍ය සීමා පැනවීම හේතුකොටගෙන ප්‍රති අපනයනය සඳහා ශ්‍රී ලංකාවෙන් තේ ආනයනය කිරීම 50% කින් පමණ අඩු වී ඇති බව පැහැදිලි වේ. එ.අ.එ. නියෝජිතයන් හරහා තේ මිලදී ගත් බොහෝ ඉරාන තේ ආනයනකරුවෝ සෘජුවම ශ්‍රී ලංකාවෙන් තේ ආනයනය කිරීම ඇරඹූහ.

කෙසේනමුත්, 2013 වර්ෂයේ අවසන් භාගයේදී ඉරානය තුළ ඇති වූ දේශපාලනික හා ආර්ථික අභිවෘද්ධිය ඩුබායි ප්‍රති අපනයන වෙළඳාම කෙරෙහි ධනාත්මක ලෙස බලපා තිබුණි. 2013 දෙවන භාගයේදී ඉරාන් රියාල් මුදල් ඒකකය ස්ථාවරත්වයකට පත්වීම නිසා ඉරානයට ප්‍රති අපනයනය කිරීම පිණිස ශ්‍රී ලංකාවෙන් බොහෝ තේ ආනයනය කිරීමට ඩුබායි තේ වෙළඳ සාමාජිකයන්ට හැකියාව ලැබුණි. මෙම නව ප්‍රවණතාවයේ ප්‍රතිඵලය වූයේ 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ඉරානය වෙත සිදු කරන සෘජු තේ අපනයන ප්‍රමාණය අඩුවීමයි.

### 2.6.2.2. තුර්කිය



තුර්කිය කලාපයේ සාම්ප්‍රදායික තේ නිෂ්පාදනයේ ප්‍රමුඛයා වේ. දේශීය මූලාශ්‍රවලට අනුව වාර්ෂික තේ නිෂ්පාදනය මෙ.ටො. 170,000 ඉක්මවයි. කෙසේවෙතත් එ. රාජධානියේ ජාත්‍යන්තර තේ කමිටුව තුර්කියේ තේ නිෂ්පාදනය පිළිබඳ අඩු සඛ්‍යතාවක් පෙන්නුම් කරනු ලබන අතර, එය වාර්ෂිකව මෙ.ටො. 145,000-150,000 අතර ප්‍රමාණයක් වේ.

වෙළඳ මූලාශ්‍රවලට අනුව වාර්ෂිකව නිත්‍යානුකූල ලෙස තුර්කියට ආනයනය කරනු ලබන තේ ප්‍රමාණය මෙ.ටො. 8000ට වඩා අඩු වේ. ඉරානය, ඉරාකය සහ සිරියාව නීතිවිරෝධී ලෙස තුර්කියට තේ සැපයීම ප්‍රධාන වශයෙන් නැගෙනහිර හා දකුණු දේශසීමා හරහා සිදුවේ. නීති විරෝධී ලෙස තුර්කියට සැපයෙන තේ ප්‍රමාණය පිළිබඳව නිශ්චිත සංඛ්‍යාදත්ත නොමැති නමුත් යුරෝපීය නිරීක්ෂකයන් පවසන පරිදි එම ප්‍රමාණය මෙ.ටො. 30,000කට ආසන්න වේ.

පූර්ව වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් තුර්කියට අපනයනය කරන තේ ප්‍රමාණය මෙ.ටො. 9,039 හෙවත් 39%ක විශාල වර්ධනයක් අත්පත් කරගෙන ඇත. 2012 වර්ෂයේදී තුර්කියට අපනයනය කරනු ලැබූ තේ ප්‍රමාණය මෙ.ටො. 23,163 වූ අතර 2013 වර්ෂයේදී එම ප්‍රමාණය මෙ.ටො. 32,202 වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

රටේ නැගෙනහිර කොටසෙහි වෙසෙන බොහෝ තුර්කි පාරිභෝගිකයන් ලංකා තේ වලට වැඩි රුචියක් දක්වන අතර මෙය නීති විරෝධී තේ වෙළඳ කටයුතු සඳහාද තුඩු දී ඇත. සිරියාවේ සිවිල් යුද්ධය හේතුවෙන් එහි තේ අපනයනයෙන් කොටසක් තුර්කියේ "මර්සින් ෆ්‍රී පෝර්ට්" වෙත යොමුකොට ඇත. වෙළඳ මූලාශ්‍රවලට අනුව ඉරානයට ප්‍රති අපනයනය කිරීම සඳහා සිරියාව විසින් ආනයනය කරනු ලබන යම් තේ ප්‍රමාණයක් තුර්කිය හරහා ආනයනය කරනු ලැබේ. එසේහෙයින් තුර්කිය කලාපයේ ලංකා තේ ආනයනය කරනු ලබන දෙවැනි විශාලතම ආනයනකරු වේ. කෙසේවෙතත් තුර්කිය වෙත අපනයනය කරනු ලබන බොහෝ ශ්‍රී ලංකා තේ නිත්‍යානුකූල අයුරින් එරටට නොසැපයෙන බව මෙහිදී සඳහන් කළ යුතුව ඇත. තුර්කිය වෙත අපනයනය සඳහා යැවෙන ලංකා තේ විශාල ප්‍රමාණයක් අවසානයේදී ආසන්න රටවල් වෙත ළඟා වේ.

## 2.6.2.3. ඉරාකය




වර්ෂ දෙකකට පෙර ඉරාකය තුළ තේ ආනයනය නිදහස් කළ හෙයින් එහි සෘජු ආනයනය වැඩිවුණි. ඉරාකය තවමත් තම තේ අවශ්‍යතාවයෙන් කොටසක් ජෝර්දානය, කුවේටය, තුර්කිය හා උතුරු ඉරාකයෙන් සපයා ගනී. වෙළඳ මූලාශ්‍ර අනුව එරටේ වාර්ෂික තේ ආනයනය මෙ.ටො. 50,000 ඉක්මවන බවට ඇස්තමේන්තු කර ඇත. ලංකා තේ සෘජු අපනයනය තුළින් ඉරාකයේ තේ වෙළඳපොලෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් අත්පත් කරගැනීමට 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හැකියාව ලැබී ඇත. රාජ්‍ය අංශය විසින් තේ අපනයනය කිරීම නතර කිරීමෙන් අනතුරුව ඉන්දීය සැපයුම්කරුවන්ට තම වෙළඳපොල කොටස පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. ඉන්දියාව පවිත්‍ර තේවලට වඩා බහු සම්භවවලින් මිශ්‍රිත තේ සැපයීම සිදුකරන බව බොහෝ පෞද්ගලික වෙළඳුන් දැනුවත් වී සිටි අතර ඔවුන් විසින් ඉන්දියාවේ නිපැයුම් මිලදී ගැනීම අඩු කිරීමට මෙය හේතුසාධක වන්නට ඇත. ස්වරූපයෙන් ලංකා තේවලට ඉතා සමාන සාපේක්ෂ වශයෙන් මිල පහළ වියට්නාමයේ තේ ඉරාක වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ තේවලට පවතින තත්ත්වය සඳහා අඛණ්ඩවම අභියෝගයක් වී ඇත. දේශීය වෙළෙන්දන් මිල වාසි ලබාගැනීම පිණිස ලංකා තේ සමඟ මිශ්‍ර කිරීම සඳහා ඇතැම්විට වියට්නාම තේ ආනයනය කරනු ලැබිය හැකිය.

රටේ අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව උතුරු ඉරාකයේ (කුර්දිස්තාන ප්‍රදේශයේ) ඉහළ ආර්ථික වර්ධනයක් වාර්තා කර තිබේ. උතුරු ඉරාකය හා තුර්කිය අතර වර්ධනය වුණු වෙළඳ සබඳතා දේශසීමා හරහා සිදුවන වෙළඳාම ශක්තිමත් කරනු ලැබ ඇති අතර මෙය තේ වෙළඳාම සඳහාද පිටුවහලක් වී තිබේ. ලංකා තේ විශාල ප්‍රමාණයක් කුර්දිස්තාන ප්‍රදේශය හරහා තුර්කියට සැපයේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලින් හෙළිදරව් වන පරිදි ශ්‍රී ලංකාව විසින් 2013 වර්ෂයේදී තේ මෙ.ටො. 22,267ක් අපනයනය කරනු ලැබ ඇති අතර 2012 වර්ෂයේදී එරටට අපනයනය කරනු ලැබූ තේ ප්‍රමාණය මෙ.ටො. 23,488ට සාපේක්ෂව මෙ.ටො. 1,222 නැතහොත් 5% ක අඩු වීමක් 2013 වර්ෂයේදී සිදු වී ඇත.

ඉරාකය තුළ ශ්‍රී ලංකාවේ තේ අපනයනය පහළ බැසීමට හේතු වූයේ ඉරාක බලධාරීන් විසින් 2013 වර්ෂයේ ආරම්භයේ සිට බොහෝ කාලයක් පුරා ශ්‍රී ලංකාවෙන් යවන ලද තේ බහාලුම් රඳවා තබාගැනීමයි. ගරු කර්මාන්ත සහ වානිජ ඇමති ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ වෙළඳ නියෝජිත කණ්ඩායමක් බැග්ඩෑග් නුවර සිදුකළ සංචාරයත් ඉරාකයේ ආහාර තත්ත්ව පාලන නිලධාරීන්ගේ කොළඹ සංචාරයත් මෙම ගැටළුව විසඳීමට ඉවහල් විය. තත්ත්වයෙන් බාල තේ ශ්‍රී ලංකාවෙන් ඉරාකයට නැව්ගත කිරීම සම්බන්ධයෙන් ඉරාක බලධාරීන් තම කණස්සල්ල පලකළ අතර ඉරාකය සඳහා නැව්ගත කරන තේ තොග සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මැදිහත් වීම ඉරාකියයන්ගේ කණස්සල්ල දුරු කිරීමට ඉවහල් විය. ඉරාකයට තේ අපනයනය කිරීම හා සම්බන්ධ වැදගත් කාරණය වනුයේ බොහොමයක් තේ පෙර ඇසුරුම් ස්වරූපයෙන් නැව්ගත කිරීමයි. තොග වශයෙන් අපනයනය කරනුයේ 5%කටත් වඩා අඩු ප්‍රමාණයකි.

## 2.6.2.4. එක්සත් අරාබි එමිරේට් රාජ්‍යය



කලාපයේ රටක් වන ඩුබායිහි පවතින තේ ප්‍රති අපනයනය කිරීමේ විභවතාවත් තේ මිශ්‍ර කිරීම හා ඇසුරුම් කිරීම සඳහා Jabel Ali නිදහස් කලාපයේ සපයා ඇති පහසුකම් නිසාත් එක්සත් අරාබි එමිරේටය ප්‍රධාන තේ ආනයනකරුවකු බවට පත්ව ඇත. මිලියන අටක් වූ එමිරේට් ජනගහනය වාර්ෂිකව තේ කිලෝ මිලියන 6-7 දක්වා ප්‍රමාණයක් පරිභෝජනය කරන නමුත් ප්‍රති අපනයන වෙළඳාම හේතුකොටගෙන එහි ආනයන ප්‍රමාණය ඊට වඩා දහගුණයකින් ඉහළය. කලාපයේ අනෙකුත් වෙළඳපොලවල් තුළ පැවතුනු දේශපාලන අස්ථාවරතා, තීරු බදු හා තීරු බදු නොවන ගැටළු ආදිය ඩුබායි ප්‍රති අපනයන වෙළඳපොල කෙරෙහි වසර ගණනක් පුරා යහපත් අයුරින් බලපෑවේය. ඉරානය වූ කලී එ.අ.එ. හි ඩුබායි තේ වෙළඳපොළේ විශාලතම ගැනුම්කරු වන අතර සවුදි අරාබිය, රුසියාව, ඉරාකය, පොදුරාජ්‍යයමණ්ඩලීය ස්වාධීන රටවල් සහ අනෙකුත් මැදපෙරදිග රටවල් ප්‍රති අපනයන වෙළඳාමේදී සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා දායකත්වය දක්වයි.

එ.අ. එමිරේට්- ඉරාන ප්‍රති අපනයන වෙළඳාම සම්බන්ධයෙන් ඉරානය වෙත පනවා තිබූ ජාත්‍යන්තර සම්බාධක ඉවත්කිරීම නිසා ඇති වූ බලපෑම නිසා 2013 වර්ෂයේදී එ.අ. එමිරේට් වෙත අපනයනය කළ ශ්‍රී ලංකාවේ තේ ප්‍රමාණය ඉහළ

ගියේය. 2013 වර්ෂයේදී තේ මෙ.ටො. 17,531 ක් අපනයනය කිරීමට මෙරටට හැකි වූ අතර එය 2012 වර්ෂයේදී අපනයනය කරනු ලැබූ තේ මෙ.ටො. 11,887 හා සැසඳීමේදී එය මෙ.ටො. 5,644 ක හෙවත් 47% ක වැඩිවීමකි.

2013 ජුනි මාසයේදී නව ජනාධිපතිවරයා තේරී පත්වීම මෙන්ම ඉරාන න්‍යෂ්ටික ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එළඹුන පිනිවා සම්මුතිය ඉරානයට පමණක් නොව ඉරාන- එ.අ.එ. ප්‍රති අපනයන වෙළඳාම කෙරෙහිද යහපත් අයුරින් බලපෑවේය. ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉරාන රියාල් අගය වැඩිවීම නැතහොත් ස්ථාවරත්වයට පත්වීම එ.අ. එමිරේට් තේ වෙළඳ සාමාජිකයන්ට ඉරානයට වැඩි තේ ප්‍රමාණයක් යැවීම සඳහා මහත් රුකුලක් වූ අතර මෙනිසා 2013 වසරේදී වැඩි තේ ප්‍රමාණයක් එ.අ. එමිරේට් වෙත සැපයීමට ශ්‍රී ලංකාවට හැකිවිය.

### 2.6.2.5. සිරියාව



රජය හා විරුද්ධවාදීන් යන දෙපාර්ශවයටම විදේශ සටන්කරුවන්ගේ සහයෝගය විශාල වශයෙන් ලැබීමත් සමඟ 2013 වර්ෂයේදී සිරියානු රාජ්‍ය විරෝධී අරගලය විශාල පාක්ෂික යුද්ධයක් බවට පත්විය. සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස 2013 වර්ෂයේ අවසානය වන විට මිලියන 7 කට අධික සිරියානු වැසියන් ප්‍රමාණයක් අවතැන් වී තිබූ අතර 120,000කට වැඩි පිරිසක් ඝාතනයට ලක්ව තිබුණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිරියානු පවුමේ නිල හුවමාරු අනුපාතය 2-3 වතාවක් ප්‍රතිශෝධනය විය. 2011 වර්ෂයේදී ඇ.එ.ජ. ඩොලරයට 47.50ක් වූ සිරියානු පවුම 2013 වර්ෂය අවසානය වන විට ඩොලරයට සිරියානු පවුම් 104.0 ක් බවට පත්ව තිබේ. විදේශ මුදල් ඉල්ලුම පූර්ණ ලෙස සපුරාලීමට රජය අපොහොසත් වීම නිසා විවෘත වෙළඳපොල අනුපාතය සි.ප. 200-300 අතර පරාසයක උච්චාවචනය විය.

සියලුම භාණ්ඩ වර්ග අභ්‍යන්තර වශයෙන් බෙදාහැරීමේ කටයුතුවලට සිවිල් යුද්ධය නිසා බලපෑම් එල්ල වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2013 වර්ෂයේදී සිරියානු තේ ආනයනයද පහත වැටුණි. උතුරු සිරියාව හරහා සිදුවන තේ ප්‍රති අපනයනයටද යුද්ධය නිසා විශාල බලපෑමක් එල්ල වී ඇති බව වාර්තා වේ. ජීවන වියදම් පහසු කරලීම මෙන්ම ජනතාවගේ සහයෝගය ලබාගැනීමේ අරමුණ ඇතිව රජය විසින් තේ ද ඇතුළත් මූලික ආහාර ද්‍රව්‍ය සඳහා බොහෝ සහනාධාර ලබාදී තිබුණි.

සිරියානු වෙළඳපොලේ 2/3 ක කොටසකට හිමිකම් කියමින් තේ එරට වඩාම ජනප්‍රිය උණුසුම් පානය බවට පත් වී ඇති අතර කෝපි සහ මේට් (ඖෂධීය පානය) යන පානවර්ග අනතුරුව වෙළඳපොල තුළ ජනප්‍රියය. දේශීය පරිභෝජනය සඳහා මෙන්ම උතුරු දේශසීමා හරහා ඉරානයට සහ තුර්කියට ප්‍රති අපනයනය කිරීම පිණිස සිරියාව තේ ආනයනය කරයි. එරට වාර්ෂික තේ ආනයන ප්‍රමාණය මෙ.ටො. 28,000-30,000 අතර ප්‍රමාණයක් ගනී. එ.ජ. ජාත්‍යන්තර තේ කමිටු සංඛ්‍යාලේඛනවලට අනුව සිරියාව විසින් 2012 වර්ෂයේදී තේ මෙ.ටො. 28,000 ක් ආනයනය කර ඇත.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් තේ මෙ.ටො. 21,059ක් සිරියාවට අපනයනය කොට ඇත. 2012 වර්ෂයේ එම කාලපරිච්ඡේදයේදී එරටට අපනයනය කළ තේ මෙ.ටො.24,741 හා සැසඳීමේ දී 3,683 ක හෙවත් 15% ක අපනයනයේ පහත බැසීමක් එමඟින් පිළිබිඹු කරයි. සිරියාවේ යුධ තත්ත්වය තිව්‍ර වීම නිසා වෙළඳුන්ට නිදහසේ රටතුළ තේ බෙදාහැරීමට නොහැකිවීම, බෙදාහැරීම්වලට අදාළ මුදල් එකතු කිරීමට නොහැකි වීම මෙන්ම ඉරානය සමඟ දේශසීමා හරහා වෙළඳාම් කිරීමට බාධා එල්ල වීම එරට තේ වෙළඳපොල කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේය.

### 2.6.2.6. කුවේටය



කුවේටයේ දේශීය තේ පරිභෝජනය වසරකට මෙ.ටො. 3,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇතත් ඉරානයට තේ සැපයීම සිදු කරන නිසා සෑම විටම තේ වැඩිපුර ප්‍රමාණයක් එරටට ආනයනය කරන ලදී. 2008 සිට කුවේටය ඉරාකයටද තේ සැපයීම ආරම්භ කරන ලද අතර එය සමස්ත ආනයන ප්‍රමාණය වැඩිවීමට හේතු විය. ඉරානය සහ ඉරාකය යන දෙරටම ලංකා තේවලට වැඩි රුචිකත්වයක් දැක්වීම නිසා කුවේටයේ ප්‍රති අපනයන කාර්යයේ ප්‍රධාන තේ සැපයුම්කරු වී ඇත්තේ ශ්‍රී ලංකාවයි. එ.ජ. ජාත්‍යන්තර තේ කමිටුව ඇස්තමේන්තු කර ඇති පරිදි 2008 වර්ෂයේ සිට කුවේටයේ වාර්ෂික සාමාන්‍ය තේ ආනයනය මෙ.ටො. 5,000 සිට 10,000 දක්වා ඉහළ ගොස් ඇත. 2011 වර්ෂයේදී

තේ මෙ.ටො. 8,500 ක් එරට විසින් ආනයනය කර තිබූ අතර 2012 වර්ෂයේදී එම ප්‍රමාණය මෙ.ටො. 7,050 ක් දක්වා පහත බැස තිබුණි.

2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් කුවේටයට අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 16,021 ක් විය. 2012 වර්ෂයේදී එරටට නැව්ගත කරන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 7,402 ක් වීම නිසා 2013 වර්ෂයේදී අපනයනය කරන ලද තේ ප්‍රමාණයේ වැඩිවීම මෙ.ටො. 8,619 හෙවත් 116% කි. ඉරාකය සමඟ ප්‍රති අපනයනය පුළුල් වීම පසුගිය වර්ෂයේ කුවේටය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය වැඩිවීම සඳහා හේතු වන්නට ඇත.

### 2.6.2.7. ජෝර්දානය



ශ්‍රී ලංකා තේ ඉරාකයට අපනයනය කිරීමේදී කාලයක් ජෝර්දානය ඉතා වැදගත් හුවමාරු මධ්‍යස්ථානයක් විය. නමුත් ඉරාකයේ සෘජු ආනයනය වැඩිවීමත් කුවේටය ප්‍රති අපනයන මධ්‍යස්ථානයක් වශයෙන් මතුවීමත් සමඟ ක්‍රම ක්‍රමයෙන් එම තත්ත්වය හීන විය. මෙම කුඩා වෙළඳපොලේ ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ ශ්‍රී ලංකාව (70%), ඊජිප්තුව (15%) හා සෞදි අරාබිය (5%) වන අතර වාර්ෂික වෙළඳාම මෙ.ටො. 5000-6000 අතර වන බවට ඇස්තමේන්තු කර ඇත.

ශ්‍රී ලංකාව විසින් ජෝර්දානය අපනයනය කරනු ලබන තේ ප්‍රමාණය තුළ තවමත් කුවේට වෙළඳපොලට සැපයෙන තේ යම් ප්‍රමාණයක් අඩංගු වේ. නමුත් ඊජිප්තුවෙන් සහ සෞදි අරාබියෙන් ආනයනය කරනු ලබන තේ ප්‍රධාන වශයෙන්ම යොදා ගන්නේ දේශීය පරිභෝජනය සඳහාය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ජෝර්දානයට මෙ.ටො. 7,632 ක් අපනයනය කර ඇති අතර එය 2012 වර්ෂයේදී එරට අපනයනය කර තිබූ තේ මෙ.ටො. 9,434 ට වඩා මෙ.ටො. 1802 කින් හෙවත් 19% කින් වූ අඩුවීමකි. ඉරාකය වෙත කුවේටයේ ප්‍රති අපනයනය වෙළඳාමේ සිදු වූ වර්ධනය ජෝර්දානය වෙත ශ්‍රී ලංකාවෙන් යැවෙන තේ ප්‍රමාණය අඩුවීම සඳහා හේතු වී ඇති බව තරයේ විශ්වාස කෙරේ.

### 2.6.2.8 ලිබියාව



මිලියන හයක පමණ වූ ජනගහණයක් සහිත ලිබියාවේ වාර්ෂික තේ පරිභෝජනය කිලෝ මිලියන 9-10 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. වෙළඳ මූලාශ්‍රවලට අනුව සහනදායී මිලකට ලිබියාවට සැපයෙන තේ සමීප රටවල්වලට විකුණනු ලබන නමුත් දේශසීමා හරහා සිදුකෙරෙන වෙළඳාමේ ප්‍රමාණය කොපමණදැයි හෙළිදරව් වී නොමැත. එය අඩු ආදායම්ලාභී ලිබියානු ජනතාව වෙත අමතර ආදායමක් උපයා දෙන නීතිවිරෝධී ව්‍යාපාරයක් බවට පත් වී ඇත. අවිගත් කණ්ඩායම් සහ රජයේ හමුදාවන් අතර නිරන්තරයෙන් ඇතිවන ගැටුම් හේතුවෙන් රටතුළ ආරක්ෂාව පිළිබඳ බරපතල රික්තකයක් නිර්මාණය වී ඇත. නීතිය හා සාමය පවත්වාගෙන යාමට රජය අපොහොසත් වීම එරටේ ආර්ථික වර්ධන අනුපාතය කෙරෙහිද බලපා ඇත.

ශ්‍රී ලංකාව විසින් 2012 වර්ෂයේදී ලිබියාවට මෙ.ටො. 16,514 ක වාර්තාගත තේ ප්‍රමාණයක් අපනයනය කරන ලද අතර ඇතැම්විට එය ශ්‍රී ලංකාවෙන් ලිබියාව වෙත අපනයනය කරන ලද බවට වාර්තා වී ඇති වැඩිම තේ ප්‍රමාණය විය හැක. කෙසේනමුත් 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ලිබියාව වෙත අපනයනය කිරීමට හැකි වී ඇත්තේ තේ මෙ.ටො. 6,521 ක් පමණ වන අතර එය මෙ.ටො. 9,993 ක හෙවත් 61% ක පහත බැසීමකි. ලිබියාවේ තේ ආනයන රටාව ඉතා අක්‍රමවත් එකක් වන අතර සෑමවිටකම ඉහළ ප්‍රමාණයක් ආනයනය කිරීමෙන් පසුව නැවත ඉතා අඩු ප්‍රමාණයක් ආනයනය කිරීම සිදුවේ.

### 2.6.2.9. සෞදි අරාබිය



ගල්ෆ් ජාතීන් අතර විශාලතම රට සෞදි අරාබිය වන අතර ගල්ෆ් රටවල් හයක් තුළ විශාලතම තේ පරිභෝජනයක් සිදුවන්නේද මෙරට තුළයි. වාර්තාවල සඳහන් වන පරිදි මෙම රාජ්‍ය වසරකට ආසන්න වශයෙන් තේ මෙ.ටො. 30,000 ක් පමණ ආනයනය කරනු ලබන අතර ඉන් මෙ.ටො. 29,000 ක් දේශීය පරිභෝජනය සඳහා තබාගෙන මෙ.ටො. 1000ක් පමණක් ප්‍රති අපනයනය කරයි. ජනතාව අතර වඩාත්ම ජනප්‍රිය පානය වන තේ පරිභෝජනය රටතුළ මෙතරම්

ප්‍රචලිත වීම උදෙසා සමාජීය සහ ආගමික සාධක මහත්සේ බලපා ඇත.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාවලට අනුව ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී තේ මෙ.ටො. 3,520 ක් සෞදි වෙළඳපොලට අපනයනය කර ඇති අතර එය 2012 වර්ෂයේදී එරටට අපනයනය කරන ලද තේ මෙ.ටො. 4,699 ක ප්‍රමාණය හා සංසන්දනය කිරීමේදී මෙ.ටො. 1,179ක හෙවත් 25% ක අඩුවීමකි. සෞදි ගැනුම්කරුවන් මිල සාධකය කෙරෙහි දැඩි අවධානයකින් පසුවන අතර රජය විසින් තේ අපනයනය අඩු කිරීම සඳහා එය හේතුවිය හැකිය.

සෞදි වෙළඳපොලේ තවමත් ලංකා තේ ආනයනය කරනු ලබන තනි විශාලතම ආනයනකරු වන්නේ Rabea තේ සන්නාම හිමිකරු වන එම්/එස් බෙයිශාන් තේ සමාගමයි. සෞදි රජය වෙත වන ලංකා තේ අපනයනයේ විශාල අඩුවීමක් සිදු වී ඇත්තේ තොග බාණ්ඩය තුළය.

## 2.6.2.10. ඊජිප්තුව



හමුදා සහායලත් අන්තර් ආණ්ඩුව විසින් ඡන්ද බලයෙන් තේරී පත්වුන ජනාධිපති මොහොමඩ් මුරුසිගෙන් බලය අත්පත්කරගත් පසුව ඇති වූ දේශපාලන වියවුල ඊජිප්තුව නැවත වරක් අස්ථාවර රටක් බවට පත්වීමට හේතුවිය. එම තත්ත්වය විදේශ ආයෝජනය, සංචාරක ව්‍යාපාරය ආදිය ඇතුළත් ආර්ථිකයට බලපෑමක් එල්ල කළ නමුදු සාපේක්ෂ වශයෙන් තේ ක්ෂේත්‍රයට අවහිරයක් ඇති නොවුණි.

ඊජිප්තුව අරාබි ලෝකයේ විශාලතම තේ වෙළඳපොලයි. තේ එරට වඩාත් ජනප්‍රිය උණුසුම් පානය වන අතර ඇස්තමේන්තුගත වාර්ෂික තේ පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 90-95 ක් අතර වේ. පසුගිය දශක තුනක කාලපරිච්ඡේදය තුළ තේ සඳහා වන පාරිභෝගික රුචිය සාම්ප්‍රදායික තේවල සිට සී.ටී.සී. තේවලට මාරු වී ඇති අතර කෙන්යාව ප්‍රමුඛ තේ නිපදවන අප්‍රිකානු රටවල් ඊජිප්තුවේ ප්‍රධාන තේ සැපයුම්කරුවන් වේ. සාපේක්ෂ මිල වාසිය මෙන්ම තද පැහැති තේ සඳහා වන අභිරුචිය ඊජිප්තු තේ වෙළඳපොලේ සාම්ප්‍රදායික තේ සැපයුම්කරුවන් අභිබවා සී.ටී.සී. තේ නිපැයුම්කරුවන්ට විශාල වාසි සහගත තත්ත්වයක් ඇති වීම සඳහා ඉවහල් වී ඇත.

කෙන්යාවෙන් අනතුරුව ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව සහ චීනය ඊජිප්තුවේ ප්‍රධාන තේ සැපයුම්කරුවෝ වෙති. 1998 දී ඊජිප්තුව සමඟ එළඹුනු නිදහස් වෙළඳ ගිවිසුම හරහා ඊජිප්තුව වෙළඳපොල තුළ තහවුරු කරගත් 90%ක සුවිශේෂී කොටස් කෙන්යාව සතුව පවතී.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ඊජිප්තු වෙළඳපොලට අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 2,017 කි. 2012 වර්ෂයේදී එරටට අපනයනය කරන ලද තේ මෙ.ටො. 3,800 හා සැසඳීමේදී එමඟින් මෙ.ටො. 1,783 ක හෙවත් 47%ක අඩුවීමක් පෙන්නුම් කරයි. කොළඹ වෙන්දේසියේ තේ මිල ඉහළ යාම ඊජිප්තුවට ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම පහත බැසීම සඳහා බලපා ඇත. තවද කෙන්යාවේ තේ මිල අඩු කිරීම 2013 වර්ෂයේ සිට කෙන්යාවෙන් වැඩි තේ ප්‍රමාණයක් ආනයනය කිරීමට ඊජිප්තු වෙළඳ සාමාජිකයන් දිරිගැන්වීමට හේතු විය.

## 2.6.2.11. ලෙබනනය

ලෙබනනය මුල්කොටගත් හිස්බුල්ලා සංවිධානය සිරියානු සිවිල් යුද්ධයට සම්බන්ධ වීම නිසා ලෙබනනයේ ආරක්ෂක වාතාවරණය පිරිහුනි. කෙසේනමුත් සිරියානු වෙළඳ සාමාජිකයන් විසින් සෘජු ආනයනයට බාධා එල්ල කිරීම නිසා ලෙබනනය විසින් සිරියාව තුළ සිදු කරන ප්‍රති අපනයනය වර්ධනය වී ඇත.



ලෙබනනය වූ කලී ප්‍රධාන වශයෙන්ම කෝපි පානය කරන රටක් වන අතර කෝපි හා තේ අතර පරිභෝජන අනුපාතය 80:20 ආසන්න ප්‍රමාණයක පවතී. ලෙබනනයේ රේගු දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව ලෙබනනය විසින් වාර්ෂිකව තේ මෙ.ටො. 2,600-2,700 අතර ප්‍රමාණයක් ආනයනය කරනු ලබන අතර ඉන් 10% ක ප්‍රමාණයක් සමීප රටවල් වෙත ප්‍රති අපනයනය කරනු ලැබේ.

ලෙබනන් කුඩා වෙළඳපොලේ ප්‍රධාන තේ සැපයුම්කරු වන ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදීද එම තත්ත්වය රැකගැනීමට සමත් විය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් තේ මෙ.ටො. 2,816 ක් ලෙබනනයට අපනයනය කොට ඇති අතර 2012 වර්ෂයේ එම කාලපරිච්ඡේදයේදී එරටට අපනයනයකර තිබූ තේ ප්‍රමාණය මෙ.ටො. 2,157 ක්

වී තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2013 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් ලෙබනනයට අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 659 කින් හෙවත් 31% කින් ඉහළ ගොස් තිබුණි.

තේ බෑග් අංශයේ සිදුවූ වර්ධනය ඊජිප්තුවට ලෙබනනය වෙළඳපොල තුළ තම කොටස වැඩි කරගැනීමට අවකාශ සලසා දී තිබේ. ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවල පිහිටි යුනිලිවර් තේ සමාගමේ තේ ඇසුරුම් යන්ත්‍රයෙන් අසුරන ලද ලිප්ටන් සන්නම් නාමය සහිත තේ අපනයනය කිරීම නිසා ඊජිප්තුව ලෙබනන් තේ වෙළඳපොල තුළ ඉතා වැදගත් ස්ථානයක් හිමිකරගෙන ඇත.

## 2.6.3 ඈත පෙරදිග / සමුද්‍රීය කලාප

වගුව : 2.19 ඈත පෙරදිග / සමුද්‍රීය කලාපය වෙත ලංකා තේ අපනයනය කිරීම පිළිබඳ රටවල් අනුව සංසන්දනය

| රට | 2013 ප්‍රමාණය | 2012 | ප්‍රමාණයේ වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| ජපානය | 8,821,344 | 9,545,484 | (724,140) | (7.59) |
| හොංකොං | 4,919,900 | 4,389,930 | 529,970 | 12.07 |
| චීනය | 4,145,924 | 3,084,433 | 1,061,491 | 34.41 |
| ඕස්ට්‍රේලියාව | 2,647,996 | 2,739,152 | (91,156) | (3.33) |
| තායිවානය | 2,151,676 | 1,935,516 | 216,160 | 11.17 |
| නවසීලන්තය | 962,351 | 917,236 | 45,115 | 4.92 |
| මලයාසියාව | 721,004 | 739,299 | (18,295) | (2.47) |
| සිංගප්පූරුව | 565,259 | 602,145 | (36,886) | (6.13) |
| ෆීජි දූපත් | 315,247 | 360,695 | (45,448) | (12.60) |
| ඉන්දුනීසියාව | 139,955 | 322,750 | (182,795) | (56.64) |
| දකුණු කොරියාව | 108,413 | 64,928 | 43,485 | 66.97 |
| තායිලන්තය | 106,969 | 181,028 | (74,059) | (40.91) |
| මොංගෝලියාව | 99,245 | 109,856 | (10,611) | (9.66) |
| වියට්නාමය | 69,985 | 69,626 | 359 | 0.52 |
| පිලිපීන දූපත් | 46,627 | 64,415 | (17,788) | (27.61) |
| එකතුව | 25,821,895 | 25,126,493 | 695,402 | 2.77 |

### 2.6.3.1. ඕස්ට්‍රේලියාව



ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන තේ පරිභෝජනය කලු තේ වන අතර තවමත් ඉතා සුළුවශයෙන් පවතින හරිත තේ අංශයේද සාධනීය වර්ධනයක් (ආසන්න වශයෙන් 3%ක) පෙන්නුම් කර ඇත. 2013 වර්ෂයේ ඕස්ට්‍රේලියාවේ තේ ආනයනය මෙ.ටො. 11,800 ක් වන බවට සඳහන් වන අතර 2012 වර්ෂයේදී එරට ආනයනික තේ ප්‍රමාණය වූ තේ මෙ.ටො. 11,400 ට සාපේක්ෂව 3.5% ක වර්ධනයක් 2013 වර්ෂයේදී පෙන්නුම් කරයි. ප්‍රධාන සැපයුම්කරු වශයෙන් ඉන්දියාව විසින් ඕස්ට්‍රේලියාවට 28.8%ක පමණ කේ සැපයුමක් සිදු කරන අතර අනතුරුව ශ්‍රී ලංකාව එරටේ තේ සැපයුමෙන් 22%ක්, ඉන්දුනීසියාව 16% ක් හා චීනය 14% ක් සඳහා 2012/13 කාලය තුළ දායකත්වය දරා තිබුණි. ප්‍රමාණය අනුව බලන කළ වෙළඳපොල තුළ 86%ක් කලු තේද, 6% ඖෂධීය තේ ද, 6% ක් හරිත තේද විය. 2002 වසරේදී මුළු වියුක්ත වෙළඳ ප්‍රමාණය 10% ක්ව සිට 2012 වර්ෂයේදී 12% ක් දක්වා එය වර්ධනය කරගනිමින් පසුගිය දශකයක කාලය තුළ සම්මත කලු තේ කොටසින් යම් ප්‍රමාණයක් විශේෂිත කලු තේ අත්පත් කරගෙන ඇත.

වටිනාකම අතින් ගත්කළ ලිප්ටන් සහ බුෂ්ශෙල් යන සන්නම් දෙක සහිතව යුනිලිවර් සමාගම වෙළඳපොල තුළ 31% ක කොටසක් හිමි කරගෙන සිටින අතර අනතුරුව ට්විනිස් (20%) ක්, ඩිල්මා (12.5%) ක්, ටෙට්ලි (8.5%) ක්, නෙරදා (4.8%) ක් සහ මුදුරා (4.4%) ක් වෙළඳපොල තුළ හිමි කරගෙන සිටී. විශේෂිත කලු තේ, හරිත තේ සහ පලතුරු/ ඖෂධීය තේ සඳහා වන ඉල්ලුම වර්ධනය වෙමින් පවතී. ශ්‍රී ලංකාව විසින් 2013 වර්ෂයේදී තේ මෙ.ටො. 2,641 ක් ඕස්ට්‍රේලියාවට අපනයනය කරන ලද අතර 2012 වර්ෂයේදී අපනයනය කරන ලද ප්‍රමාණය මෙ.ටො.2,706 ක් වී තිබුණි. ඕස්ට්‍රේලියාව වෙත ලංකා තේ අපනයනය කිරීම 2012 වර්ෂයේ මෙ.ටො. 2706 ක සිට 2013 දී මෙ.ටො. 2,641 ක් දක්වා පහත වැටී තිබුණ අතර එය 2.5% ක අඩුවීමකි. ඕස්ට්‍රේලියාවට අපනයනය කරන ලද මුළු තේ ප්‍රමාණයෙන් 86% ක් අගය එකතු කළ සංරචකයන්ගෙන් (තේ බෑග් - 69% ක් හා තේ ඇසුරුම් 17%) යුක්ත විය.

## 2.6.3.2. චීනය



ගෝලීය සැපයුම සඳහා 38% ක ප්‍රමාණයක දායකත්වයක් දක්වමින් විශාලතම තේ නිෂ්පාදකයා වශයෙන් චීනය 2013 වර්ෂයේදී තේ කිලෝ බිලියන 1.8 ක නිෂ්පාදන මට්ටමක් කරා ළඟා වී තිබේ.

සමස්ත තේ නිෂ්පාදනයෙන් ආසන්න වශයෙන් 77% ක් හරිත තේවලින් සමන්විත විය. ලෝක වෙළඳ සංගමයට ඇතුළත් වීමෙන් පසු සහ ආනයනය මත වන තීරු බදු ක්‍රමයෙන් අඩුවීමට පටන්ගත් පසු පසුගිය අවුරුදු කිහිපයක සිට දේශීය පරිභෝජනය සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කරන කලු තේ සෘජු ආනයනය ඉතා පහළ මට්ටමක සිට සාධනීය ලෙස වර්ධනය වෙමින් පවතී. 2013 වර්ෂයේදී චීනයේ සමස්ත තේ ආනයනය මෙ.ටො. 14,000 ක් බවට වාර්තා වුන අතර 2012 වර්ෂයේදී එම ප්‍රමාණය මෙ.ටො. 11,000 ක්වී තිබුණි. එහිදී 2012 වර්ෂයට සාපේක්ෂව 27% ක වර්ධනයක් 2013 වර්ෂයේදී පෙන්නුම් කර තිබේ.

ශ්‍රී ලංකාව විසින් චීනයට අපනයනය කරන ලද තේ ප්‍රමාණය 2013 වර්ෂයේදී මෙ.ටො. 4,485 ක්වූ අතර 2012 වර්ෂයේදී අදාළ කාලපරිච්ඡේදය තුළ අපනයනය කරන ලද ප්‍රමාණය මෙ.ටො. 3,084 ක් වීම නිසා 2013 වර්ෂයේ තේ අපනයනයේ 45% ක විශාල වර්ධනයක් ඇති වී තිබේ.

## 2.6.3.3. ජපානය



ජපානය වූ කලී නිසැකයෙන්ම ලෝකයේ තිබෙන වඩාත්ම විචක්ෂණශීලී වෙළඳපොල ලෙස සලකනු ලැබේ. ඕනෑම තේ කර්මාන්තයක අත්‍යන්ත ඉලක්කය වශයෙන් මෙම ජපාන වෙළඳපොලට අනෙකුත් තේ නිපදවන රටවල් අතර නිසැකවම තරඟකාරීත්වයක් ඇති කිරීමට හැකියාව ඇත.

ජපානය වූ කලී ටොන් 130,000 -135,000 කරම් වාර්ෂික තේ පරිභෝජනයකින් යුක්තව චීනය, ඉන්දියාව, රුසියාව, පකිස්තානය හා තුර්කියට පසු ගෝලීය තේ කරලියේ ප්‍රමුඛයා වේ. හරිත තේ පරිභෝජනය ජපාන වෙළඳපොලේ 70% ක පමණ ආධිපත්‍ය පතුරුවා සිටින අතර කලු තේ සඳහා වන ඉල්ලුම සෙමින් නමුත් ශක්තිමත්ව වර්ධනය වෙමින් පවතී. නමුත් "ඕලොන්" තේ සඳහා වන ඉල්ලුම පහත බැසීමේ ප්‍රවණතාවක් පිළිබිඹු වේ.

ජපානය වූ කලී හරිත තේ, කලු තේ, ඕලෝන් සහ බාර්ලි වැනි අනෙකුත් වර්ගවල තේවලට අමතරව වාර්ෂිකව කිලෝ මිලියන 1.5 සිට 2.00 දක්වා ප්‍රමාණයක ක්ෂණික තේ පරිභෝජනයකින් යුත් අද්විතීය වෙළඳපොලක් බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

කෙසේවෙතත් පසුගිය දශක දෙකක කාලය තුළ කලු තේ සඳහා වන ඉල්ලුම දැඩිව ඉහළ ගිය අතර ප්‍රමාණයෙන් එය 30% ක පමණ වූ සුවිශේෂිත වර්ධනයකි. 60% ක පමණ ශක්තිමත් වෙළඳපොල කොටසකට හිමිකම් කියමින් ශ්‍රී ලංකාව කලු තේ බාණ්ඩයෙන් ජපාන වෙළඳපොලේ ආධිපත්‍ය අඛණ්ඩව පතුරුවනු ලබයි. ශ්‍රී ලංකාව 2013 දී තේ මෙ.ටො. 8,822 ක් ජපානයට අපනයනය කර ඇති අතර 2012 වර්ෂයේදී 2012 වර්ෂයේදී අපනයන කරන ලද ප්‍රමාණය මෙ.ටො. 9545 ක්වී තිබුණි. මෙය 2013 දී ප්‍රමාණයෙන් 7.5% ක අඩුවීමකි.

## 2.6.3.4. හොංකොං



එක් පසෙකින් දීර්ඝකාලීනව මුල් බැසගත් බ්‍රිතාන්‍ය බලපෑමත් තවත් පසෙකින් ප්‍රධාන දිවයින වන චීනයේ හරිත/ පියර් තේ සංස්කෘතිය නිසාත් හොංකොං රාජ්‍ය අද්විතීය තේ සංස්කෘතියක් විදහා දක්වමින් සිටී. කෙසේවෙතත් සෑම වසරකම පාහේ හොංකොං වෙත පැමිණෙන මිලියන 30 ක් පමණ වූ සංචාරකයින් හා අමුත්තන් නිසා එරට වැසියන් මෙම තේ සංස්කෘතියට අනුගත වීම තරමක් අඩු මට්ටමක වේ.

2012 වර්ෂයේදී හොංකොං වෙළඳපොලේ 36% ක කොටස් සහිතව ශ්‍රී ලංකාව එම වෙළඳපොලේ ආධිපත්‍ය පතුරුවාලීය. හොංකොං රටට අපනයනය කරනු ලබන මුළු තේ අපනයන ප්‍රමාණයේ සුළු උච්චාවචනයක් පෙන්නුම් කරනු ලැබුවද පසුගිය දශකය තුළ එම අපනයනය ටොන් 9,000 සිට 12,000 ප්‍රමාණයක විය.

2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් හොංකොං රටට අපනයනය කරන ලද තේ ප්‍රමාණය තේ මෙ.ටො. 4,390 ක් වූ අතර එය 2013 වර්ෂයේදී මෙ.ටො. 4,920 කි. හොංකොං රටට අපනයනය කරනු ලබන අගය එකතුකළ ලංකා තේ සංරචකයේ ප්‍රමාණය 21% කි.

## 2.6.3.5. තායිවානය



බොහෝවිට ලෝකයේ හොඳම "ඕලොන්" තේ ලෙස සලකනු ලැබිය හැකි උසස් තත්ත්වයේ "ඕලොන්" තේ වැඩි ප්‍රමාණයක් නිපදවනු ලබන තායිවානයේ වර්තමාන තේ නිෂ්පාදනය මෙ.ටො. 15,000 කට පමණ සීමා වී තිබේ.

තායිවානයේ වාර්ෂික තේ ආනයනය මෙ.ටො. 25,000-30,000 ප්‍රමාණයක වේ. සංඛ්‍යාදත්තවලට අනුව 2012 වර්ෂයේදී තායිවානය විසින් සියලුම සම්භවවල හරිත තේ මෙ.ටො. 9,400 ක් එරටට ආනයනය කර ඇත. තේ අපනයනයේ 74% ක හිමිකාරිත්වයක් සහිතව වියට්නාමය තේ සැපයුමේ ප්‍රමුඛයා බවට පත්වී සිටින අතර අනතුරුව චීනය හා ශ්‍රී ලංකාව පිළිවෙලින් 13% ක හා 7% ක සැපයුම් සිදුකරයි. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් තායිවානයට තේ මෙ.ටො. 1935 ක් අපනයනය කර තිබූ අතර 2013 වර්ෂයේදී පූර්ව වර්ෂයට වඩා 11%ක අපනයන වර්ධනයක් පෙන්නුම් කරමින් තේ මෙ.ටො. 2152 ක් එරටට අපනයනය කර ඇත.

## 2.6.4. යුරෝපීය කලාපය

වගුව 2.20 යුරෝපීය කලාපය වෙත ලංකා තේ අපනයනය පිළිබඳ රටවල් අනුව සංසන්දනය (2012/2013)

| රට | 2013 (කි.ග්‍රෑ.) | 2012 (කි.ග්‍රෑ.) | වෙනස | වර්ධනය % |
|---|---|---|---|---|
| ජර්මනිය | 6,557,405 | 5,629,940 | 927,465 | 16.47 |
| පෝලන්තය | 2,778,007 | 2,411,608 | 366,399 | 15.19 |
| බෙල්ජියම | 2,428,270 | 2,403,312 | 24,958 | 1.04 |
| නෙදර්ලන්තය (හොලන්ඩ්) | 2,252,619 | 2,055,075 | 197,544 | 9.61 |
| අයර්ලන්තය | 1,909,865 | 1,468,759 | 441,106 | 30.03 |
| ඊශ්‍රායලය | 1,481,396 | 1,408,051 | 73,345 | 5.21 |
| ඉතාලිය | 1,376,433 | 1,774,990 | (398,557) | (22.45) |
| පින්ලන්තය | 1,239,873 | 987,450 | 252,423 | 25.56 |
| ප්‍රංශය | 869,906 | 955,273 | (85,367) | (8.94) |
| එක්සත් රාජධානිය | 833,422 | 1,692,942 | (859,520) | (50.77) |

## 2.6.4.1. එක්සත් රාජධානිය



මිලියන 62.6 ක ජනගහනයකින් යුතු එක්සත් රාජධානිය ලොව දෙවැනි විශාලතම තේ පරිභෝජකයා වේ. එක්සත් රාජධානිය 2012 වර්ෂයේදී මුළු ආනයන වෙළඳපොලේ ආනයන ප්‍රතිශතයක් සහිතව යුරෝපීය තේ ආනයනයේ විශාලතම ආනයනකරුවා විය. ජා.තේ.ක. සංඛ්‍යාලේඛනවලට අනුව එක්සත් රාජධානිය 2012 වර්ෂයේදී තේ මෙ.ටො. 144,575 ක් ආනයනය කර තිබූ අතර එය පූර්ව වර්ෂයේ ආනයනය කර තිබූ තේ මෙ.ටො. 154,500 ට සාපේක්ෂව බලන කළ 6% ක පමණ ආන්තික අඩුවීමකි. එක්සත් රාජධානියේ පාරිභෝගිකයන් කලු තේ පානය කරන්නන් වේ. එරට මුළු තේ ආනයනයෙන් 97% ක් කලු තේ වන අතර 3% ක් පමණක් හරිත තේ වේ.

එක්සත් රාජධානි තේ වෙළඳපොලේ ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ තේ වගා කරන රටවල් වන අතර තේ මෙ.ටො. 61,180 ක (42.3%) සැපයුමක් සිදු කරමින් කෙන්යාව 2012 වසරේ ප්‍රමුඛ සැපයුම්කරුවා විය. අනතුරුව ඉන්දියාව මෙ.ටො. 30.696 (21.2%) ක, ඉන්දුනීසියාව මෙ.ටො. 16,562 (11%) ක සහ මලාවි මෙ.ටො. 8,068 (5.6%) ක සැපයුමක් සිදු කර තිබුණි. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව තේ මෙ.ටො. 2,302 ක් එක්සත් රාජධානියට අපනයනය කර ඇති අතර එමඟින් 2.2% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

යුරෝපයේ සමස්ත තේ අපනයනයෙන් 40% ක ප්‍රමාණයක අපනයන දායකත්වයක් සපයමින් එක්සත් රාජධානියට යුරෝපයේ ප්‍රධාන තේ අපනයනකරුවා වී සිටී. 2012 වර්ෂයේදී එහි ප්‍රති අපනයනය තේ මෙ.ටො. 21,288 ක් විය. එක්සත් රාජධානියේ ප්‍රධාන අපනයන ගමනාන්ත වනුයේ කැනඩාව, ඇ.එ.ජ. , අයර්ලන්තය, බෙල්ජියම සහ ප්‍රංශයයි. පසුගිය වසර හතක කාලය තුළ ශ්‍රී ලංකා තේ අපනයනයේ උච්චාවචනයන් පෙන්නුම් කරනු ලැබීය. ශ්‍රී ලංකා රේගුවේ තොරතුරුවලට අනුව 2012 වර්ෂයේදී ලංකා තේ අපනයනය මෙ.ටො. 1692 ක් වූ අතර එහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන 1130 ක් පමණ වේ. රුපියල් මිලියන 881 ක වටිනාකමින් යුත් ලංකා තේ මෙ.ටො. 855 ක ප්‍රමාණයක් 2013 වර්ෂයේදී එක්සත් ජනපදයට අපනයනය කරන ලද අතර ඉන් 66% ක් තේ තොග වශයෙන්ද 13.8% ක් තේ ඇසුරුම් වශයෙන්ද 14% ක් තේ බෑග් වශයෙන්ද අපනයනය කරන ලදි.

### 2.6.4.2. පෝලන්තය



මිලියන 38 ක පමණ ජනගහනයකින් යුත් පෝලන්තය යුරෝපයේ තෙවැනි විශාලතම තේ පාරිභෝගිකයා වේ. එරට වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 34,000 ක් පමණ වන බවට ඇස්තමේන්තු කොට ඇති අතර ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 1.1 කි. (ජා.තේ.ක.). 2012 වර්ෂයේදි සමස්ත තේ ආනයනයෙන් 26.5% කට හිමිකම් කියනු ලැබූ පෝලන්තය යුරෝපයේ විශාල තේ ආනයනකරුවෙකි. ජා.තේ.ක. සංඛ්‍යාලේඛනවලට අනුව පෝලන්තය 2012 වර්ෂයේදි තේ මෙ.ටො. 29,483 ක් ආනයනය කර ඇති අතර ඊට පෙර වර්ෂයේ ආනයනය කර තිබූ තේ මෙ.ටො.33,978 හා සැසඳීමේදි එමඟින් පෙර වර්ෂයේ ආනයනයට වඩා 12% ක පහත බැසීමක් පිළිබිඹු කරයි. පෝලන්ත ජාතිකයෝ කළු තේ පානය කරන්නන් වන අතර ආනයනය කරනු ලබන තේ ප්‍රමාණයෙන් 84% ක් කළු තේද 16% ක් හරිත තේද වේ. කළු තේ වෙළඳපොළ කෙන්යාවෙන් සහ ඉන්දියාවෙන් ආනයනය කරන සී.ටී.සී. බාණ්ඩයේ තේවලින්, සාම්ප්‍රදායික ඕ.පී.එ, එෆ්.බී.ඕ.පී සහ බී.ඕ.පී. පුනු බාණ්ඩයේ තේවලින් සහ පලතුරු, ඖෂධීය සහ රසගැන්වූ තේ බෑග මිශ්‍රණයන්ගෙන් සමන්විත වේ.

තේ වවන රටවල් පෝලන්ත තේ වෙළඳපොළේ ප්‍රධාන සැපයුම්කරුවන් වන අතර තේ මෙ.ටො. 4,233 (14%) ක් සපයමින් කෙන්යාව ප්‍රධාන සැපයුම්කරු වශයෙන්ද අනතුරුව වියට්නාමය මෙ.ටො. 3509, ඉන්දියාව මෙ.ටො. 3,474 (12%), ඉන්දුනීසියාව මෙ.ටො. 3,201, ජර්මනිය මෙ.ටො. 2,670 (9%) ක් සහ චීනය මෙ.ටො. 2,241 (8%) ක් සහ ශ්‍රී ලංකාව මෙ.ටො. 2,295 ක් සැපයීමක් සිදුකරමින් 2012 වර්ෂයේ එරට තේ සැපයුම්කරුවෝ වූහ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අනුව 2012 වර්ෂයේදි ශ්‍රී ලංකා සෘජු අපනයනය ලංකා තේ කිලෝ මෙ.ටො. 2,412 ක් වන අතර එහි වටිනාකම රුපියල් මිලියන 1,620 කි. රුපියල් මිලියන 2,032 ක් වටිනා ලංකා තේ මෙ.ටො. 2,778 ක ප්‍රමාණයක් 2013 වර්ෂයේදි අපනයනය කරන ලද අතර එහිදි 58%ක් තේ තොග වශයෙන්ද, 8% ක් ඇසුරුම් වශයෙන්ද, 33% ක් තේ බෑග් වශයෙන්ද, 1% ක් හරිත තේ ලෙසද අපනයනය කර තිබුණි. 2012 වර්ෂයට වඩා ප්‍රමාණයේ 15% ක හා වටිනාකමේ 25% ක වර්ධනයක් එමඟින් පෙන්නුම් කෙරිනි. පෝලන්තය ලංකා තේ බෑග් සඳහා වන තුන්වන විශාලතම වෙළඳපොළ ලෙස සලකනු ලබන අතර රුසියානු සමූහාණ්ඩුව සහ ඔස්ට්‍රේලියාව ශ්‍රී ලංකාවේ අගය එකතුකළ තේ සඳහා වන වැදගත් වෙළඳපොලක් ලෙස හඳුනාගත යුතුය.

### 2.6.4.3. ජර්මනිය



ජර්මනිය යුරෝපීය සංගමයේ දෙවන විශාලතම තේ ආනයනකරු වන නමුත් පරිභෝජනය අතින් බැලූ කළ එය එක්සත්රාජධානියට හා පෝලන්තයට වඩා පසුපසින් සිටී. ජර්මනිය 2012 වර්ෂයේ දි තේ මෙ.ටො. 55,985 ක් ආනයනය කර තිබුණි. එක්සත් රාජධානියට පසු යුරෝපයේ දෙවන විශාලතම තේ ප්‍රති අපනයනකරු වන ජර්මනිය 2012 වර්ෂයේදි දේශිය පරිභෝජනය සඳහා ආනයනය කරන ලද මෙ.ටො. 29,836 ක සමස්ත ආනයන ප්‍රමාණයෙන් 47% ක් (මෙ.ටො. 26,149) ක් ප්‍රති අපනයනය කරන ලදි.

2006 දි මෙ.ටො.46,601 ක් වූ ජර්මනියේ මුළු තේ ආනයනය 2012 වර්ෂයේදි මෙ.ටො. 55,985 ක් දක්වා වර්ධනය වී තිබූ අතර එය වසර හතක කාලයක් පුරා මෙ.ටො. 9,384 ක හෙවත් 20% කින් වූ වර්ධනයකි. ජර්මනියේ තේ ආනයනයෙන් 19% (මෙ.ටො. 10,717) ක් චීනය විසින් සපයනු ලබන අතර අනතුරුව 14% ක් ඉන්දියාව, 14% ක් ලංකාව සහ 9% ක් ඉන්දුනීසියාව යන රටවල් විසින් සපයනු ලබයි. 2006 වර්ෂයේදි මෙ.ටො. 25,303 ක් වූ ජර්මනියේ තේ ප්‍රති අපනයනය 2012 වර්ෂය වනවිට මෙ.ටො. 26,149 ක් දක්වා වූ ආන්තික වර්ධනයක් අත්කරගෙන තිබුණි. ප්‍රමාණය අතින් ගත්කළ එය මෙ.ටො.846 ක හෙවත් 3.3% ක වර්ධනයකි. සමස්ත ආනයන ප්‍රමාණයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් ජර්මනිය ප්‍රති අපනයනය කරයි. ජර්මනියේ ප්‍රති අපනයනයේ ප්‍රධාන අපනයනානන්තය වන ඇ.එ.ජ. ප්‍රති අපනයනයෙන් 19.8% ප්‍රතිශතයක් දරන අතර අනතුරුව ප්‍රංශය (12%), පෝලන්තය (8.4%), එ.රා. (8.3%) සහ නෙදර්ලන්තය (7.4%) ක ප්‍රතිශතයකට හිමිකම් කියයි.

ශ්‍රී ලංකාව ජර්මනියේ සාම්ප්‍රදායික කළු තේ සැපයුම්කරුවා වේ. ශ්‍රී ලංකාව වැඩිපුර ප්‍රමාණයක් තේ තොග වශයෙන් එරටට අපනයනය කරන අතර එකතුකළ අගය මත අපනයනය කරනු ලබන ප්‍රමාණය 29% ක් වේ. ශ්‍රී ලංකාව 2012 වර්ෂයේදි තේ මෙ.ටො. 6,475 ක් ජර්මනියට

අපනයනය කරන ලදි. එහිදී ජර්මනිය ශ්‍රී ලංකාවේ 14 වැනි විශාලතම තේ අපනයනාන්තය වූ අතර පූර්ව වර්ෂයට වඩා 16%ක ලංකා තේ අපනයන වර්ධනයක් ඇතිවී තිබුණි.

## 2.6.4.4.ප්‍රංශය



වෙළඳපොල 5.9% කට හිමිකම් කියන ප්‍රංශය යුරෝපීය සංගමයේ එක්සත් රාජධානිය, පෝලන්තය සහ ජර්මනියට අනතුරුව සිටින හතරවැනි විශාලතම තේ ආනයනකරුවා වේ. 2008-2012 කාලපරිච්ඡේදය තුළ එරට තේ ආනයනය මෙ.ටො. 18,687 සිට 17,835 අතර පරාසයක උච්චාවචනය විය. 2008 දී ආනයනය කළ තේ මෙ.ටො. 18,687 ට සාපේක්ෂව 2012 වර්ෂයේදී ආනයනය කරන ලද ප්‍රමාණය මෙ.ටො. 17,835 ක් වීම නිසා ආනයන ප්‍රමාණයේ 4% ක පිරිහීමක් පෙන්නුම් කරනු ලබයි. වෙළඳපොලේ 36%ක සැපයුමක් සිදුකරන චීනය එරට ප්‍රධාන තේ සැපයුම්කරුවා වන අතර අනතුරුව බෙල්ජියම 10.5%, ජර්මනිය 9% ක් හා ශ්‍රී ලංකාව 7.4% ක සැපයුමක් සිදු කරනු ලබයි. ප්‍රංශය විසින් ආනයනය කරනු ලබන තේ ප්‍රමාණයෙන් 20% ක් පමණ ප්‍රති අපනයනය කරන අතර ඉතිරිය දේශීය පරිභෝජනය සඳහා තබාගනී.

වෙළඳපොල තුළ සමස්ත ආනයනයෙන් 51% ක් හෙවත් මෙ.ටො. 9,064 ක් කලු තේ වලින් සමන්විත වන අතර 49% ක් හෙවත් මෙ.ටො.8771 ක් හරිත තේවලින් සමන්විත වේ. ප්‍රංශයට ආනයනය කරනු ලබන තේවලින් 70% ක් පෙර ඇසුරුම් ස්වරූපයෙන් ආනයනය කරනු ලබන අතර 30%ක් පමණක් තොග වශයෙන් ආනයනය කෙරේ. චීනය එරට විශාලතම කලු තේ සැපයුම්කරු වන අතර 17.5% ක තේ සැපයුමක් සිදු කරයි. අනතුරුව බෙල්ජියම 15.6%, ශ්‍රී ලංකාව 14.6%, ජර්මනිය 10.3% හා එක්සත් රාජධානිය 6.5% ක සැපයුමක් සිදු කරයි. හරිත තේ සැපයුමේ ප්‍රමුඛයා ද වන චීනය සැපයුමෙන් 55% කට හිමිකම් කියන අතර අනතුරුව ජර්මනිය 9% ක හා බෙල්ජියම 5.2%ක සැපයුමක් සිදු කරයි.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අනුව ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී තේ මෙ.ටො. 817ක් එරටට අපනයනය කර ඇති අතර 2012 වර්ෂයේදී තේ මෙ.ටො. 881 ක් අපනයනය කර තිබුණි. බෙල්ජියම, එ.රා. හා ජර්මනියෙන් එරටට එන තේ තුළ සැහෙන කරම් ප්‍රමාණයක් ලංකා තේ අඩංගු වන නිසා ප්‍රංශ වෙළඳපොල තුළ ලංකාවේ තේවලට හිමි ඉඩකඩ ඉහළ යා හැකිය.

## 2.6.4.5. නෙදර්ලන්තය



2008-2012 කාල පරිච්ඡේදනය තුළ දී රටතුළ තේ ආනයනය මෙ.ටො. 25,000-30,000 අතර ප්‍රමාණයක උච්චාවචනය විය. කලු තේ එරට සමස්ත තේ ආනයනය ප්‍රමාණයෙන් 93% ක් තරම් විශාල වෙළඳපොල කොටසකට හිමිකම් කියයි.

මලාවි එරට විශාලතම තේ සැපයුම්කරු වන අතර 83.3% ක තේ සැපයුමක් සිදු කරයි. අනතුරුව ආජන්ටිනාව (14.6%), ඉන්දුනීසියාව (10.9%), ඉරානය (9.5%), චීනය (8.8%), ඉන්දියාව (7.3%) හා ශ්‍රී ලංකාව (7.2%)ක සැපයුමක් සිදුකරයි. එරට වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 7,000-8,000 තරම් වන බවට ඇස්තමේන්තු කොට ඇති අතර ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 0.48 ක් පමණ වේ. වෙළඳපොලේ 85% ක් පමණ කලු තේ වලින් සමන්විත වන අතර ඉතිරි ප්‍රමාණය හරිත තේ වලින් සමන්විත වේ. එරට වඩාත් ජනප්‍රිය වී ඇති තේ බෑග සිල්ලර වෙළඳාමේදී 90% කට වඩා වැඩි ප්‍රමාණයක් අලෙවි වේ. ජනතාව තත්ත්වයෙන් උසස් තේ ඉල්ලුම් කිරීම හේතුවෙන් විශේෂිත තේ සාප්පු ව්‍යාප්ත වීම ඇරඹී ඇත.

2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව තේ මෙ.ටො. 2253 ක් එරටට අපනයනය කර ඇති අතර 2012 වර්ෂයේදී අපනයනය කර ඇත්තේ තේ මෙ.ටො. 2055 කි. සමස්ත වෙළඳපොලේ 92% ක් පෙර ඇසුරුම් තේවලින් සමන්විත වේ. ඉතිරි ප්‍රමාණය සමන්විත වන්නේ තොග තේ වලිනි.

## 2.6.5. උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය

වගුව 2.21 උතුරු සහ දකුණු ඇමරිකානු කලාප වෙත ලංකා තේ අපනයනය කිරීම පිළිබඳ රටවල් අනුව සංසන්දනය (2012/2013)

| රට | 2013 ප්‍රමාණය | 2012 ප්‍රමාණය | ප්‍රමාණයේ වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| චිලී | 6,837,547 | 6,555,300 | 282,247 | 4.31 |
| ඇ.එ.ජ. | 3,736,641 | 2,950,474 | 786,167 | 26.65 |
| කැනඩාව | 567,219 | 614,981 | (47,762) | (7.77) |
| වෙනිසියුලාව | 30,424 | 92,578 | (62,154) | (67.14) |
| බ්‍රසීලය | 10,735 | 4,087 | 6,648 | 162.66 |
| මෙක්සිකෝව | 10,142 | 17,599 | (7,457) | (42.37) |

| | | | | |
|---|---|---|---|---|
| පැනමා | 5,633 | 93 | 5,540 | 5956.99 |
| ආජන්ටිනාව | 27,040 | 29,960 | (2,920) | (9.75) |
| කොලොම්බියාව | 318 | 895 | (577) | (64.47) |
| එකතුව | 11,225,699 | 10,265,967 | 959,732 | 9.35 |

## 2.6.5.1. ඇ.එ.ජ.



ඇමරිකා මහාද්වීපයේ විශාලතම හා වඩාත්ම වැදගත් තේ වෙළඳපොළ වනුයේ ඇමරිකා එක්සත් ජනපදයයි. තේ කිලෝ මිලියන 174 ක් පමණ ආනයනය කරන රුසියාව හා තේ කිලෝ මිලියන 131 ක් පමණ ආනයනය කරනු ලබන පකිස්තානයට පසුව තේ කිලෝ මිලියන 126 ක ප්‍රමාණයක් ආනයනය කරමින් වර්තමානයේ ඇ.එ.ජනපදය ලෝකයේ තෙවැනි විශාලතම තේ ආනයකරු වශයෙන් තක්සේරු කරනු ලැබ ඇත. 2012 වර්ෂයේදී ඇ.එ.ජ. විසින් පරිභෝජනය සඳහා කරන ලද ශුද්ධ තේ ආනයනය අතීතයේ දෙවන විශාලතම තේ ආනයනකරු වූ එක්සත් රාජධානිය පරිභෝජනය සඳහා ආනයනය කරන ලද තේ ප්‍රමාණය ද ඉක්මවිය.

මිලියන 320 ක පමණ ජනගහනයකින් යුත් මෙ.ටො. 125,653 ක වාර්ෂික තේ පරිභෝජනයක් සහිත මෙරටේ ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.41 ක් පමණ වේ. ඇ. එ. ජනපදයේ පරිභෝජනය කරනු ලබන තේවලින් 85% ක් කලු තේ වන අතර 14% ක් හරිත තේ සහ ඉතිරි 1% ඕලොන් සහ සුදු තේ වේ . හරිත තේ සහ පලතුරු තේ පරිභෝජනය ඉහළ නඟිමින් පවතී. ඇ.එ. ජනපදයේ මුළු තේ පරිභෝජනයෙන් 85% ක් පමණ අයිස් තේ ස්වරූපයෙන් පානය කෙරේ.

ඇ.එ.ජනපදයේ ප්‍රධාන තේ සැපයුම්කරු වන ආජන්ටිනාව 39%ක සැපයුමක් සිදු කරන අතර අනතුරුව චීනය (20%), ඉන්දියාව (9.6%), වියට්නාමය (5.7%), ඉන්දුනීසියාව (3.5%) ක හා ශ්‍රී ලංකාව (3.3%) ක තේ සැපයුමක නියැලී සිටී. එරට ප්‍රධාන හරිත තේ සැපයුම්කරුවන් වන්නේ චීනය හා ජපානයයි. ඇ.එ. ජනපදයට තේ අපනයනය කිරීමේදී වටිනාකම අතින් ගතකළ චීනය ඉහළම ස්ථානයේ පසුවන අතර අනතුරුව ආජන්ටිනාව සහ ඉන්දියාව සිටී.

පසුගිය වසරවල ලංකාව විසින් ඇ. එ. ජනපදයට තේ අපනයනය කිරීමේදී වාර්ෂිකව ප්‍රමාණය කිලෝ මිලියන 2.6 සිට 3.6 අතර ප්‍රමාණයක උච්චාවචනය විය. 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ඇ.එ.ජනපදයට තේ කිලෝ ග්‍රෑම් 3,736,641 ක් අපනයනය කර ඇත. එය 2012 අපනයන ප්‍රමාණය හා සැසඳීමේදී 26.6% ක වර්ධනයකි. මෙම කාලය තුළ අපනයන ආදායම 35.% කින් හෙවත් රුපියල් මිලියන 2597 කින් විශාල ලෙස ඉහළ ගියේය.

## 2.6.5.2. කැනඩාව



කැනඩාව උතුරු ඇමරිකාවේ තවත් එක් සාම්ප්‍රදායික තේ වෙළඳපොලකි. 2012 වර්ෂයේදී කැ.ඩො. මිලියන 360ක මුළු සිල්ලර අලෙවි වටිනාකමින් 69% ක් නියෝජනය කරමින් කලු තේ විශාල බාණ්ඩය ලෙස වෙළඳපොල තුළ ආධිපත්‍ය පැතිරූ අතර ඒ හා සමානව මුළු සිල්ලර අලෙවි ප්‍රමාණය වූ ටොන් 12,300 කින් 89% ක ප්‍රමාණයක් කලු තේ විය. කලු තේවල පවතින සෞඛ්‍යයට හිතකර ගුණය හේතුකොටගෙන බොහෝ කැනේඩියානු පාර්භෝගිකයන්ගේ රුචිය කලු තේ කෙරෙහි වඩ වඩාත් යොමු විය.

2012 වර්ෂයේදී 6% ක වටිනාකමින් හා 3% ක ප්‍රමාණයෙන් වර්ධනය වෙමින් හරිත තේ සිල්ලර වෙළඳාම තුළ ඉස්මතු විය. කැනඩාවේ මුළු තේ ප්‍රමාණයෙන් 5%ක් තරම් වූ සුළු විකුණුම් ප්‍රමාණයක් නියෝජනය කරමින් පලතුරු/ ඖෂධීය තේ කුඩාම තේ බාණ්ඩය වශයෙන් වෙළඳපොල තුළ පැවතුණි.

පාරිභෝගික වෙළඳපොල වෙනස්වීම හා වෙළඳපොල තුළ සිදුවන නව සංවර්ධනය හරහා උසස් ගුණයෙන් යුක්ත තේ අත්දැකීමක් ලැබීම සඳහා වන ඉල්ලුම ඉහළ නැඟීම හේතුකොට කැනඩාවේ තේ පරිභෝජනය අඛණ්ඩව වර්ධනය වනු ඇත. උසස් කැනේඩියානු පාරිභෝගිකයන්ට තේ පරිභෝජනය සඳහා නව මංපෙත් විවර කරමින් ඔවුන් වෙත පිළිගන්වනු ලබන විශිෂ්ට කලු තේ මෙන්ම තේ කෝෂ වැනි නව නිපැයුම් හරහා සමස්ත වර්ධනය සිදුවනු ඇත.

2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව කැනඩාවට තේ කිලෝ ග්‍රෑම් 567,219 ක් අපනයනය කරන ලද 2012 වර්ෂයේදී අපනයනය කරන ලද ප්‍රමාණය කි.ග්‍රෑ. 614,981 ක් විය. වටිනාකම අතින් ගත්කළ රුපියල්

මිලියන 526 ක සිට රුපියල් මිලියන 610 ක් තරම් වූ විශාල ප්‍රමාණයකින් එය ඉහළ ගියේය. මෙය අදාළ කාලය තුළ වූ 16% ක වර්ධනයකි.

### 2.6.5.3. චිලි



දකුණු ඇමරිකාවේ විශාලතම තේ වෙළඳපොල වන වන චිලි රටේ වාර්ෂික තේ ආනයනය මෙ.ටො. 20,000 ඉක්මවයි. චිලි රටේ තේ පරිභෝජනයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. 2012 වර්ෂයේදී තේ පරිභෝජනය 3% කින් පමණ වර්ධනය වුන අතර වර්තමාන සිල්ලර විකුණුම් වටිනාකම 5%කින් වර්ධනය විය. කලු තේ අඛණ්ඩවම තේ විකුණුම් ප්‍රමාණය තුළ බහුතර ප්‍රමාණය වේ. එහි සිල්ලර අලෙවි ප්‍රමාණයේ 3% ක වර්ධනයක් ඇති වූ අතර සිල්ලර අලෙවි වටිනාකමේ 5% ක වර්ධනයක් විද්‍යමාන විය. කලු තේ පාරිභෝගිකයන්ගේ ඉතා සම්පතම පානයක්ව පවතින අතරතුර සාපේක්ෂ වශයෙන් එහි පවත්නා වානිජමය ජනප්‍රිය ස්වභාවය හේතුකොටගෙන එය පුද්ගලික ලේබල් ආදේශනය සඳහා පහසු ඉලක්කයක් විය හැකිය. එවිට එම බාණ්ඩයේ වටිනාකම නිරන්තරයෙන් පිරිහීමට ලක්වනු ඇත. එමෙන්ම අනෙකුත් තේ වර්ග විවිධ රසයෙන් වැඩි දියුණු කිරීම හරහා පාරිභෝගික ආකර්ශනය දිනාගැනීමට හැකිවන අතර එම නිසා ඒවායේ අලෙවිය වැඩිවනු ඇත.

වෙළඳපොලේ 60%ක සැපයුමක් සිදුකරමින් ආජන්ටිනාව ප්‍රමුඛ සැපයුම්කරු වශයෙන් පසුවන අතර 30% ක සැපයුමක් සිදුකරමින් ශ්‍රී ලංකාව සභාය සැපයුම්කරු වී සිටී. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව එරටට අපනයනය කරන ලද තේ කි.ග්‍රෑ. 6,555,300 ට සාපේක්ෂව 2013 වර්ෂයේදී සපයන ලද තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 6,837,547 ක් විය. ප්‍රමාණයෙන් එය 4.3% ක වැඩිවීමකි. 2012 වසර හා සැසඳීමේදී අපනයන ආදායම රුපියල් මිලියන 3240 කින් හෙවත් 18.5%කින් ඉහළ ගොස් තිබුණි.

### 2.6.6. දකුණු ආසියා කලාපය

වගුව 2.20 දකුණු කලාපය වෙත ලංකා තේ සැපයීම පිළිබඳ රටවල් අනුව සංසන්ධනය

| රට | මුළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | | වර්ධනය % |
|---|---|---|---|---|
| | 2013 | 2012 | ප්‍රමාණයේ වෙනස | |
| ඉන්දියාව | 610,484 | 499,376 | 111,108 | 22.25 |
| පකිස්තානය | 604,401 | 4,487,124 | (3,882,723) | (86.53) |
| බංගලාදේශය | 280,647 | 93,732 | 186,915 | 199.41 |
| මාලදිවයින | 225,985 | 216,054 | 9,931 | 4.60 |
| ඇෆ්ගනිස්ථානය | 8,766 | - | 8,766 | 100.00 |
| නේපාලය | 2,110 | 1,069 | 1,041 | 97.38 |
| එකතුව | 1,732,393 | 5,297,355 | (3,564,962) | (67.30) |

මෙම කලාපය ලංකා තේ ආනයනය කරන රටවල් හයකින් යුක්තවන අතර සමස්ත ලෝක ජනගහනයෙන් 23% ක නියෝජනයක් එම රටවල් තුළ වේ. ලෝකයේ වැඩිම සී.ටී.සී හා සාම්ප්‍රදායික තේ ප්‍රමාණයක් නිපදවන්නේ මෙම කලාපය තුළ ය. මෙම රටවල් හය විසින් තේ කිලෝ මිලියන 1.7 ක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කර ඇති බව ඉහත වගුවේ දැක්වේ. 2012 වර්ෂයට සාපේක්ෂව ප්‍රමාණයේ 67% ක අඩුවීමක් 2013 වර්ෂයේදී සිදු වී ඇත. නැගෙනහිර අප්‍රිකානු රටවල සහ ඉන්දියාවේ තේ නිෂ්පාදනය ඉහළ යාම සහ සී.ටී.සී. තේ අපනයනය වැඩිවීම මෙම පිරිහීමට හේතු වී තිබේ.

ජා.තේ. කමිටුවේ දත්තවලට අනුව පූර්ව වර්ෂයේදී ඉන්දියාව විසින් තේ කිලෝග්‍රෑම් බිලියන 1.1 ක් නිපදවන ලද අතර ඊට සාපේක්ෂව 2013 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් මිලියන 1.2 ක් නිපදවීම නිසා 9.2%කින් එම නිෂ්පාදනය වර්ධනය වී ඇත. ලෝකයේ දෙවැනි විශාලතම තේ නිපැයුම්කරු වන ඉන්දියාව ප්‍රධාන වශයෙන් ඊජිප්තුව, පකිස්ථානය සහ එක්සත් රාජධානිය යන රටවල්වලට සී.ටී.සී. තේ වර්ග අපනයනය කරන අතර තත්ත්වයෙන් උසස් සාම්ප්‍රදායික තේ වර්ග ඉරානය, ඉරාකය, ජර්මනිය හා රුසියාව යන රටවල්වලට අපනයනය කරයි.

ශ්‍රී ලංකාව විසින් 2013 වර්ෂයේදී රුපියල් මිලියන 367.ක වටිනාකමකින් යුක්ත තේ කිලෝග්‍රෑම්

610484 ක් ඉන්දියාවට අපනයනය කොට ඇත. ඉන්දු ලංකා ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් 2013 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් 96,322 ක් ඉන්දියාවට අපනයනය කරන ලදී.

උසස් වෙළඳපොල බාණ්ඩයක ඉල්ලුම හේතුකොටගෙන 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ලංකා තේ වැඩි ප්‍රමාණයක් ඉන්දියාව ආනයනය කළේය. නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තේ කිලෝග්‍රෑම් මිලියන 15ක තීරුබදු සහන කෝටාවක් තිබියදීත් ලංකා තේ සන්නම් වෙළඳපොල තුළ දැකිය හැකි විය.

කෙන්යානු තේ මිල විශාල ලෙස අඩුවීම හේතුකොටගෙන මිල සංවේදී පකිස්තානු වෙළඳපොල විසින් 2012 වසරට සාපේක්ෂව ශ්‍රී ලංකා තේ ආනයනය අඩු කරන ලදී. 2013 වර්ෂයේදී ඇතිවූ ආර්ථික ප්‍රගතියත් සමඟ බංගලාදේශයේ තේ පරිභෝජනය ඉහළයාම නිසා එය අවස්ථාවක් කරගනිමින් ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී තේ වැඩි ප්‍රමාණයක් බංගලාදේශයට අපනයනය කළේය. මාලදිවයින 2013 වර්ෂයේදී ඔවුන්ගේ ලංකා තේ ආනයනය පවත්වාගෙන යනු ලැබූ අතර 2012 වර්ෂයට සාපේක්ෂව සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරයි. මාලදිවයින, ඇෆ්ගනිස්ථානය සහ නේපාලය ලංකා තේ ආයතනයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර ඇෆ්ගනිස්ථානය විසින් 2013 වර්ෂයේදී ලංකා තේ ආනයනය ආරම්භ කරන ලදී.

# 03 මණ්ඩලය විසින් ආරම්භ කර ඇති ක්‍රියාකාරකම්

ප්‍රධාන ලේකම් කාර්යාලය, තේ කොමසාරිස්වරයාගේ අංශය, තේ ප්‍රවර්ධන අංශය සහ විශ්ලේෂණාත්මක පරීක්ෂණාගාරය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ වන අතර තේ කර්මාන්තයේ උන්නතිය උදෙසා මෙම සියලුම අංශ කටයුතු කරයි.

## 3.1 තේ කොමසාරිස් අංශය

1976 ජනවාරි 01 දින සිට තේ කොමසාරිස්වරයා වෙත පවරා ඇති තේ කර්මාන්තයට අදාළ සංවර්ධනය, නිෂ්පාදනය, අපහරනය, නියාමනය යන මේවා හා සම්බන්ධ සියලු නියාමන කටයුතු 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය හා 1957 අංක 51 දරන තේ පාලන පනත ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම තේ කොමසාරිස් අංශය විසින් ඉටුකරනු ලබයි.

තේ කොමසාරිස් අංශයේ කාර්යයන් ගාල්ල, මාතර, රත්නපුර, ගම්පොල, හැටන්, බණ්ඩාරවෙල, සහ මතුගම යන නගරවල පිහිටි ප්‍රාදේශිය කාර්යාල 7ක් අතර විමධ්‍යගත කොට ඇත.

තේ කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් අංශය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යාදත්ත රැස්කිරීම
- තේ නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචිකිරීම සහ ලියාපදිංචිය අලුත්කිරීම
- තේ දළු වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කර්මාන්තශාලා නවීකරණය සහ අලුත්වැඩියා කිරීම සඳහා සහනාධාර ලබාදීම (හිඩැස් පිරවීම සහ අලුතින් වගාකිරීම ඇතුළුව)
- කර්මාන්තශාලා සහ වෙළඳුන්ට සාධාරණ මිල ගණන් ගෙවීම
- යහපත් නිෂ්පාදන ක්‍රම පිළිබඳ විශේෂ අධීක්ෂණයක් සිදු කිරීම
- හරිත තේ පත්‍ර වෙළඳුන් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ වෙළෙන්දන් ලියාපදිංචිකිරීම සහ අධීක්ෂණය කිරීම
- ශ්‍රී.ලං.තේ.ම./ ශ්‍රී.ලං.ප්‍ර.ආ. නිෂ්පාදන තත්ත්ව සහතික වැඩසටහන් පැවැත්වීම

1975 අංක14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ සම්පාදනය කරනු ලදුව තේ කොමසාරිස්වරයා වෙත පවරනු ලැබ ඇති රෙගුලාසි පහතින් දැක්වේ.

(අ) ශ්‍රී ලංකාතේ මණ්ඩල (පිරිසැකසුම් සහ නිමි තේ සනීපාරක්ෂක තත්ත්ව) රෙගුලාසි 1986

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නැවත වගා කිරීම් සහ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය)

### 3.1.1. ප්‍රධාන ජයග්‍රහණ

පසුගිය වර්ෂවලට සාපේක්ෂව 2013 වර්ෂයේදී මෙම අංශය විශාල ජයග්‍රහණ අත් පත් කරගෙන ඇත. ගෙවීම් පැහැර හරින්නන් පිළිබඳ දඬ යෝජනා ක්‍රමය ප්‍රතිශෝධනය කිරීම එසේ අත්කරගත් එක් ජයග්‍රහණයකි.

"B leaf 60 progamme" යනු 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. කර්මාන්තශාලා මට්ටමින් මිලගණන් පරීක්ෂා කිරීම සඳහා කෙටි පණිවුඩ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම කුඩා තේවතු හිමියන්ට ඉමහත් ප්‍රයෝජනයක් වූ අතර 2013 වර්ෂයේදි දේශිය වෙළඳපොල සඳහා ගුණාත්මක තත්ත්ව හඳුන්වාදෙනු ලැබිය.

උන්නතාංශ අනුව සහ මිලදී ගත් පත්‍ර නිෂ්පාදනය ප්‍රමාණය අනුව මෙහෙයුමේ යෙදී සිටින පුද්ගලයන් පිළිබඳ පැහැදිලි කිරීමක් 3.1 වගුවේ දැක්වේ.

3.1 මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා පිළිබඳ පැහැදිලි කිරීම

| තත්ත්වය | ඉහළ | මධ්‍යම | පහළ | එකතුව |
|---|---|---|---|---|
| 1'තම තේවලට පමණක් සීමා වුන | 55 | 18 | 05 | 78 |
| 2'තම පත්‍ර සහ මිලදීගත් තේදළු:- | | | | |
| (අ) මුළු නිෂ්පාදනයේ තම තේදළු 50% කට වඩා අඩු | 13 | 38 | 139 | 190 |
| (ආ) මුළු නිෂ්පාදනයේ තම තේදළු 50% කට වඩා වැඩි | 84 | 31 | 15 | 130 |
| 3'මිලදී ගත් තේදළු පමණක් | 06 | 25 | 255 | 286 |
| 4'මෙහෙයුම් කටයුතු සිදු නොවන ලියාපදිංචි කර්මාන්තශාලා | 35 | 70 | 76 | 181 |
| 5'මුළු ලියාපදිංචි කර්මාන්තශාලා සංඛ්‍යාව | 201 | 189 | 507 | 897 |
| 6'මෙහෙයුම් කටයුතු සිදුවන කර්මාන්තශාලා | 166 | 119 | 431 | 716 |

### 3.1.2. නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචිකිරීම

තේ නිෂ්පාදනය කරන නිෂ්පාදකයන් පිළිබඳ සහ ලියාපදිංචිකිරීමට නියමිත නිෂ්පාදනකරුවන්ට අයත් තේ කර්මාන්තශාලාවට අදාළ නියමිත තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් 1957 අංක 57 දරණ තේ පාලන පනත යටතේ තේ කොමසාරිස්වරයාගේ අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම පනතේ කාර්යයන් සඳහා නිෂ්පාදකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට කිසියම් පුද්ගලයකු හිමිකම් කියන්නේද යන්න තීරණය කිරීම සඳහා මෙම අංශයට බලය ඇත්තේය. තේ නිෂ්පාදනය කිරීම සහ වෙන්දේසි මධ්‍යස්ථාන හරහා තේ විකිණීම සඳහා සෑම තේ නිෂ්පාදකයෙකුම තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය.

සියලුම කර්මාන්ශාලා ගුණාත්මක තත්ත්වයේ තේ නිෂ්පාදනය කිරීමට සුදුසු වන පරිදි ඒවායේ ගොඩනැගිලි, උපකරණ සහ මෙහෙයුම් ක්‍රම පවතින්නේද යන්න වගබලා ගැනීම පිණිස තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු අතර කර්මාන්තශාලාව මඟින් නිෂ්පාදිත තේවල තත්ත්වය පිළිබඳ අධීක්ෂණය කිරීමේදී ඊට සහාය වීම, කසල තේ බැහැර කිරීම පාලනය කිරීමට කටයුතු කිරීම සහ සාධාරණ මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීම අනිවාර්යයෙන් කළ යුතුය.

### 3.1.3. මිලදී ගනු ලබන දළු සඳහා ගෙවිය යුතු සාධාරණ මිල

තේ පාලන පනතේ විධිවිධාන යටතේ මිලදී ගනු ලබන දළුවලින් තේ නිෂ්පාදනයේ නියැලී සිටින කර්මාන්තශාලා විසින් එම කර්මාන්තශාලා වලින් නිෂ්පාදනය කරනු ලබන නිමි තේ වල නියමිත මිල පිළිබඳ සැලකිල්ල යොමුකොට තේ කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන මිල ගණන් මත පදනම්ව නිෂ්පාදනය සඳහා මිලදී ගනු ලබන තේ දළු සඳහා ගෙවීම් කළයුතුය. අමු තේ දළු සපයන්නන් සඳහා කර්මාන්තශාලා විසින් ගෙවිය යුතු සාධාරණ මිල එම කර්මාන්තශාලාවල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍ය මත පදනම්ව තීරණය කරන ලදි.
නිමි තේ විකිණීමෙන් ලද මුදල දළු සපයන්නන් සහ කර්මාන්තශාලා අතර 68:32 යන අනුපාතයට බෙදිය යුතුය. කර්මාන්තශාලාවේ විකුණුම් සාමාන්‍යය මාසික සාමාන්‍ය වැඩිවීමද ඉක්මවා යයිනම් එසේ වැඩි වූ ආදායම 50:50 අනුපාතයට බෙදනු ලැබේ. අමුදළුවලට තේ නිමැවුම 21.5% ක නිමැවුම් අනුපාතයක් මත පදනම්ව සූත්‍රය සකස් කරනු ලැබේ.

#### 3.1.3.1. ගෙවීම් පැහැර හැරීම්

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී අමු තේ දළු සැපයුම්කරුවන් සඳහා වන මුළු ගෙවීම් පැහැර හැරීම් ප්‍රමාණය 2013 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 200 ක් විය. 2013 වර්ෂයේදී අප ආයතනය විසින් ද රුපියල් මිලියන 6.06 ක් ආපසු අයකර ගන්නා ලදී. ඔවුන්ගේ ලියාපදිංචිය අත්හිටුවීම මඟින් තවදුරටත් ගෙවීම් පැහැර හැරීම් එකතුවීම වළක්වන ලදි. මුළු ගෙවීම් පැහැර හැරීම් ප්‍රමාණ පියවීමෙන් පසුව පමණක් එවැනි කර්මාන්තශාලා යළි ලියාපදිංචි කිරීම පිළිබඳ සලකා බැලේ.

වගුව 3.1.2 ගෙවීම් පැහැර හැරීම් පිළිබඳ තත්ත්වය

| ප්‍රදේශය | 2013.01.01 දිනට ප්‍රමාණය | 2013 වර්ෂයේදී එකතුකළ ප්‍රමාණය | නැවත අයකර ගත් සහ ගෙවන ලද ප්‍රමාණය | 2013.12.31 දිනට කුඩා තේවතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය | වසා දමන ලද කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු ප්‍රමාණය | දැනට ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 33,965 | - | 6,061 | 40,026 | 115,434 | 25,282 |
| මාතර | 2,654 | - | - | 2,654 | 2,639 | 15 |
| ගම්පොල | 14,501 | - | - | 14,501 | 17,369 | 8,151 |
| ගාල්ල | 14,450 | 32 | - | 14,482 | 11,312 | 3,216 |
| මතුගම | 8,498 | 397 | 8,895 | 17,393 | 6,754 | 2,650 |
| හැටන් | 1,253 | - | - | 1,253 | - | - |
| බණ්ඩාරවෙල | 8,083 | - | - | 8,083 | 847 | 7,213 |
| එකතුව | 83,403 | 429 | 14,956 | 98,391 | 154,356 | 46,527 |

### 3.1.4. අමු තේ දළුවල තත්ත්ව පාලනය

නිමි තේවල උසස් තත්ත්වය පවත්වාගෙන යාම පිණිස ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර හා මෙහෙයුම් ක්‍රමවේද යෝග්‍ය තත්ත්වයක පැවතිම අත්‍යවශ්‍යය. එමනිසා උසස් තත්ත්වයේ තේ නිෂ්පාදනය කිරීම සඳහා හිතකර වන ඉහත තත්ත්වයන් නොමැති කර්මාන්තශාලා වෙතොත් තේ පාලන පනත යටතේ එවැනි කර්මාන්තශාලා වල ලියාපදිංචිය අවලංගු කිරීමට තේ කොමසාරිස්වරයාට බලය ඇත.

මිලදී ගනු ලබන දළු භාවිතා කර නිෂ්පාදන මෙහෙයුම් සිදුකිරීමේදී අමු දළුවල තත්ත්ව පාලනය අතිශය වැදගත් සාධකයකි. නිෂ්පාදන ක්‍රියාවලියේදී ඒ සඳහා උසස් තත්ත්වයේ අමු තේ දළු භාවිතා කරයි නම් අවසානයේ නිමි තේවල තත්ත්වය ඉහළ යන අතර එහි උපරිම ප්‍රතිලාභය අමු තේ දළු වෙළෙන්දාට මෙන්ම තේ නිෂ්පාදකයාටද හිමිවේ. කිසියම් කර්මාන්තශාලාවක් ගෙවීම් පැහැර හරින බවට අනාවරණය වුවහොත් එකී කර්මාන්තශාලාවේ ලියාපදිංචිය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමකට යටත්වන බවට අනතුරු අඟවනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අමු තේ දළුවල තත්ත්වය පිළිබඳ ගැසට් නිවේදනයක් 2010 දෙසැම්බර් 14 දින පලකරන ලදී. තේ පාලන පනත යටතේ නිෂ්පදනය කරනු ලබන තේවල තත්ත්වය අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීමේ බලතල තේ කොමසාරිස් අංශය සතුවේ. නිෂ්පාදනය කරනු ලබන තේවල තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස පහත සඳහන් ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කරනලදී.

අ) ශ්‍රී.ලං.ප්‍ර.ආ. - ශ්‍රී.ලං.තේ.ම. තත්ත්ව සහතික

ආ) අමු තේදළුවල තත්ත්වය වැඩිද්යුණු කිරීම පිණිස "B leaf 60 progamme" වැඩසටහන ක්‍රියාත්මකකිරීම

ඇ) උත්සව කාලවලදී Rush Crop Mangement වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ඈ) Low NSA Strategy

ඉ) තත්ත්ව අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

ඊ) කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය

උ) තේ නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

ඌ) කර්මාන්තශාලා පාදක කොටගත් තේ සංවර්ධනය වැඩසටහන

එ) කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් ස්ථාපිත කිරීම

ඒ) හරිත තේ වෙළඳුන් පුහුණු කිරීමේ වැඩසටහන

#### අ) ශ්‍රී.ලං.ප්‍ර.ආ - ශ්‍රී.ලං.තේ.ම. තත්ත්ව සහතිකය

නිෂ්පාදන ක්‍රියාවලිය සහ අවසාන නිෂ්පාදනය උදා:- කලු තේ සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය (ශ්‍රී.ලං.තේ.ම.), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රී.ලං.ප්‍ර.ආ.) හා ඒකාබද්ධ වී නිෂ්පාදන සහතිකකරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. කාර්ය පාලන සහ නිෂ්පාදන පරීක්ෂාව පිළිබඳ අදාළ ප්‍රමිත වල දක්වා ඇති නියමයන් හා අදාළ

නෛතික අවශ්‍යතා ද ඇතුළත්ව තත්ත්ව කළමනාකරණ පද්ධතියක අත්‍යවශ්‍ය මූලිකාංග කෙරෙහි මෙම යෝජනා ක්‍රමය කේන්ද්‍රගත වී ඇත. පාරිභෝගිකයාට තත්ත්වයෙන් උසස් කලු තේ සඳහා තෙවන පාර්ශ්වීය සහතිකයක් ලබාදීම පිණිස ශ්‍රී.ලං.ප්‍ර.ආ - ශ්‍රී.ලං.තේ.ම. තේ නිෂ්පදාන සහතිකකරණ යෝජනා ක්‍රමය අපක්ෂපාති ලෙස, වෙනස්කමින් තොරව හා විනිවිදභාවයකින් යුක්තව ක්‍රියාත්මක වේ.

### ආ) තේ දළුවල තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස (B Leaf 60) වැඩසටහන ක්‍රියාත්මක කිරීම

තේ දළු නෙළීමේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම හා අස්වැන්න නෙළීමෙන් පසු සිදුවන හානිය අවම කරගැනීම මඟින් තේ දළුවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. වර්තමාන දළුවල තත්ත්වය හොඳම දළු 33%, හොඳම තත්ත්වයට වඩා අඩු 32%, බාල තේ දළු 35% ක් වශයෙන් පවතී. කෙටි කාලයක් තුළ අමු තේ දළුවල තත්ත්වය (හොඳම තත්ත්වයේ දළු) අවම 60% ක මට්ටමකින් පවත්වාගෙන යාම ඉලක්ක කර ගනිමින් “B Leaf 60” වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමෝපායන් මේ වනවිට ක්‍රියාත්මක කර ඇත.

1- උනන්දුකාර පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන
2- දළු පිළිබඳ කටයුතු කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීම
3- පසු අස්වනු ශිල්ප ක්‍රම වැඩිදියුණු කිරීම පිණිස මූල්‍යාධාර ලබාදීම

### ඇ) උත්සව කාලවලදී Rush Crop Magement වැඩසටහන ක්‍රියාත්මක කිරීම

උත්සව කාලවලදී දීර්ඝ කාලයක් තේ කර්මාන්ශාලා වසා තිබීම හේතුකොටගෙන තේ වගාකරුවන්ට සිදුවන හානිය අවම කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සකස් කොට ඇත. මෙම වැඩසටහන 2005 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබූ අතර එතැන් සිට විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දෙමින් වගාකරුවන්ට සිදුවන හානිය සම්පූර්ණයෙන්ම පාහේ පාලනය කිරීමට තේ කොමසාරිස්වරයාගේ අංශයට හැකි වී තිබේ. උත්සව සමය තුළ කර්මාන්තශාලා වසා තැබීම 2013 අප්‍රේල් මාසයේදී 11 සහ 16 යන කාලය සඳහා පමණක් සීමා විය.

### ඉ) Low NSA Strategy

ශුද්ධ විකුණුම් සාමාන්‍යයේ පහළම තලයේ ක්‍රියාත්මක වන තේ කර්මාන්තශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සකස්කොට ඇත. තේ දළුවල ප්‍රමිතිය මෙන්ම නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම හරහා එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ සාමාන්‍ය විකුණුම් මට්ටම ඉහළ නංවාලීම මෙම ව්‍යාපෘතියේ ඇමුණ වේ.



ඡායාරූපය 3.6.1.- "B Leaf 60 Project" දැනුවත් කිරීමේ වැඩසටහන




ඡායාරූපය 3.6.2.- "B Leaf 60 Project" පිළිබඳ වෘත්තීය වැඩසටහන

## ඊ) තත්ත්ව අධීක්ෂණ ක්‍රමවේදය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

2013 වර්ෂයේදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා සම්බන්ධයෙන් හදිසි පරීක්ෂණ 56 ක් පවත්වන ලදි.

වගුව 3.3: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| ප්‍රදේශය | පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| බණ්ඩාරවෙල | 5 |
| ගම්පොල | 6 |
| රත්නපුර | 7 |
| මාතර | 18 |
| ගාල්ල | 7 |
| මතුගම | 13 |
| එකතුව | 56 |

## උ) කර්මාන්තශාලා නවීකරණය කිරීම සහ තේ නැවත වගාකිරීම සඳහා සහනාධාර ලබාදීම

මහා භාණ්ඩාගාරය විසින් දේශීය අරමුදල් යටතේ තේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අයවැය හරහා සම්පාදනය කොට ඇත. ඉහතින් සම්පාදිත අරමුදල් කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය සඳහා උපයෝගී කරගනී.

2013 වර්ෂයේදී තේ නැවත වගාකිරීමේ සහ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ කටයුතු උදෙසා සංස්ථා සහ පුද්ගලික ක්ෂේත්‍රය සඳහා අරමුදල් සම්පාදනය කොට තිබුණි. මෙම අරමුදල්වලින් 6.88% ක් පුද්ගලික තේ කර්මාන්තශාලා සංවර්ධනය සඳහා වෙන් කරන ලද අතර ඉතිරිය සංස්ථා අංශයේ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහ තේ නැවත වගා කිරීමේ කටයුතු සඳහා වෙන් කරන ලදි. 2013 වර්ෂයේදී තේ කොමසාරිස්වරයාගේ අංශයේ නිලධාරීන් විසින් කර්මාන්තශාලාවල හදිසි පරීක්ෂා කිරීම් 56ක් පවත්වන ලදි.

## ඌ) කර්මාන්තශාලා පාදක තේ සංවර්ධනය කිරීමේ වැඩසටහන

කුඩා තේවතුවල සහ තේ කර්මාන්තශාලාවල ඵලදායිතාවය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේවතු සංවර්ධන අධිකාරිය එක්ව

වගුව 3.4: අයදුම්පත් සංඛ්‍යාව සහ සහනාධාර වශයෙන් ගෙවා ඇති ප්‍රමාණය

| ප්‍රදේශය | නැවත වගාකිරීමේ සහනාධාර යෝජනාක්‍රමය | | | කර්මාන්තශාලා නවීකරණය කිරීමේ යෝජනාක්‍රමය | |
|---|---|---|---|---|---|
| | අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රමාණය | හෙක්ටයාර ගණන | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද ප්‍රමාණය |
| බණ්ඩාරවෙල | 29 | 7,471.69 | 48.29 | 01 | 379.75 |
| හැටන් | 84 | 7,471.69 | 116.70 | 03 | 1,491.64 |
| ගම්පොල | 08 | 873.50 | 13.57 | - | |
| රත්නපුර | 15 | 3,091.09 | 24.14 | 09 | 6,309.37 |
| මාතර | 02 | 259.36 | 3.66 | 04 | 1,689.31 |
| ගාල්ල | 01 | 46.80 | 0.39 | 07 | 4,486.94 |
| මතුගම | | - | | 06 | 2,933.41 |
| එකතුව | 139 | 14,370.74 | 206.75 | 30 | 17,290.42 |

කර්මාන්තශාලා පාදක තේ සංවර්ධන වැඩසටහන සකස්කොට ඇත.

මෙම වැඩසටහන යටතේ කුඩා තේවතු වල ඵලදායිතාවය සහ අමු තේ දළු පාලනය සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා ව්‍යාප්ති නිලධාරියෙකු පත්කිරීමට සැලසුම් කොට ඇත. 2013 වර්ෂයේදී තේ වගාකරන සෑම ප්‍රදේශයකම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි.

## ඒ) තේ කර්මාන්තශාලා තුළ යහපත් නිෂ්පාදන ක්‍රම ඇති කිරීම

මේ යටතේ කර්මාන්ශාලා 308 ක් ඇගයීමට ලක් කරන ලද අතර ඒවායේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස පියවර ගන්නා ලදි.

වගුව 3.5: ප්‍රදේශ අනුව යහපත් නිෂ්පාදන ක්‍රම පිළිබඳ තක්සේරු කිරීම

| ප්‍රදේශය | ය.නි.ක්‍ර. තක්සේරුව |
|---|---|
| බණ්ඩාරවෙල | 11 |
| ගම්පොල/හැටන් | 148 |
| රත්නපුර | 25 |
| මාතර | 60 |
| ගාල්ල | 51 |
| මතුගම | 13 |
| එකතුව | 308 |

### ඔ) අමු තේ දළු වෙළෙන්දන් සඳහා බලපත්‍ර ලබාදීම

තේ පාලන පනතට අනුව සියලුම අමු තේ දළු වෙළෙන්දන් විසින් තේ කොමසාරිස්වරයාගේ අංශයෙන් වාර්ෂික බලපත්‍රයක් ලබාගත යුතුය.

වගුව 3.6: 2013 වර්ෂයේදී නිකුත්කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

| ප්‍රදේශ | 2013.01.01 දිනට ප්‍රකාශිත බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර අලුත් කිරීම | නව බලපත්‍ර නිකුත් කිරීම | 2013.12.31 දින වන විට අමු තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 152 | 141 | 15 | 156 |
| ගම්පොල/හැටන් | 262 | 242 | 57 | 299 |
| මාතර | 341 | 307 | 35 | 342 |
| ගාල්ල | 350 | 319 | 38 | 357 |
| රත්නපුර | 597 | 521 | 72 | 593 |
| මතුගම | 280 | 261 | 39 | 300 |
| එකතුව | 2,007 | 1,791 | 256 | 2,047 |

### ඕ) කසල තේ පිරිසැකසුම් කිරීම

ස්වභාවික (රසායනික ද්‍රව්‍ය නොයෙදූ) කසල තේවලින් පරිභෝජනය කළ හැකි තේ නිස්සාරණය කිරීමේ ක්‍රියාවලිය කසල තේ පිරිසැකසුම් කිරීම වේ. කසල තේ පිරිසැකසුම් කිරීමේ මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ වැඩ පිළිවෙලක් 2009 වර්ෂයේ සිට ස්ථාපිතකර ඇත. 2013 වර්ෂයේදී ප්‍රදේශ අනුව බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ තොරතුරු 3.7 වගුවේ දැක්වේ.

වගුව 3.7: 2013 වර්ෂයේදී කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත්කිරීම

| ප්‍රදේශය | 2013.01.01 දිනට ලියාපදිංචි | අවුරුද්ද තුළ අලුත් කිරීම් | අවුරුද්ද තුළ අලුතින් නිකුත් කිරීම් | 2013.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 2013.12.31 දිනට නිකුත්කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 1 | 1 | 1 | 2 | 629 |
| ගම්පොල/හැටන් | 287 | 289 | 11 | 290 | 1,728 |
| මාතර | 13 | 13 | 4 | 17 | 785 |
| ගාල්ල | 45 | 43 | 2 | 45 | 770 |
| රත්නපුර | 7 | 5 | 1 | 6 | 1,300 |
| මතුගම | 6 | 5 | 2 | 7 | 395 |
| එකතුව | 359 | 356 | 21 | 367 | 5607 |

## 3.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරන තේ පනතේ (බදු සහ අපනයන පාලන) බලතල සහ කාර්යයන් සහ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ සකස් කරන ලද රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තේ අපනයන අංශය කටයුතු කරයි. තේ අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, තේ ගබඩා, ආනයනකරුවන්, ඇසුරුම් වර්ග ලියාපදිංචිකිරීම, තේ ලබාගැනීම, තේවල අවම ගුණාත්මක තත්ත්වය පිළිබඳ අධීක්ෂණය කිරීම, තේ අපනයනය සඳහා අවසර ලබාදීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යාදත්ත සම්පාදනය කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය පිළිබඳ අධීක්ෂණය කිරීම යන කාර්යයන් මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි.

### 3.2.1ප්‍රධාන ජයග්‍රහණ

2014 ජනවාරි මාසයේ සිට තිරුබදු ප්‍රකාශන පණිවුඩ (CUDEC) මාර්ගස්ථව ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු පිණිස අතින් ගෙනැවිත් බාරදෙන තිරුබදු ප්‍රකාශන පණිවුඩ භාරගැනීම නවතා දමනු ලැබ ඇත.

යහපත් නිෂ්පාදන ක්‍රමවේද සහ නිමි තේ වල තත්ත්වය සම්බන්ධයෙන් වන පරාමිතීන් පිළිබඳ තක්සේරු කරනු පිණිස නිෂ්පාදන බ්‍රෝකර්වරුන්ගේ, තේ අපනයනකරුවන්ගේ සහ තේ මිශ්‍ර කරන්නන්ගේ ගබඩාවල විශේෂ මෙහෙයුමක් සිදුකරන ලදී. 2013 වර්ෂයේදී තේ සාම්පල ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මෙන්ම කණ්ඩායම් හමුවීම් හරහා සාම්පල ක්‍රමවේදය විධිමත් කිරීමට අපනයන අංශයට හැකි විය.

### 3.2.2. ලියාපදිංචි කිරීම

අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩා සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම මෙම අංශයේ එක් ප්‍රධාන කාර්යයක් වේ. 2013 වර්ෂයේදී ඒ ඒ බාණ්ඩ යටතේ ලියාපදිංචි කරන ලද ප්‍රමාණයන් පහත වගුව මගින් දැක්වේ.

සංවිධානය (නෛතික අස්ථිත්වය), ප්‍රාග්ධනය, ගබඩා (තේ ගබඩා කිරීම, මිශ්‍ර කිරීම සහ ඇසුරුම් කිරීම සඳහා), මණ්ඩලය විසින් සුපරීක්ෂාකාරී ලෙස සිදු කරනු ලබන තේ රස පරීක්ෂා කිරීම් වැනි

නිර්ණායක සපුරාලන පුද්ගලයින් තේ අපනයනකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීමට සුදුසුකම් ලබයි.

1986 ජනවාරි 28 අංක 386/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (තේ ඇසුරුම්කරුවන් ලියාපදංචි කිරීම) ප්‍රකාරව දේශිය පරිභෝජනය සඳහා පොලිතීන් මලුවල හෝ අනෙකුත් ආකාරයේ ඇසුරුම්වල තේ ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක නියැලි සිටින ඕනෑම පුද්ගලයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදංචි විම අත්‍යවශ්‍ය වේ. සෑම ලියාපදංචියක්ම වසරක කාලයක් සඳහා පමණක් වලංගු වන අතර වාර්ෂිකව ලියාපදිංචිය අලුත්කිරීම අවශ්‍යය.

1959 අංක16 දරන තේ පනත (බදු සහ අපනයන පාලන) යටතේ ලියාපදිංචි වී ඇති ඕනෑම ආයතනයක් තේ අපනයකරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

වගුව 3.8: අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩා, නිෂ්පාදන බ්‍රෝකර්වරුන් සහ ආනයනකරුවන් ලියාපදිංචිකිරීම (2013)

| ලියාපදිංචිය | 2013.01.01 දිනට | 2013 වර්ෂය තුළදී (නව ලියාපදිංචි) | 2013.12.31 දිනට එකතුව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 383 | 31 | 414 |
| ඇසුරුම්කරුවන් | 412 | 63 | 475 |
| ගබඩා | 447 | 51 | 498 |
| ආනයනකරුවන් | 191 | 3 | 194 |
| අපනයනකරුවන් | 08 | - | 08 |

1986 සැප්තැම්බර් 10 අංක 410/11, 2003 මාර්තු 20 අංක 1280/8 දරන ගැසට් නිවේදනවලින් සංශෝධිත 1984 දෙසැම්බර් 05 අංක 326/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ පලකරන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (තේ ගබඩා කිරීම) 1984 ප්‍රකාරව කිසියම් අවස්ථාවක තේ කිලෝග්‍රෑම් 1000 කට වඩා වැඩි ඕනෑම ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා භාවිත කරන තේ ගබඩා කිරීමේ කාර්යය සඳහා උචිත යැයි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සලකනු ලබන ගබඩා උක්ත රෙගුලාසියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය.

ශ්‍රී ලංකා තේ සමඟ මිශ්‍රිත අනෙකුත් සම්භවවල තේ අඩංගු සිල්ලර තේ බඳුන් ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන සහ අපනයන) 1981 යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බඳුන්/ ඇසුරුම්වල "ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද ලංකා මිශ්‍රිත හෝ වෙනත් සම්භව තේ" හෝ "ශ්‍රී ලංකාවේදී ඇසුරුම් කරන ලද වෙනත් සම්භව තේ" යන පාඨය සඳහන් කළ යුතුය.

අවසර ලබාගනු පිණිස සියලුම ලියාපදංචි අපනයනකරුවන් විසින් කොළඹ වරාය වෙත භාණ්ඩ තොග යැවීමට පෙර තේ අපනයනඅංශය වෙත නිරුබදු භාණ්ඩ ප්‍රකාශනයක් (Custom Goods Declaration)ඉදිරිපත් කළ යුතුය.

### 3.2.3. තේ ආනයනය කිරීම

තේ කි.ග්‍රෑ. 5,083,763.26 ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආනයන බලපත්‍ර 469ක් නිකුත් කර තිබේ. කෙසේවෙතත් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ආනයනය කරන ලද තත්‍ය තේ ප්‍රමාණය තේ කි.ග්‍රෑ. 4,982,759 විය.

වගුව 3.9: තත්‍ය ආනයනය- ජනවාරි -දෙසැම්බර් 2013

| රට | වර්ගය | ආනයනය කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | පි.ර.නැ. අගය (රු.) | අගය (රු.) |
|---|---|---|---|---|
| චීනය | හරිත තේ | 2,369,847 | 411.1 | 974,238,256 |
| | විශේෂ තේ | 122,373 | 933.44 | 114,227,564 |
| | සුදු තේ | 73,996 | 107.69 | 7,968,778 |
| | උප එකතුව | 2,566,216 | 427.26 | 1,096,434,598 |
| ඉන්දියාව | සි.ටී.සී. | 1,296,464 | 255.98 | 331,870,718 |
| | විශේෂ (කලු තේ) | 183,027 | 921.47 | 168,654,608 |
| | හරිත තේ | 470 | 1,017.66 | 478,298 |
| | උප එකතුව | 1,479,961 | 338.52 | 501,003,624 |
| කෙන්යාව | සි.ටී.සී. | 741,085 | 339.43 | 251,542,885 |
| ඉන්දුනීසියාව | සි.ටී.සී. | 26,200 | 346.46 | 9,077,282 |
| වියට්නාමය | හරිත තේ | 98,550 | 291.86 | 28,762,859 |
| මියන්මාරය | සි.ටී.සී. | 1,688 | - | - |
| ජර්මනිය | කැෆේන් ඉවත්කළ තේ | 1,870 | 1,570.10 | 2,936,087 |
| | හරිත තේ | 49 | 1,733.00 | 84,917 |
| | උප එකතුව | 1,919 | 1,574.26 | 3,021,004 |
| කොරියා | විශේෂ | 6,080 | 887.01 | 5,393,042 |
| උගන්ඩාව | සි.ටී.සී. | 14,660 | 299.36 | 4,388,592 |
| මලාවි | සි.ටී.සී. | 46,400 | 281.6 | 13,066,240 |
| මුළු එකතුව | | 4,982,759 | 383.86 | 1,912,690,126 |

### 3.2.4. නිමි තේ සඳහා ISO 3720 අවම ගුණාත්මක තත්ත්වයක් පවත්වාගෙන යාම

අදාළ නිමි තේ අනුමත බාණ්ඩය යටතේ පවතිද, ISO 3720 ප්‍රමිතින්ට අනුකූල වන්නේද, අපවිත්‍ර වීමෙන් තොරවන්නේද සහ ආනයනය සඳහා අවසර ලබාදීම පිණිස යෝග්‍ය වන්නේද යන්න තහවුරු කිරීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇති විශේෂඥ තේ පරීක්ෂකවරුන්ගේ මණ්ඩලයක් විසින් සියලුම ඉදිරිපත් කර ඇති තේ සාම්පල සහ කර්මාන්තශාලාවලින් ලබාගෙන ඇති තේ සාම්පල ආනයනයෙන් පසු බාන ලද තේ සහ අපනයනය සඳහා පිළියෙල කළ තේ සාම්පල පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

වගුව 3.'10: ඒ ඒ නියාදි පරීක්ෂණවලදී අනාවරණය වූ තත්ත්ව ඌණතා සංඛ්‍යාව

| සාම්පල වර්ගය | ඉවත් කරන ලද සාම්පල සංඛ්‍යාව | ISO මට්ටමට වඩා පහළ බවට හා අපවිත්‍ර බවට අනාවරණය වූ සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| වෙන්දේසියට පෙර | 6122 | 74 |
| වෙන්දේසියට පසු | 5940 | 22 |

### 3.2.5. පරිභෝජනය සඳහා උචිත නොවීම හේතුකොටගෙන තේවල ස්වභාවය වෙනස් කිරීම

වෙන්දේසියට පෙර, අපනයනයට පෙර හා විශේෂ පරීක්ෂණවලදී මානව පරිභෝජනයට නුසුදුසු බවට අනාවරණය වන නිමි තේවල ස්වභාවය අපනයන අංශයේ අධීක්ෂණය යටතේ වෙනස් කරනු ලැබේ. මෙම අංශය විසින් 2013 වර්ෂයේදී එසේ හඳුනාගනු ලැබූ තේ කිලෝග්‍රෑම් 231,263ක ස්වභාවය වෙනස් කරන ලදි.

### 3.2.6. නිදහස් වෙළඳ ගිවිසුමේ කාර්ය සාධනය (ඉන්දු-ශ්‍රී ලංකා/ පකිස්ථාන්-ශ්‍රී ලංකා)

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පකිස්තාන්-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තේ සඳහා අනුග්‍රහපූර්වක තීරුබදු ප්‍රමාණ කෝටාවකට ශ්‍රී ලංකාව හිමිකම් කියයි. කෙසේවෙතත් අනුග්‍රහ පූර්වක තීරුබදු ප්‍රමාණ කෝටාව සැලකිය යුතු ලෙස 2013 වර්ෂයේදී භාවිතා කොට ඇති බවට වාර්තා නොවේ.

වගුව 3.11 නිදහස් වෙළඳ ගිවිසුම් අනුග්‍රහපූර්වක තීරුබදු කෝටා භාවිතය

| නි.වෙ.ගි. | වාර්ෂික කෝටාව කි.ග්‍රෑ. | සම්පූර්ණ අපනයන ප්‍රමාණය |
|---|---|---|
| ඉන්දියාව-ශ්‍රී ලංකා | 15,000,000 | 96,322.29 |
| පකිස්ථාන්-ශ්‍රී ලංකා | 10,000,000 | -- |

### 3.2.7. තේ නැවත ලබාගැනීම

විදේශ ගැනුම්කරුවෙකු විසින් බාර නොගන්නා කිසියම් තේ තොගයක් වෙතොත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අපනයනකරු විසින් එම තේ තොගය නැවත ලබා ගත යුතුය. අපනයනයට/ යළි භාවිතා කිරීමට පෙර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එම තොගය යළි පරීක්ෂාවට ලක්කරනු ලැබේ.

## 3.3. තේ ප්‍රවර්ධන අංශය

### 3.3.1. ප්‍රධාන අරමුණ/ අංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් බාණ්ඩ යටතේ දේශීය හා විදේශීය වෙළඳපොලවල් තුළ ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ කාර්යභාරය වේ.

1- UNI National ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන
2- තේ වර්ගීය ප්‍රවර්ධනය
3- ජාත්‍යන්තර ආහාර පාන වෙළඳපොලවල් සහ ප්‍රදර්ශනයලට සහභාගී වීම
4- සියලුම වැදගත් තේ පරිභෝජනය කරන රටවල් පිළිබඳ ක්‍රමෝපා වෙළඳපොල පැතිකඩවල් සකස් කිරීම සහ බෙදා හැරීම
5- තේ ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහාය වීම
6- තරඟකරුවන්ගේ කටයුතු විශ්ලේෂණය කිරීම
7- සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම

8- භූගෝලීය දර්ශක වශයෙන් ලංකා තේ සහ අනෙකුත් ප්‍රාදේශීය තේ නාම සහ ලාංඡන ආරක්ෂා කිරීම
9- ඕසෝන් හිතකර පවිත්‍ර ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ පෞද්ගලික තේ ඇසුරුම්කරුවන්ට අවසර ලබාදීම
10- දේශීය තේ ප්‍රවර්ධනය

### 3.3.2. විදේශ තේ ප්‍රවර්ධන කාර්යාල සහ වෙළඳපොළ ආවරණ

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එ.අ.එ. හා රුසියානු ධූත මණ්ඩල සේවාවට අනුයුක්තව විදේශීය තේ ප්‍රවර්ධන ඒකක 2 ක් පවත්වාගෙන යනු ලැබේ. එ.අ. එමීර් රාජ්‍යයේ පිහිටි කාර්යාලය මැදපෙරදිග/ ගල්ෆ්/ උතුරු අප්‍රිකානු කලාපයේ තේ ප්‍රවර්ධන කාර්යයෙහි වගකීම දරන අතර මොස්කව් නුවර පිහිටි කාර්යාලය රුසියානු සමුහාණ්ඩුව තුළ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යයන් තුළ තේ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් නියැලී සිටී. අනෙකුත් වෙළඳපොලවල් තුළ ලංකා තේ ප්‍රවර්ධන කටයුතු විදේශයන්හි අදාළ වෙළඳ කාර්යාල/ ශ්‍රී ලංකා ධූත මණ්ඩල සේවාව හා ඒකාබද්ධ කොළඹ තේ ප්‍රවර්ධන අංශය විසින් සිදුකරනු ලබයි.

### 3.3.3. ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුව

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ තේ කර්මාන්තය පිළිබඳ විශේෂඥයින් 19 දෙනෙකුගෙන් ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුව සංයුක්ත වේ. අපනයනය කරනු ලබන සෑම තේ කිලෝග්‍රෑමයකින්ම රු.3.50ක ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ධක් පැනවීම මඟින් වර්ෂ 5 ක කාලපරිච්ඡේදයක් තුළ ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන 6.2 (එ.ජ.ඩො.මිලි. 50) ක මුදලක් උත්පාදනය කිරීමට ඇස්තමේන්තු කර ඇති අතර 2013 වර්ෂයේදී රුපියල් මිලියන 1.15ක් රැස්කර තිබුණි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ 2014-2016 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රමෝපා අලෙවිකරණ සැලසුම සකස් කිරීම පිළිබඳ වගකීම දරනු ලබන්නේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුවයි. 2013 වර්ෂයේදී කමිටුව විසින් රැස්වීම්වාර 3ක් පවත්වන ලද අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීමට ලක්වනු පිණිස තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යෝජනා ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිගේ නායකත්වයෙන් යුතු සාමාජිකයින් අටදෙනෙකුගෙන් සමන්විත වන අතර ලංකා තේ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු, දේශීය තේ ප්‍රවර්ධන කටයුතු සහ වෙළඳපොල පර්යේෂණ සඳහා ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීම පිළිබඳ අගයනු පිණිස 2013 වර්ෂයේදී රැස්වීම් 9ක් පවත්වන ලදි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රමෝපා ගෝලීය සන්නිවේදන සැලසුම කෙටුම්පත් කිරීම 2013 වර්ෂයේදී නිම කරන ලදි. විශ්ව තේ ප්‍රචාරණ කටයුතු දියත් කිරීම සඳහා ප්‍රචාරණ නියෝජිත ආයතනයක් තෝරා ගැනීම පිණිස අමාත්‍යමණ්ඩල අනුමත සාකච්ඡා කමිටුවේ අවසාන තිරණය බලාපොරොත්තුවෙන් පසුවේ.

### 3.3.4. වෙළඳපොලවල් වලට සහභාගී වීම

ලංකා තේ සන්නම් ප්‍රවර්ධනය කරනු ලබන තෝරාගත් වෙළඳපොලවල් තුළ පැවැත්වෙන ජාත්‍යන්තර ආහාර හා පාන පොළවල්වලට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා තේ ආනයනකරුවන්ට සහාය වීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සිරිතකි. ශ්‍රී.ලං.තේ.ම. 2013 වර්ෂයේදී පහත සඳහන් වෙළඳපොවල්වලට සහභාගී වූ අතර පුද්ගලික අංශයට තම ලංකා තේ අපනයන ප්‍රමාණය සහ වටිනාකම වැඩිකරගැනීමට හැකිවන පරිදි කණ්ඩායම් ස්වභාවයේ සැපයුම් සේවා සම්බන්ධීකරණය සිදුකරන ලදි.

1- ප්‍රොඩෙක්ස්පෝ-රුසියා-පෙබරවාරි
2- ගල්ෆ් ෆුඩ් 2013 එ.අ.එ.-පෙබරවාරි
3- ෆුඩ් ඇන්ඩ් ඩ්‍රින්ක් වැඩසටහන 2013-ලංඩන්-මාර්තු
4- SACC-කුන්මිං චයිනා-ජුනි
5- ජාත්‍යන්තර කෝපි සහ තේ ප්‍රදර්ශනය, සිංගප්පූරුව (එක්ස්පෝ-2013) -මාර්තු
6- ඉන්දියාවේ බැංගලෝරයේ පැවැත්වූ ශ්‍රී ලංකා තුන්දින මෙගා ප්‍රවර්ධන වැඩසටහන
7- ඉන්දියාවේ මුම්බායිහි පැවැත්වූ ශ්‍රී ලංකා තුන්දින මෙගා ප්‍රවර්ධන වැඩසටහන
8- ජාත්‍යන්තර තේ පොළ, හොංකොං-අගෝස්තු
9- සමර් ඇන්ඩ් ෆුඩ් ෆෙයාර්-ඕස්ට්‍රේලියාව-ජුනි/ජුලි
10- ෆුඩෙක්ස් ජපන්-මාර්තු
11- SIAL චයිනා-චීනය-මාර්තු
12- ෆුඩ් තායිපෙ-තායිවානය-ජුනි
13- වර්ල්ඩ් ෆුඩ්, මොස්කව්-සැප්තැම්බර්
14- Izmir International Fair - තුර්කිය-අගොස්තු/සැප්තැම්බර්
15- වර්ල්ඩ් ෆුඩ් යුක්රේන් - නොවැම්බර්

16- Anuga Trade Fair 2013 - Colonge Germany– ඔක්තෝම්බර්
17- Shenzam International Tea Fair චීනය- දෙසැම්බර්




*ඡායාරූපය 3.3. - වර්ල්ඩ් ෆුඩ්- මොස්කව්- 2013*




*ඡායාරූපය 3.4. -Izmir International Fair - තුර්කිය*




ඡායාරූපය 3.5. - ජාත්‍යන්තර තේ පොළ- හොංකොං




ඡායාරූපය 3.6. -Anuga Trade Fair2013 - ජර්මනිය

### 3.3.5. UNI National ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන

UNI National "ලංකා තේ" ප්‍රවර්ධන වැඩසටහන අනෙකුත් තේ සම්භව හමුවේ ලංකා තේ ප්‍රචාරය කිරීම හා අදාළ වේ. තේ මණ්ඩලය විසින් විදේශයන්හි තේ ප්‍රවර්ධන ඒකක සහ ශ්‍රී ලංකා ධූතමණ්ඩල සේවාවේ වානිජ අංශ හරහා විදේශ වෙළඳපොලවල් තුළ UNI National ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබේ. මාධ්‍ය ප්‍රචාරණය, එළිමහන් ප්‍රචාරණය, දුව තේ සේවා, තේ පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ මෙන්ම අනෙකුත් මහජන සම්බන්ධතා කටයුතු වූ කලි මණ්ඩලය විසින් පවත්වන ලද UNI National ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රධාන අංගයන්ය.

### 3.3.6. වර්ගීය තේ ප්‍රවර්ධනය

අනෙකුත් පානවර්ග හමුවේ තේ ප්‍රවර්ධනය කිරීම වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතුවලට ඇතුළත් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර හා කෘෂිකර්ම හා සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇ.එ.ජ. තේ සංවිධානය, එ.ජ. ජාත්‍යන්තර තේ කමිටුව සහ ජපාන තේ සංගමය යන ආයතනවල සාමාජිකයෙකි. වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු මෙම සංවිධාන හරහා සිදුකරනු ලබයි. වර්ගීය තේ ප්‍රවර්ධනයේදී ප්‍රධාන වශයෙන් තේ සහ සෞඛ්‍ය යන සංකල්ප කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර එය පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මහජන සබඳතා කටයුතු හරහා සිදු කෙරේ. ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තෝරාගත් රටවල් තුළ වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු 2013 වර්ෂයේදී තේ සංගම් සහ සභා වෙනුවෙන් ප්‍රචාරණ වැය සඳහා දායකත්වය ලබාදී ඇත.

### 3.3.7. වෙළඳ ලාංඡන ආරක්ෂා කිරීම

#### සිංහ ලාංඡන වෙළඳසලකුණ ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය ලංකා තේ සිංහ ලාංඡන වෙළඳ සලකුණේ නෛතික හිමිකරුවාය. ලංකා තේ සිංහ ලාංඡනය ශ්‍රී ලංකාව තුළ හා අනෙකුත් රටවල්වල ලියාපදිංචි කිරීම හා අලුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අංශය විසින් සිදුකරයි. 2013 වර්ෂයේ අවසානය වන විට සිංහ ලාංඡනය රටවල් 38ක ලියාපදිංචි කර ඇත. ඒ ඒ අපනයන අන්තවලට නියමිත අවම ප්‍රමිතියට වඩා ඉහළ, ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කරන ලද ISO 3720 ප්‍රමිතියට අනුකූලවන 100%ක්ම ලංකා තේවලින් නිෂ්පාදිත අගය එකතු කළ සන්නාම සහිත තේ නිෂ්පාදන (තේ බෑග් සහ තේ ඇසුරුම්) සඳහා පමණක් සිංහ ලාංඡනය භාවිතා කිරීමට අවසර දෙනු ලැබේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී චීනයේ සහ තායිවානයේ සිංහ ලාංඡන ලියාපදිංචිය සම්පූර්ණ කරන ලදී. සිංහ ලාංඡනය ව්‍යාජ ලෙස යොදාගැනීම සහ අදාළ නීති උල්ලංඝනය කිරීම අධෛර්ය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ, එ.අ.එ. ජෝර්දානයේ සහ තුර්කියේ පුවත්පත්වල සිංහ ලාංඡනය පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනයක් පලකරන ලදී.

### 3.3.8. භූගෝලීය දර්ශක යටතේ ලංකා තේ, කලාප නාම සහ ලාංඡන ලියාපදිංචි කිරීම

"ලංකා තේ" සහ වෙනත් කෘෂි -දේශගුණික තේ වර්ග හතක් (නුවරඑළිය, ඌව, දිඹුල, උඩපුස්සැල්ලාව, මහනුවර, රුහුණ සහ සබරගමුව) භූගෝලීය දර්ශක වශයෙන් සුරැකීමට අවශ්‍ය නීති සහ රෙගුලාසි ලෝක වෙළඳ සංවිධානයේ TRIP ගිවිසුම යටතේ තිබෙන විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබේ. විශේෂයෙන්ම විදේශ ඇසුරුම් කොන්ත්‍රාත්කරුවන් විසින් "ලංකා තේ" සහ අනෙකුත් කලාප තේ නාම අවභාවිතය වැළැක්වීමට පමණක් නොව භූගෝලීය දර්ශක යටතේ අලෙවි කෙරෙන ලංකා තේ සඳහා අගයක් සහ විශිෂ්ටත්වයක් එකතු කිරීමටද එය ඉවහල් වේ. ලංකා තේ, කලාප නාම සහ ලාංඡන සහතිකකරණ සලකුණු ලෙස දේශීය වශයෙන් ලියාපදිංචි කිරීම මෙම වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

ලංකා තේ සහ කෘෂි-දේශගුණික කලාප තේ නාම හත භූගෝලීය දර්ශක වශයෙන් හෝ සහතිකකරණ සලකුණු වශයෙන් ජාත්‍යන්තර වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් භාර ගැනීම 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර දැනට එය ක්‍රියාත්මක වෙමින් පවතී.

"ලංකා තේ" ලියාපදිංචිය සඳහා වන අයදුම්පත්‍ර ඇ'එ'" ටියුනීසියාව" රුසියාව" යුක්රේනය" ඇසර්බෙයිජාන්" එ.රා., ජපානය, කැනඩාව, ඔස්ට්‍රේලියාව, එ.අ.එ., ඉරානය, තුර්කිය, ජෝර්දානය, ඉරාකය, ලිබියාව, කුවේටය, සෞදි අරාබිය, සිරියාව, ඊජිප්තුව, ලෙබනනය සහ ජෝර්දානය යන රටවල් 20 තුළ ගොනුගත කර තිබේ. කලාප තේ නාම සහ ලාංඡන ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත් එ.රා., ඇ.එ.ජ., ජපානය, කැනඩාව, ඔස්ට්‍රේලියාව යන රටවල් 5 තුළ ගොනුගත කොට ඇති අතර ජපානයේ සහ ඇ.එ.ජනපදයේ ලියාපදිංචිය සම්පූර්ණ කොට ඇත.



ඡායාරූපය 3.7. - බංගලාදේශ තේ ප්‍රවර්ධන වැඩසටහන




ඡායාරූපය 3.8. - බීජිංවල පැවැත්වූ විශේෂ ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන

### 3.3.9. ඕසෝන් හිතකර පවිත්‍ර ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම

ඕසෝන් හිතකර තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතිකකරණ සලකුණක් වශයෙන් ඕසෝන් හිතකර පවිත්‍ර ලංකා තේ ලාංඡනය ශ්‍රී ලංකාවේදී ලියාපදිංචි කර ඇත. නිරෝධායනිය නොවන සහ පූර්ව නැව්ගත කිරීම් කාර්යයන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතා නොකිරීම සඳහා මොන්ට්‍රියල් ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කර ඇත. තේ වගාවේදී මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතා නොකර පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරමින් තේ ක්ෂේත්‍රය සඳහා වන මෙම ව්‍යාපෘතිය 2002 වර්ෂයේදී සාර්ථක ලෙෂ ක්‍රියාත්මක කරන ලද අතර 2007 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් Montreal Protocol Implementers Awardසම්මානය දිනාගන්නා ලදි. මේ ආකාරයට ඕසෝන් හිතකර තේ නිපදවන ලෝකයේ පළමු රට බවට ශ්‍රී ලංකාව පත්වුන අතර තවමත් මේ ගෞරවයෙන් පිදුම් ලබන තේ නිපදවන එකම රට වශයෙන් සැලකේ.

ඕසෝන් හිතකර පවිත්‍ර ලංකා තේ ලාංඡනය තේ වර්ග 16ක් සඳහා භාවිත කිරීම පිණිස තේ අපනයනකරුවන් 9 දෙනෙකු ශ්‍රී.ලං.තේ.ම. බලපත්‍ර ලබාගෙන ඇත.

එ.රා., ඇ.එ.ජ., ජපානය, කැනඩාව, ඔස්ට්‍රේලියාව, රුසියාව, යුක්රේනය, ඇසර්බෙයිජානය, වියට්නාමය, දකුණු අප්‍රිකාව, නවසීලන්තය, තායිවානය, චීනය, සිංගප්පූරුව, මලයාසියාව, හොංකොං, චිලි, දකුණු කොරියාව, එ.අ.එ., ඉරානය, ඉරාකය, කුවේටය, සිරියාව, ලිබියාව, තුර්කිය, ජෝර්දානය, සෞදි අරාබිය, ඊජිප්තුව, ලෙබනනය සහ ටියුනීසියාව යන රටවල් 30 ඕසෝන් ලාංජන ලියාපදිංචිය සඳහා අයදුම්පත් යොමුකොට ඇත. සිරියාව, මලයාසියාව, ටියුනීසියාව සහ ජපානය යන රටවල ඕසෝන් ලාංජනය ලියාපදිංචි කිරීම සම්පූර්ණ කොට ඇත.

### 3.3.10. අමාත්‍ය මට්ටමින් ද්විපාර්ශ්වික සාකච්ජා පැවැත්වීම

2013 වර්ෂයේදී ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලයේ ලතින් ඇමරිකානු සංචාරයේදී ආජන්ටිනාවේ ශක්තිමත්ම වානිජ මණ්ඩලය ලෙස සලකනු ලබන

Santa Fe නිලධාරීන් සමඟ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම ඉතා ඵලදායී රැස්වීම් පැවැත්වූහ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ පැවැත්වූ රැස්වීමේදී වර්තමානයේ ශ්‍රී ලංකා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා නායකත්වය දරන ITPFය සමඟ සම්බන්ධ වීම සඳහා එකඟත්වය ලැබුණි. ආජන්ටිනාවේ තේ පාසැල වෙත කළ සංචාරයේදී ආජන්ටිනාවේ විවිධ වර්ගවල තේ රසවිඳීමට නියෝජිත කණ්ඩායමේ සාමාජිකයින්ට අවස්ථාව උදාවිය. ආජන්ටිනාවේ එක් විශාල තේ කර්මාන්තශාලාවක් වූ Las Marias තේ කර්මාන්තශාලාවේ ප්‍රධානියා හමුවීමටද අවස්ථාව සලසා ගන්නා ලදී. NIPM සහ ආජන්ටිනාවේ තේ පාසැල අතර හවුල් ව්‍යාපාරයක් ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස ගරු අමාත්‍යතුමා නිර්දේශ කළේය. ආජන්ටිනාවේ එකම තේ සමාජය වූ EL Club Del Tea යෙන් කරුණු විමසා ආජන්ටිනාවේ තේ රසකාමී ආරාධිත ප්‍රේක්ෂක පිරිසක් ඉලක්කකොට ශ්‍රී ලංකා තේ පිළිබඳ මනා ලෙස සැලසුම් කළ උසස් වෘත්තීයමය වැඩමුළුවක්/ සම්මන්ත්‍රණයක් අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) විසින් සංවිධානය කරනු ලැබීය.

දකුණු අප්‍රිකානු සංචාරයේ දෙවැනි අදියර වූයේ චිලී සංචාරයයි. ආජන්ටිනාවේ සහ චිලී සංචාරයෙන් අනතුරුව අමාත්‍යමණ්ඩල සංචාරයේ අවසානය වශයෙන් රාජ්‍ය සහ පෞද්ගලික ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් තේ නියෝජිත මණ්ඩලය බ්‍රසීලයේ Sao Paulo නගරයට පැමිණියහ. ඇමතිතුමා ප්‍රමුඛ රජයේ නිලධාරීහු ඔවුන් ආජන්ටිනාවේ හා චිලී රටේ සිදුකළ සංචාරයේදී එම රටවල්වල පාරිභෝගිකයන් සමඟ පැවැත්වූ රැස්වීම් සහ සාකච්ඡා පිළිබඳව බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති එච්.ඊ. රාජා එදිරිසූරිය මහතාට සහ ධූත මණ්ඩල නියෝජ්‍ය ප්‍රධානී මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතාට කරුණු පැහැදිළි කළහ. නියෝජිත කණ්ඩායම ජුනි 25 සිට 28 දක්වා Sao Paulo හි Expo Center Norte යේ පැවැත්වූ Sial Brazil 2013 ප්‍රදර්ශනයට සහභාගි වීම බ්‍රසීල සංචාරයේ කැපී පෙනුන අංගය විය.

### 3.3.11. ජාත්‍යන්තර සංසදවලට සහභාගි වීම - ජාත්‍යන්තර තේ නිපැයුම්කරුවන්ගේ සංසදය

ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ අගනා මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ කොළඹදී ජාත්‍යන්තර තේ නිපදවන්නනගේ සංසදය පිහිටුවමින් තේ කර්මාන්ත ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණක් සනිටුහන් කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා අත්වැල් බැදගත්තේය. තේ නිපදවන රටවල පොදු යහපත ප්‍රවර්ධනය සහ සංවර්ධනය උදෙසාම කැපවුනු සංගමයක් පිහිටුවීම සඳහා විශාලතම ලෙස ලෝකයේ තේ නිපදවන රටවල්වල අමාත්‍යවරු සහ උසස් මටටමේ රාජ්‍ය සහ පෞද්ගලික ක්ෂේත්‍රයේ නිලධාරීහු 2013 ජනවාරි 21 වැනි දින ශ්‍රී ලංකාවේ කොළඹදී රැස්වූහ. ලෝක තේ කර්මාන්තයේ අතිශය වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා නිශ්චිත ගෝලීය ආයතනයක් නොමැතිවීම ක්ෂේත්‍රයට විශාල අඩුපාඩුවක්ව තිබුණි. තේ සම්බන්ධයෙන් ආ.කෘ.සං./IGG යේ වර්තමාන සභාපතිත්වය දරන ශ්‍රී ලංකාව ජාත්‍යන්තර තේ නිපදවන්නන්ගේ සංසදය නමින් යුත් සංගමයක් පිහිටුවීම සඳහා පියවර ගනු ලැබූ අතර එය කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටල් සමුළු ශාලාවේදී ස්ථාපිත කිරීම සඳහා සුවිශාල දායකත්වයක් දැරීය. චීනය සහ කෘ.ආ.සං. නිරීක්ෂකත්වය දරන මෙම ඓතිහාසික සංසදයේ ආරම්භක සාමාජිකයන් වන්නේ ලෝකයේ විශාලතම තේ නපදවන රටවල් හතක් වන ඉන්දියාව, කෙන්යාව, ඉන්දුනීසියාව, මලාවි, රුවන්ඩාව, ඉරානය සහ ශ්‍රී ලංකාවයි.

ජා.තේ.නි.සං. ව්‍යවස්ථාව ලෝක තේ නිෂ්පාදනයේ 80% කට වැඩි ප්‍රමාණයක් නිපදවන ප්‍රධාන රටවල්වල අමාත්‍ය නියෝජිතයන් විසින් අනුමත කරන ලදී. මෙම රටවල්වලින් පැමිණි නියෝජිතයින් විසින් ඒකාබද්ධ නිවේදනයකට අත්සන් තබන ලද අතර ලොව පළමු ජාත්‍යන්කර තේ නිපදවන්නන්ගේ සංගමයේ ලේකම් කාර්යාලය ලෙස ශ්‍රී ලංකාව තෝරා පත්කරගන්නා ලදී. ඉහළ ආහාර සුරැකුම් ප්‍රමිත, ඉහළ යන ප්‍රවාහන පිරිවැය, බදු සහ බදු නොවන සාධකවලට අමතරව දේශගුණික විපර්යාස සංසිද්ධි, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, අඩු අස්වනු සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ ගැටළු ඇතැම් අභියෝග ලෙස හඳුනාගෙන තිබේ. ඉදිරියේදී ජා.තේ.නි.සං. මෙම පොදු ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත.


INTERNATIONAL TEA PRODUCERS' FORUM
ORGANISED BY THE MINISTRY OF PLANTATION INDUSTRIES AND SRI LANKA TEA BOARD
COLOMBO, SRI LANKA - 21ST & 22ND JANUARY, 2013
CEYLON TEA
SYMBOL OF QUALITY
ජා.තේ.නි.සං. පළමු රැස්වීම - කොළඹ

### 3.3.12. විදේශ නියෝජිත කණ්ඩායම්

සමාලෝචනය භාජනය වූ වර්ෂය තුළදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉරාක, චීන සහ ජපාන නියෝජිත කණ්ඩායම්වලට පහසුකම් සැපයීම සහ අනුග්‍රහය දැක්වීම සිදුකළ අතර ඒ රටවලට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන පරිදි වෙළඳ සබඳතා ගොඩනැගීම, අදහස් හුවමාරු කරගැනීම සහ දැනුම බෙදා ගැනීම යන අභිමතාර්ථ ඇතිව ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ උනන්දුකාර පාර්ශ්වකරුවන් සමඟ වෙළඳහමු සංවිධානය කරන ලදි.

### 3.3.13. ප්‍රවර්ධන/ තොරතුරු ප්‍රකාශන

වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රවර්ධන/ තොරතුරු ප්‍රකාශන නිකුත් කරන ලදි.

1- ද්වි-මාසික පුවත් හසුන් (06)
2- කාර්තුමය තේ අලෙවි සමාලෝචනය-2013 (04)

### 3.3.14. දේශීය තේ ප්‍රවර්ධනය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී ශ්‍රී.ලං.තේ.ම. පහත සඳහන් දේශීය වෙළඳ ප්‍රදර්ශන සහ වැඩසටහන්වලට සහභාගී වී ඇති අතර මාධ්‍ය ප්‍රචාරණය, ද්‍රව තේ සේවා, ශ්‍රී.ලං.තේ.මං. ඇසුරුම් මලු විකිණීම, ප්‍රවර්ධන ද්‍රව්‍ය බෙදාහැරීම වැනි ප්‍රවර්ධන කටයුතු පවත්වා ඇත.

- ජාත්‍යන්තර ආරක්ෂණ සම්මන්ත්‍රණය-2013
- දැයට කිරුළ 2013- අම්පාර (පෙබරවාරි 4 සිට 10 දක්වා)
- දළඳා පෙරහැර මහනුවර (2013 අගෝස්තු 13 සිට 20 දක්වා)
- ස්වභාවික රබර් නිෂ්පාදනය කරන රටවල්වල සංගමයේ වාර්ෂික සැසිය- ගලදාරි හෝටලය

#### 3.3.14.1. ශ්‍රී ලංකා තේ සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන සඳහා පැවැත්වූ තේ පිළිබඳ වැඩමුළුව

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා එක්ව තම ශිෂ්‍යයින් සඳහා ඔවුන්ගේ විෂයමාලා තුළ ප්‍රායෝගික තේ රස විඳීමේ සැසි, දේශනවලින් සමන්විත තේ කර්මාන්තය පිළිබඳ මොඩියුලයක් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත. දේශීය ප්‍රවර්ධන අභිමතාර්ථ පිළිබඳ අවධානය යොමුකළ ශ්‍රී.ලං.තේ.ම. මෙම යෝජනාවලට එකඟවුන අතර පුහුණු මොඩියුල පැවැත්විය. ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය වූ කලි ආගන්තුක සත්කාර හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් පුහුණු කරනු ලබන රජයේ අනුමත ශ්‍රී ලංකාවේ එකම ප්‍රමුඛ ආයතනයයි.

#### 3.3.14.2. ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2013 චෝගම් සමුළුවේදී

23 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2013 නොවැම්බර් 15 සිට 17 දක්වා කොළඹදී පවත්වන ලද අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි.

#### 3.3.14.3. සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැති පොදුරාජ්‍ය මණ්ඩල ව්‍යාපාරික සමුළුව (පො.ව්‍යා.ස.)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාර සමුළුවේ ප්‍රධාන අනුග්‍රහයෙකු විය. මෙහිදී ඉතා විශාල අනුග්‍රාහකත්ව ප්‍රතිලාභ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලැබුණි. එවැනි ප්‍රතිලාභ අතරට ලංකා තේ සන්නම ප්‍රචලිත කිරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම, විශේෂ තේ රසවිඳීමේ සැසි පැවැත්වීම, තේ පිළිබඳ වාර්තාමය වැඩසටහනක් දැවැන්ත තිරයක ප්‍රචාරය කිරීම, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා දැන්වීම් පලකිරීම, ලංකා තේ ත්‍යාග වශයෙන් පිරිනැමීමට අවස්ථාව ලැබීම ආදිය ඇතුළත් වේ.

#### 3.3.14.4 ජනකලා කේන්ද්‍රයේ පැවැති වෙළඳ ප්‍රදර්ශනය

කෘෂිකර්ම, නිෂ්පාදන හා සේවා පිළිබඳ “Reflection of Sri Lanka” ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් නොවැම්බර් 13 සිට 17 දක්වා බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදී පැවැත්වුණි. කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශයේ හා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කරන ලදි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ අංශයේ ප්‍රදර්ශනාගාරය සඳහා තේ සමාගම් 25ක් සම්බන්ධීකරණය කරන ලදි. අනෙකුත් ප්‍රවර්ධන කටයුතු යන්නට එළිමහන් ප්‍රදර්ශන ප්‍රදේශය තුළ අමුත්තන්ට තේ අත්දැකීම විඳින අතරතුරම නැරඹීම සඳහා ආදර්ශ තේ

වත්තක භූ දර්ශනයක් නිර්මාණය කර තිබීම, අමුත්තන්ට කර්මාන්තය පිළිබඳ තොරතුරු ලබාදීම, ද්‍රව තේ සේවා සැපයීම සහ තේ කර්මාන්තය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම යනාදි කටයුතු ඇතුළත් විය.

### 3.3.14.5. "අපේ ගම" පරිශ්‍රයේදී පැවැත්වූ ලංකා තේ උත්සවය

2013 පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සහභාගී වූ ප්‍රධාන අමුත්තියන් වෙනුවෙන් ලංකා තේ උත්සවයක් ප්‍රථම වරට පවත්වා ශ්‍රී.ලං.තේ.ම. ශ්‍රී ලංකා තේ කර්මාන්තය ඉතිහාසයේ නවමු පිටුවක් විවර කළේය. මනා ලෙස පිළියෙල කරන ලද තේ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මිහිරි රසැති ආහාර ද්‍රව්‍ය සමඟ පිරිනමා ලංකා තේ උත්සවයට නැවුම් සංකල්පයක් ශ්‍රී.ලං.තේ.ම. එක්කළ අතර පුරෝගාමී ආයතනයක් වශයෙන් ඒ සඳහා සෞන්දර්යාත්මක මැදිහත්වීමක් සිදු කරන ලදි.

### 3.3.14.6. ජාත්‍යන්තර මාධ්‍යකරුවන් සඳහා පැවැත්වූ රාත්‍රී භෝජන සංග්‍රහය

මෙහිදී අපගේ ජාතික ක්‍රිකට් කණ්ඩායම හරහා ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා අවස්ථාව සලසා ගන්නා ලදි. ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ටද මෙම අවස්ථාවට සහභාගී වීමට ආරාධනා කරන ලද අතර සහභාගී වූ සියලුම දෙනාට ලංකා තේ සන්නම් සහිත පසුබිමක සිට ඡායාරූප ගැනීමට අවස්ථාව ලබාදෙන ලදි. ලංකා තේ සන්නම් කිරීමද මෙම අවස්ථාවේදී සිදුවිය.

### 3.3.14.7. හික්කඩුවේදී පැවැති පොදුරාජ්‍ය මණ්ඩලීය මහජන සංසදය

සහභාගී වූ සියලුදෙනා අයිස් තේ පිරිනමමින් පිළිගනු ලැබූ අතර ලංකා තේ ඇසුරුම් ත්‍යාග 1000ක් සහ විස්තර පත්‍රිකා ඔවුන් අතර බෙදාදෙන ලදි.

### 3.3.15. තේ අලෙවි මධ්‍යස්ථාන

ශ්‍රී.ලං.තේ.ම. පරිශ්‍රයේ පිහිටි තේ අලෙවි මධ්‍යස්ථානය විසින් තේ මණ්ඩල ඇසුරුම් පෞද්ගලික තේ සමාගම් දාහතක තෝරාගනු ලැබූ තේ නිෂ්පාදන මාලාවක් අලෙවි කරන ලදි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන මෙම අලෙවි මධ්‍යස්ථානය මඟින් පාරිභෝගිකයාට පුළුල් ලංකා තේ සන්නම් මාලාවක් අතරින් හොඳම තේ තෝරා ගැනීමට අවස්ථාව ලැබෙනවා පමණක් නොව එකම අලෙවිහලක් තුළ ඉතා පහසුවෙන් වර්තමානයේ පවතින තේ බාණ්ඩවල විවිධත්වය හා ඒවායේ වර්ග දැකබලා ගැනිමටද අවස්ථාව සැලසේ. 2013 වර්ෂයේදී එම අලෙවිහලේ විකුණුම් තුළින් රුපියල් මිලියන 18.49 ක ආදායමක් උපයාගන්නා ලද අතර පූර්ව වර්ෂය හා සංසන්දනය කිරීමේදී එමඟින් 17% ක අති විශාල වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී.ලං.තේ.ම. ඇසුරුම් අලෙවිය මඟින් රුපියල් මිලියන 11.7 ක් උපයනු ලැබූ අතර පුද්ගලික අංශයේ තේ වර්ග විකිණීම තුළින් රුපියල් මිලියන 5.4 ක ආදායමක් උපයා ගන්නා ලදි.

### 3.3.16. ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා දායකත්වය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2013 වර්ෂයේ සිට ඉදිරි වසර තුනක කාලපරිච්ඡේදය සඳහා ජාතික පිරිමි සහ කාන්තා ක්‍රිකට් කණ්ඩායම්වලට අනුග්‍රහය දැක්වීම සඳහා වන ඓතිහාසික ගිවිසුමකට ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය සමඟ අත්සන් තැබීය. මෙය ලෝක ප්‍රසිද්ධ සන්නම් සහිත රජයේ සංවිධානයක් ක්‍රිකට් කණ්ඩායමේ නිල විදේශ අනුග්‍රාහක වශයෙන් එ.ජ.ඩො. මිලියන 4 ක් මුදලකට අවුරුදු 3 ක කාලයකට තෝරාගනු ලැබූ පළමු අවස්ථාවයි. රටට ගෞරවයක් සහ කීර්තියක් අත්කර දීමට ශ්‍රී ලංකා තේ (ලංකා තේ) වලට හා ජාතික ක්‍රිකට් කණ්ඩායමට හැකිවී තිබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට අනුග්‍රහය දක්වන්නේ ඉමහත් ආඩම්බරයෙනි. ලොව පුරා සිටින මිලියන 62ක් පමණ වූ රූපවාහිනී ප්‍රෙක්ෂකයින් ඉදිරි මාස 12ක කාලය තුළ පැවැත්වෙන ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලි නරඹනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙලෙස ලංකා තේ සඳහා නිර්මාණය වී ඇති අවස්ථා අති විශාලය.

### 3.3.17. පැසැසුම් තේ බෙදාහැරීම

"ලංකා තේ" ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී.ලං.තේ.මණ්ඩලය විසින් රුපියල් මිලියන 3ක් වටිනා තේ පැසැසුම් පදනමක් මත පහත සඳහන් ආකාරයට නිකුත්කොට ඇත.

1- විදේශයන්හි ශ්‍රී ලංකා ධූත කණ්ඩායම් 40 ක් සඳහා පැසැසුම් තේ පිරිනැමීම
2- ද්‍රව තේ සේවා සහ ජාත්‍යන්තර වෙළඳපොලවල්වලදී තේ බෙදාහැරීම
3- ප්‍රවර්ධනය සඳහා විශේෂ ප්‍රභූන්ට / නිලධාරීන්ට තේ පිරිනැමීම




ඡායාරූපය 3.10. - ජාත්‍යන්තර ආරක්ෂක සම්මන්ත්‍රණය-2013- ගලදාරි හෝටලය



ඡායාරූපය 3.11. - අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වෝගම් සමුළුවේදී ආදර්ශ තේ වත්ත විවෘත කිරීම




ඡායාරූපය 3.12. - චෝගම් සමුළුවේ තේ වත්ත




ඡායාරූපය 3.13. - චෝගම් සමුළුව- ශ්‍රී.ලං.තේ.ම. කුටිය



ඡායාරූපය 3.14. - චෝගම් සමුළුවට සපැමිණි රාජ්‍ය නායක ආර්යාවන් සඳහා පැවැත්වූ තේ පැන් සාදය




ඡායාරූපය 3.15. - ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සඳහා අනුග්‍රාහකත්වය




*ඡායාරූපය 3.16. - ජපාන තේ කෞතුකාගාරය සඳහා තේ පරිත්‍යාග*

### 3.4. තේ රස පරීක්ෂා කිරීමේ ඒකකය

#### 3.4.1. ප්‍රධාන කාර්යය/අරමුණු

**විශේෂඥ තේ රස පරීක්ෂකයින් විසින් තේ රස පරීක්ෂා කිරීම**

**අවම ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම, තේවල ISO 3720 සහ ISO 112387 ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණය කිරීම, පාරිභෝගික ඇසුරුම් සඳහා සන්නම් සහිත නිෂ්පාදනවලට සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම හා අනුමැතිය ලබාදීම සහ කොන්ත්‍රාත් ඉදිරිපත් කිරීම මෙම අංශයෙන් සිදුවේ.**

#### 3.4.2. තේ රස පරීක්ෂකවරුන්ගේ විශේෂඥ මණ්ඩලය

**මෙම ස්වාධීන මණ්ඩලය සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. සී.එන්.පී ද සිල්වා මහතා (තේ රස පරීක්ෂාව පිළිබඳ අවුරුදු 40කට වඩා වැඩි අත්දැකීම් සහිතයි.)**

**වී.ඒ.ඒ. පෙරේරා මහතා (අවුරුදු 30 කට වඩා වැඩි පළපුරුද්දක් සහිතයි.)**

**උනන්දුකාර පාර්ශ්වකරුවන් නියෝජනය කරනු ලබන මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් එක් එක් සංගම් නියෝජිතයන්ගෙන් සමන්විත වේ.**

- **කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය**
- **කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය**
- **ලංකා වැවිලිකරුවන්ගේ සංගමය**
- **ශ්‍රී ලංකා කුඩා තේවතු සංවර්ධන සමිති සම්මේලනය**
- **තේ අපනයන සංගමය**
- **පෞද්ගලික තේ කර්මාන්තශාලා අයිතිකරුවන්ගේ සංගමය**

#### 3.4.3. අනුගමනය කරනු ලබන තේ රස පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය

**ශ්‍රී.ලං.තේ.ම. ඉන්ද්‍රිය සංවේදී පරීක්ෂා කිරීම් භාවිත කරමින් තේ පිළියෙල කිරීම පිළිබඳ ISO 3102 ක්‍රමවේදය අනුගමනය කරයි.**

#### 3.4.4. විශේෂඥ මණ්ඩල තේ රසපිරික්සුම් සැසි පැවැත්වීම

- **පූර්ව වෙන්දේසි තේ**
- **විශේෂයෙන් පරීක්ෂා කරන ලද තේ**
- **ආනයනයට පෙර තේ සාම්පල**
- **සෑජු විකුණුම්**
- **නව අපනයන සමාගම් සඳහා තේ රසපරීක්ෂකවරුන් තක්සේරු කිරීම**

මණ්ඩලයේ තිරණ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අංශවලට ඉදිරිපත් කරනු ලැබේ.

### 3.4.5. සිංහ ලාංඡන ඇසුරුම් ලියාපදිංචි කිරීම

ගුණාත්මක තත්ත්වයේ සහ සම්භවය ලත් රටේ සංකේතය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පූර්ණ හිමිකාරිත්වය දරන සිංහ ලාංඡනය තම පාරිභෝගික ඇසුරුම්වල ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් අපනයන ගමනාන්ත සහ වෙළඳපොල අනුව තම නිෂ්පාදන ඇගයුම් කළ හැකිවනු පිණිස ඒ සඳහා අයදුම්පත් යොමුකළ යුතුය.

සිංහ ලාංඡනය භාවිත කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සන්නමකට රුපියල් 5000+ (එ.අ.බ.+ජා.ගො.බ.) බැගින් අයකරනු ලබන අතර ඒ සඳහා සහතිකයක් නිකුත් කරනු ලැබේ. එම සහතිකය වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා වලංගු වේ.

සිල්ලර ඇසුරුම් සඳහා සිංහ ලාංඡනය භාවිතා කිරීමට අයිතිය ලබාදීමේදී 2013 වර්ෂයේදී නව සන්නම්/ අලුත්කිරීම්, අතිරේක ඇසුරුම්වලට අදාළ අයදුම්පත් 772 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි.

### 3.4.6. සිංහ ලාංඡනය ප්‍රදර්ශනය කරන ඇසුරුම්වල තත්ත්වය අධීක්ෂණය කිරීම. (දේශීය/විදේශීය/තේ මණ්ඩලවල ඇසුරුම් මාලා)

#### 3.4.6.1. දේශීය අධීක්ෂණය

කොළඹ සුපිරි වෙළඳපොලවල් සහ සිල්ලර වෙළඳසැල්වල තිබෙන විශේෂයෙන්ම සිංහ ලාංඡනය සහිත සන්නම්වලින් අහඹු ලෙස ලබාගත් නියැදියක් පරීක්ෂාවට ලක්කරනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බොහෝ කලක සිට ලියාපදිංචි වී සිටින ප්‍රසිද්ධ සැලකියයුතු වෙළඳපොල කොටසකට හිමිකම් කියන ඇසුරුම්කරුවන් සඳහා ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය භාවිතා කිරීමට අවසර දෙනු ලබන අතර පසුව අධීක්ෂණ කටයුතු ද සිදුකෙරේ.

#### 3.4.6.2. විදේශීය අධීක්ෂණය

විදේශීය අධීක්ෂණ ක්‍රමය යටතේ සිංහ ලාංඡනය සහිත තේ සාම්පල (80%) ද ඇතුළත්ව සියලුම අපනයන සාම්පල නැව්- පූර්ව අධීක්ෂණ ක්‍රමය යටතේ නි.තේ.කො. (අපනයන) විසින් කරනු ලබන අතර ඉන් අනතුරුව නැව්ගත කිරීමට පෙර අධීක්ෂණ කටයුතු කිරීම සඳහා රස පිරික්සුම් ඒකකයට ඉදිරිපත් කරනු ලැබේ.

අපගේ විදේශීය කාර්යාංශයන් සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ උපදේශකවරුන් විසින් නිරන්තරයෙන්ම විදේශීය වෙළඳපොලේ තිබෙන සිංහ ලාංඡනය දැක්වෙන ඇසුරුම් පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම පිණිස ඉදිරිපත් කරනු ලැබේ.

#### 3.4.6.3. තේ මණ්ඩලයේ ඇසුරුම් මාලාව

ශ්‍රී.ලං.තේ.ම. ප්‍රමුඛතම ඇසුරුම් ප්‍රධාන වශයෙන්ම අපගේ අලෙවිහල්වල විකුණනු ලබන අතර විදේශ දූත මණ්ඩල, කාර්යාංශ සහ වෙළඳපොලවල් වෙතද යවනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් තේ රස පරීක්ෂක ඒකකයේ අනුමැතිය ඇතිව නිල ඇසුරුම්කරුවන් විසින් මෙම තේ වෙන්දෙසි හෝ පෞද්ගලික විකුණුම් මාර්ගවලින් තෝරා රැගෙන එනු ලැබේ. මිලදී ගනු ලබන සාම්පල්, අතිරේක සාම්පල් හා මිශ්‍රිත සාම්පල් අවසන් ඇසුරුමට පෙර තේ රස පරීක්ෂා කිරීමේ ඒකකය විසින් පරීක්ෂාවට ලක්කොට අනුමත කරයි

එෆ්.එෆ්.සී.ටී.(500 ග්‍රෑ)

ප්ලාන්ටර්ස් පන්ච් (ග්‍රෑ 100 සහ 250)

මිස්ටි හිල්ස් (ග්‍රෑ 200)

රෝයල් සිලෝන් (ලෝහ බඳුන්- ග්‍රෑ 200)

ෆැමිලි පැක්(ග්‍රෑම් 500 සහ 250)

ග්‍රීන් ටී (ග්‍රෑ 100)

ටී ප්ලකර් (ග්‍රෑ 250 සහ ග්‍රෑ 100)

ලක්සරි බ්ලෙන්ඩ්- වුඩ්න් (ග්‍රෑ 125)

කොනොයිෂර් (ග්‍රෑ 250,200,125 සහ 100)



ඡායාරූපය 3.17. - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රසපරීක්ෂක අංශය

### 3.4.7. වෙන්දේසියට පෙර තේ තත්ත්ව පාලනය සඳහා රස පරීක්ෂා කිරීම

අලෙවියට සති දෙකකට පෙර බ්‍රෝකර්කරුවන් අටදෙනෙකු විසින් ඔවුන්ගේ වෙන්දේසියට පෙර තේ සාම්පල් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඒකකය විසින් පළමුව off- grade, Dust, premium Flowery and BOP 1A තේ සාම්පල දෘශ්‍ය පරීක්ෂාවට ලක්කරනු ලැබේ. ඉන් අනතුරුව ජෛවීය පරීක්ෂණය සිදු කරනු ලැබේ. පරීක්ෂා කිරීමෙන් අනතුරුව තෝරාගත් තේ සාම්පල ඊළඟ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන්නේද නැද්ද යන සාමූහික තීරණය ගැනීම සඳහා රස පරීක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. පසුව එම තීරණය නි.තේ.කො. (අපනයන) වෙත දන්වා යවනු ඇත.

| | |
|---|---|
| දෘශ්‍ය පරීක්ෂාවට ලක්කරන ලද සාම්පල සංඛ්‍යාව- | 148,239 |
| ජෛව පරීක්ෂාව- | 15,465 |
| මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලද වෙන්දේසියට පෙර තේ සාම්පල- සංඛ්‍යාව (මධ්‍යසාර මිශ්‍ර වී ඇතැයි සැකසිතීම මත)- | 372 |
| සිලිකාමය ද්‍රව්‍ය- | 168 |
| අමු තන්තු- | 460 |
| නි.තේ.කො.(අපනයන) විසින් අහඹු පදනම මත ඉදිරිපත් කරන ලද පෙර- වෙන්දේසි තේ සාම්පල (BSL/ESL)- | |
| පරීක්ෂා කරන ලද තේ ප්‍රමාණය- | 2,944 |
| සැකසහිත තේ සාම්පල- | 284 |

### 3.4.8. නැව්ගතකිරීමට පෙර තේ තත්ත්ව පාලනය සඳහා පරීක්ෂා කිරීම

මෙහිදී තේ නැව්ගත කිරීමට පෙර ඒවායේ සිංහ ලාංඡනය භාවිතය, ISO 3720 පරාමිතීන් පිළිබඳ හෝ වෙනත් කිසියම් අපවිත්‍ර වීම් පිළිබඳ පරීක්ෂා කරනු පිණිස නි.තේ.කො.(අපනයන) විසින් තේ සාම්පල උපලේඛනයක්ද සහිතව ඉදිරිපත් කරනු ලැබේ.

නැව්ගත කිරීමට පෙර අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය යටතේ පරීක්ෂා කරන ලද භාණ්ඩ තොග ප්‍රමාණය -5,940

### 3.4.9. ආනයනය කිරීමට පෙර තේවල තත්ත්වය පාලනය සඳහා පරීක්ෂා කිරීම

නි.තේ.කො.(අපනයන) විසින් ආනයනයට පෙර තේ ඒවායේ ආනයනයට ඇති යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂා කරනු පිණිස ආකෘති පත්‍රයක් සමඟ තේ සාම්පල ඉදිරිපත් කරනු ලැබේ. සෑම අයදුම්පත්‍රයක සම්භවය, ශ්‍රේණිය ආදිවශයෙන් වන සාම්පලයේ විස්තර සටහන් කරනු ලැබේ.

ශ්‍රී.ලං.තේ.ම. චක්‍රලේඛ අංක OR/1/65 හා එහි සංශෝධනවල සඳහන් උපදෙස් ප්‍රකාර රස පරීක්ෂක මණ්ඩලය විසින් තේ පරීක්ෂා කිරීම් සිදු කරනු ඇත.

පරීක්ෂා කරන ලද මුළු තේ සාම්පල සංඛ්‍යාව- 1,230

### 3.4.10 තත්ව පාලනය සඳහා පසු ආනයන තේ පිළිබඳ රස පරීක්ෂා කිරීම.

ආනයනය කරනලද තේ තොග ලැබුනු පසු තේ අපනයන අංශය විසින් ඒවායේ සාම්පල ලබාගෙන ගොඩබාන ලද සාම්පල යොමුකිරීම් යටතේ අනුමැතිය ලබාගනු පිණිස එම සාම්පල මෙම ඒකකයට යොමුකරනු ලැබේ.

මෙම සාම්පල තේ රස පිරික්සුම් ඒකකයට ලැබුනුපසු නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) විසින් එම සාම්පල ඒකකයට ලබා දී තිබෙන සාම්පල සමග සංසන්දනය කොට තක්සේරු කරනු ලැබේ.

පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව -810.

### 3.4.11. විශේෂ පරීක්ෂණ යටතේ තේ රස පරීක්ෂා කිරීම

තේවල ශ්‍රේණි,අපවිත්‍ර වීම්, අයි එස් ඕ හෝ වෙනත් කිසියම් සුවිශේෂිතතා පිළිබඳ පරීක්ෂා කරනු පිණිස තේ කොමසාරිස්වරයා හෝ නි.තේ.කො.(අපනයන) විසින් තේ සාම්පල

### 3.4.12 පෞද්ගලික අලෙවි මණ්ඩල තක්සේරු සහතික අනුමත කිරීම

ස්වාධීන බ්‍රෝකර්වරුන්ගේ අනුමැතිය සහිතව අලෙවි බ්‍රෝකර්කරුවෙකු විසින් තේ සාම්පල මෙම ඒකකය වෙත ඉදිරිපත් කළ විට මෙම ඒකකය විසින් පුද්ගලික විකුණුම් සඳහා අනුමැතිය ලබාදෙනු ලැබේ. ඉහත සේවය ලබාදීමේදී තොගයකට රු.500+(එ.අ.බ.+ ජා.ගො.බ.) බැගින් වූ අනුමතකිරීමේ ගාස්තුවක් අයකරනු ඇත. වර්තමානයේ ඉහත යෝජනාක්‍රමය හරිත තේ, කාබනික තේ, විශේෂ තේ සහ කොළඹ වෙන්දේසියේදී විකුණනු නොලබන කුඩා කැබලි තේ වලට සීමා වී ඇත.

පරීක්ෂා කරන ලද සහ අනුමත කරන ලද මුළු පෞද්ගලික තේ තොග ප්‍රමාණය- 7,650

### 3.4.13. ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත් අනුමත කිරීම

මිලදී ගනු ලබන තැනැත්තාගේ අවශ්‍යතාවය මත තෝරාගනු ලබන වර්ග කිහිපයක් සඳහා නිශ්චිත කාලසීමාවකට මෙම අනුමැතිය ලබාදී ඇත. විකුණුම්කරු, ගැනුම්කරු, බ්‍රෝකර් සහ තේ මණ්ඩලය විකුණුම් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇත. ඉහත සේවාව සඳහාද තොගයකට රු.500+(එ.අ.බ.+ ජා.ගො.බ.) බැගින් වූ අනුමත කිරීමේ ගාස්තුවක් අයකරනු ලැබේ.

අනුමත කර ඇති මුළු කොන්ත්‍රාත් ප්‍රමාණය- 1,036

### 3.4.14. ඍජු විකුණුම් අනුමත කිරීම

ඉහත යෝජනාක්‍රමය යටතේ නිෂ්පාදකයාට සහ අපනයනකරුට තම නිෂ්පාදන ඍජුවම විදේශ ගැනුම්කරුවන්ට විකිණීම සඳහා අවසර ලබාදේ. මීට අමතරව හරිත තේ, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට විකිණිය හැකිය. බ්‍රහස්පතින්දා දින පැවැත්වෙන පරීක්ෂණ මණ්ඩලයේදී ඍජු විකුණුම් අනුමත කරනු ලැබේ. මුළු අනුමත කරන ලද විකුණුම්- 1,918

### 3.5. විශ්ලේෂණ රසායනාගාරය

2013 වර්ෂය තුළදී විශ්ලේෂණ රසායනාගාර අංශය විසින් තේ සාම්පලවල රසායනික, ක්ෂුද්‍රජීවී සහ පළිබෝධනාශක ශේෂ පරීක්ෂණ 6640ක් සිදු කරන ලදි. පරීක්ෂා කිරීම සඳහා යොදාගනු ලැබූ එම තේ සාම්පල ක්‍රම දෙකක් ඔස්සේ පරීක්ෂණාගාරය වෙත ලැබුණි: අන්තර් අධීක්ෂණ සේවා (අ.අ.සේ.) සහ බාහිර සහතිකකරණ සේවා (බා.ස.සේ.) ස්ථාපිත කර ඇති නිර්ණායක අනුව වෙන්දේසියට හා නැව්ගත කිරීමට පෙර අහඹුලෙස තේ සාම්පල ලබාගැනීම හා බෙදාහැරීම පිණිස තේ මණ්ඩලය එහි තේ පරීක්ෂක කණ්ඩායම යොදවයි. අන්තර් අධීක්ෂණ යෝජනා ක්‍රමයේදී තේවල සියලුම අපහරණ අවස්ථා ආවරණය කෙරේ. එහිදී තේ නිෂ්පාදකයින්ගේ හා තේ බ්‍රෝකර්වරුන්ගේ ගබඩා, තේ මිශ්‍ර කරන්නන් සහ ඇසුරුම්කරුවන් හා අපනයනකරුවන්ගේ ගබඩා ආවරණය කෙරේ. බාහිර සහතිකකරණ සේවාව මඟින් ගැනුම්කරුවන්ගේ අවශ්‍යතා මත තේ අපනයනකරුවන්ගේ සහතිකකරණ අවශ්‍යතා ආවරණය කෙරේ. 2013 වර්ෂයේදී සිදු කරන ලද සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාවෙන් පරීක්ෂණ 5684ක් (85.6%ක් පමණ) අභ්‍යන්තර අධීක්ෂණ සේවා යටතේ ලද තේ සාම්පල මත පදනම්ව සිදු කරනු ලැබූ අතර බාහිර සහතිකකරණ සේවාව යටතේ පවත්වනලද මුළු පරීක්ෂණ සංඛ්‍යාව 956 ක් (14.4% ක් පමණ) විය. මේ අතරින් 2013 වර්ෂය තුළ දී රසායනික විශ්ලේෂණ රසායනාගාරය විසින් උත්පාදිත මුළු ආදායම රු.6,233,900කි. අපනයනකරුවන්ගේ දායකත්වය රු.1,457,900.00 (23.38%) ක් වන අතර අභ්‍යන්තර අංශවල

ආදායම් ඉපැයීම රු.4,776,000.00 (76.62%) ක් විය. ඉතිරිය වූ පරීක්ෂණ 392(5.9% පමණ) පළිබෝධ විශ්ලේෂණ ඒකකය විසින් පවත්වා ඇත. විශ්ලේෂණ ඒකකය විසින් පරීක්ෂණ 4721ක් (71.1%ක් පමණ) සහ ක්ෂුද්‍රජීව විශ්ලේෂණ ඒකකය විසින් පරීක්ෂණ 1527ක් (23% ක් පමණ) සිදුකර විශ්ලේෂණ පරීක්ෂණාගාරය විසින් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු අයකරනු ලබන හොඳම තත්ත්වයේ තේ ලෙස හඳුනාගනු ලබන තේ සාම්පල ගාස්තුවලින් නිදහස් කෙරේ.

වගුව 3.5.1 : 2012/2013 වර්ෂවල ඉදිරිපත් කරන ලද පරීක්ෂණවල සාරාංශය

| පරීක්ෂණයේ නම | පරීක්ෂණ සංඛ්‍යාව | |
|---|---|---|
| | 2012 | 2013 |
| **රසායන විශ්ලේෂණ ඒකකය** | | |
| 01. තේවල ආර්ද්‍රතාවය නිර්ණය කිරීම | 538 | 1089 |
| 02. තේවල මුළු භෂ්ම ප්‍රමාණය නිර්ණය කිරීම | 198 | 597 |
| 03. තේවල ජලයේ දියවන භෂ්ම ප්‍රමාණය නිර්ණය කිරීම | 188 | 574 |
| 04. තේවල ජලයේ දියවන භෂ්මවල ආම්ලිකතාවය නිර්ණය කිරීම | 188 | 578 |
| 05. තේවල ජල නිස්සාරණය නිර්ණය කිරීම | 188 | 602 |
| 06. තේවල ජලයේ දියවන භෂ්මවල ක්ෂාරීයතාවය නිර්ණය කිරීම | 190 | 604 |
| 07. තේවල අමු තන්තු ප්‍රමාණය නිර්ණය කිරීම | 347 | 568 |
| 08. තේවල පී.එච්. අගය නිර්ණය කිරීම | 2 | 8 |
| 09. තේවල සයනයිඩ් මිශ්‍ර වීම පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණය | 623 | - |
| 10. තේවල ආසනික් මිශ්‍රවීම පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණය | 622 | - |
| 11. මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ | 727 | 28 |
| 12. අනෙකුත් පරීක්ෂණ (එකතුකළ වර්ණ, සීනි, ජෙලි, මධ්‍යසාර, රසකාරක, රසායන හඳුනාගැනීම, බයිකාබනේට්, භාහිර ද්‍රව්‍ය) | 2 | 54 |
| 13. ශ්‍රේණි හඳුනාගැනීමේ පරීක්ෂණ/ පෙරහුම් විශ්ලේෂණය | 16 | 12 |
| 14. තේවල අයන ප්‍රමාණය නිර්ණය කිරීම | - | 7 |
| **ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය** | | |
| 01. මුළු පට්ටිකා ප්‍රමාණය නිර්ණය කිරීම | 352 | 372 |
| 02. යීස්ට් සහ පුස් ප්‍රමාණය නිර්ණය කිරීම | 370 | 372 |
| 03. තේවල මළ හෝ පීවී කෘමීන් සහ අනෙකුත් අපවිත්‍රකාරක/ භාහිර ද්‍රව්‍ය පිළිබඳ අණ්වීක්ෂිය පරීක්ෂණ | 12 | 11 |
| 04. තේවල ජානමය වෙනස්කම් සිදුකළ ද්‍රව්‍ය පිළිබඳ නිර්ණය කිරීම | 121 | 139 |
| 05. Faecal Coliforms සහ Escherichia coli (E.coli - අනාවරණය කරගැනීම සහ ගණනය කිරීම | 163 | 314 |
| 06.මුළු Coliform ප්‍රමාණය අනාවරණය කරගැනීම සහ ගණනය කිරීම | 169 | 319 |
| **පළිබෝධ ශේෂ විශ්ලේෂණ ඒකකය** | | |
| 01 ඊතේන් | - | 44 |
| 02. මැලතිත් | - | 44 |
| 03. Cypermethrin | - | 44 |
| 04. Alfa Endosulfan | - | 69 |
| 05. Beeta Endosulfan | - | 69 |
| 06. Bifenthrin | - | 69 |
| 07. 2,4 – D | - | 25 |
| 08. MCPA | - | 28 |
| එකතුව | 5042 | 6640 |

### 3.5.1. පරීක්ෂණ සහතික

2013 වර්ෂයේදී නිකුත් කරන ලද මුළු සහතිකපත් සංඛ්‍යාව 553ක් විය. කෙසේවෙතත් 2013 වර්ෂය තුළදී ඇතැම් පරීක්ෂණ සිදු නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේදී නිකුත්කරන ලද සහතිත පත්‍ර සංඛ්‍යාව වූ සහතික පත් 1178 හා සංසන්දනය කිරීමේදී ප්‍රමාණයේ තරමක අඩුවීමක් නිරීක්ෂණය විය.

සහතික පත්‍ර නිකුත් කරන ලද බාණ්ඩ

1- තේවල ආර්ද්‍රතාවය විශ්ලේෂණ කිරීම පිළිබඳ පරීක්ෂණ වාර්තාව
2- ISO 3720 අවම තත්ත්ව පරාමිතීන්ට අනුකූලව තේවල තත්ත්ව සහතිකකරණය
3- රසායන ද්‍රව්‍ය වලට (රසායන ද්‍රව්‍ය කවලම්) අදාළ පරාමිතීන්ට අනුකූලව තේවල තත්ත්ව සහතිකකරණය
4- තේවල සිලිකාමය ද්‍රව්‍ය ප්‍රමාණය, දූවිලි/ කුඩු විශ්ලේෂණය සහ තේවල පෙරහුම් විශ්ලේෂණයට අදාළ සහතිකකරණය
5- තේවල බාහිර ද්‍රව්‍ය /මළ හෝ සජීවී කෘමීන්, ආගන්තුක ද්‍රව්‍ය සහ සුන්බුන් පිළිබඳ අන්වීක්ෂණ පරීක්ෂණවලට අදාළ සහතිකකරණය
6- තේවල ක්ෂුද්‍රජීවීමය දූෂණය වීම් විශේෂයෙන්ම බැක්ටීරියා, පුස් සහ දිලීර වර්ධනය වීම, ඊ කොලි, කෝලිෆෝම් සහ සැල්මොනෙල්ලා වර්ධනය වීම ආදියට අදාළව සහතිකකරණය
7- තේවල ජානමය විකෘති ජීවීන් පිළිබඳ සහතිකකරණය
8- තේවල බහු ශේෂ මට්ටමේ පළිබෝධනාශක පිළිබඳ සහතිකකරණය

### 3.5.2. විශ්ලේෂණ පරීක්ෂණාගරයේ පරීක්ෂණ සේවා මඟින් ආදායම් රැස්කිරීම

සේවාදායකයින්ගේ ඉල්ලීම මත සිදුකරනු ලබන පරීක්ෂණ සේවා වෙනුවෙන් අංක OR/1/87 හා 2010.08.06 දිනැති තේ මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව විශ්ලේෂණ පරීක්ෂණාගාරය විසින් ගාස්තු අයකරනු ලැබේ. පරීක්ෂණාගාරයේ සමස්ත ආදායම අපනයන තුළින් සෘජුවම ලැබුණ පරීක්ෂණ ගාස්තු (23.38%) හා විශ්ලේෂණ පරීක්ෂණාගාරයෙන් පහතික කර ඇති පරිදි "ප්‍රමිතියට වඩා අඩු තේ" යන බාණ්ඩය යටතේ තේ කොමසාරිස්වරයාගේ අංශය විසින් අයකරන ලද ගාස්තු (76.62%) වලින් සමන්විත වේ.

වගුව 3.5.2. සමස්ත ආදායම් කොටස: අභ්‍යන්තර අධීක්ෂණය හා බාහිර සහතිකකරණය

| | 2012 රු. | % | 2013 රු. | % |
|---|---|---|---|---|
| අභ්‍යන්තර අධීක්ෂණ සේවා | 2,043,000 | 42.05 | 4,776,000 | 76.62 |
| බාහිර සහතිකකරණ සේවා | 2,815,000 | 57.95 | 1,457,900 | 23.38 |
| සමස්ත ආදායම | 4,858,000 | 100.00 | 6,233,900 | 100.00 |

පරීක්ෂණාගාර විශ්ලේෂණ සේවාවල තීරණ මත පදනම්ව දූෂ්‍ය හෝ ප්‍රමිතියට වඩා අඩු තේ තොග සම්බන්ධයෙන් තේ කොමසාරිස්වරයා සහ නියෝජ්‍ය කොමසාරිස්වරයා (අපනයන) විසින් රාජකාරී ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඒ අනුව 2013 වර්ෂය තුළදී තේ තොග 372ක් ප්‍රමිතියෙන් අඩු තේ ලෙස සලකනු ලැබ ඊට එරෙහිව රාජකාරීමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර 2013 වර්ෂය තුළදී විශ්ලේෂණ පරීක්ෂණාගාරය රුපියල් මිලියන 6.2ක ආදායමක් උපයන ලද අතර 2012 වර්ෂයේදී එම ආදායම රුපියල් මිලියන 4ක් වීමෙන් 28.3%ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

### 3.5.3. විශ්ලේෂණ රසායනාගාර ඒකකවල කාර්යසාධනය

#### 3.5.3.1. තත්ත්ව පරීක්ෂණ සහ සාම්පල් ඒකකය

ජාත්‍යන්තර සහතිකකරණය සඳහා සේවා සපයන ඕනෑම පරීක්ෂණාගාරයක් විසින් ලිපිලේඛන පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. එමනිසා තත්ත්ව පරීක්ෂණ ඒකකයේ ප්‍රධාන කාර්යය වනුයේ ISO 17025 ප්‍රමිතිය මත පරීක්ෂණාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පරීක්ෂණාගාර ලිපිලේඛන ක්‍රමවේදයක් පවත්වාගෙන යාමයි. ඒ අනුව සමාලෝචිත වර්ෂය වූ 2013 වර්ෂයේදී, රසායන, ක්ෂුද්‍රජීවී සහ පළිබෝධනාශක ශේෂ විශ්ලේෂණ ඒකක තුළ අභ්‍යන්තර ලේඛන පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වාගෙන යන ලදී. මෙයට අමතරව පරීක්ෂණාගාර සාම්පල ලබාගැනීම සහ පරීක්ෂණ වාර්තා නිකුත්කිරීම මෙම අංශය විසින් පාලනය කරනු ලබයි.

### 3.5.3.2. රසායන විශ්ලේෂණ ඒකකය

අධ්‍යක්ෂ (විශ්ලේෂණාත්මක සේවා) ගේ අධීක්ෂණය යටතේ මෙම ඒකකයේ විශ්ලේෂක (රසායනික) සහ ඔහුගේ තාක්ෂණික කාර්යමණ්ඩලයට පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට හැකිවිය.

1- නිෂ්පාදිත බාල තේ පිළිබඳ රසායනික තක්සේරුව තේ තොගය වෙන්දේසි කිරීමට හා නැව්ගත කිරීමට පෙර සිදු කිරීම
2- ISO 3720 ට අනුව රසායනික තක්සේරුව සිදු කිරීම (මෙම පරාමිතීන්ට මුළු භෂ්ම, ජලයේ ද්‍රාව්‍ය භෂ්ම, ක්ෂාරත්වය, ඇස්ඩ්වල දිය නොවන භෂ්ම, ජල නිස්සාරණය, ආර්ද්‍රතාවය සහ අමු තන්තු කොටස් ආදිය ඇතුළත් වේ.)
3- පෙරහන් විශ්ලේෂණ ශිල්පීය ක්‍රම භාවිතා කරමින් තේ කුඩු සහ කැබලි සංයුතිය තක්සේරු කිරීම
4- තේවල අඩංගු සිලිකාමය ද්‍රව්‍ය තක්සේරු කිරීම

අනෙකුත් වැදගත් කාරණා අතර අන්තර් පරීක්ෂණාගාර ප්‍රවීණතා පරීක්ෂා කිරීමේ වැඩසටහනට සහභාගි වීම විශේෂයෙන් සඳහන් කළ හැකිය. මෙම වැඩසටහන රසායන විශ්ලේෂණ ඒකකයේ කාර්යමණ්ඩලයේ ප්‍රවීණතාවය වර්ධනය කිරීම සඳහා ඉවහල් විය.

රසායන විශ්ලේෂණ ඒකකය අධ්‍යක්ෂ (විශ්ලේෂණාත්මක සේවා) ගේ අධීක්ෂණය යටතේ එක් ප්‍රධාන විශ්ලේෂකයෙකු (රසායනික) තාක්ෂණික සහකාරවරුන් (කොන්ත්‍රාත්මය) දෙදෙනෙකු සහ පරීක්ෂණාගාර සේවකයෙකුගෙන් සමන්විත වේ.



*ඡායාරූපය 3.18. - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරීක්ෂණාගාරය*

### 3.5.3.3. ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය

ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය අධ්‍යක්ෂ (විශ්ලේෂණාත්මක සේවා) ගේ අධීක්ෂණය යටතේ ප්‍රධානියා වශයෙන් එක් විශ්ලේෂකයෙකු (ක්ෂුද්‍රජීවවිද්‍යා), එක් තාක්ෂණ සහකාරවරයෙකු සහ එක් පරීක්ෂණාගාර සේවකයෙකුගෙන් සමන්විත විය. මෙම ඒකකය මඟින් තේ සාම්පලවල තිබෙන ක්ෂුද්‍රජීවී මට්ටම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරීක්ෂණ ක්‍රමවේද යටතේ පරීක්ෂා කරනු ලබයි.

### 3.5.3.4. පළිබෝධනාශක ශේෂ විශ්ලේෂණ ඒකකය

උපරිම ශේෂ මට්ටම යනුවෙන් අදහස් කරන්නේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් මත පදනම්ව තනි තනි රටවල් විසින් ස්ථාපිත කර ඇති රෙගුලාසිවලට අනුකූලව, පළිබෝධනාශක ශේෂ පරීක්ෂණය සඳහා පිළියෙල කර ඇති තේ සාන්ද්‍රණයක තිබිය යුතු ඉහළම නෛතික ශේෂ මට්ටමයි. මෙනිසා පසුගිය වසර කීපය තුළදී ආනයන/ අපනයන තේ සම්බන්ධයෙන් මෙම පරාමිතීන් ස්ථාපිත කිරීම අතිශය වැදගත් කාරණයක් විය.

වසර ගණනාවක් පුරා සිදුකරනු ලැබූ පර්යේෂණ සහ අතිවිශාල පරීක්ෂණ ප්‍රමාණයකින් අනතුරුව වර්ෂ 2013 දී "QUECHERS" යනුවෙන් හඳුන්වනු ලබන ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදය භාවිතා කරමින් උපරිම ශේෂ මට්ටම් පරීක්ෂණ පැවැත්වීම මෙම ඒකකය විසින් අරඹන ලදී.

පළිබෝධනාශක විශ්ලේෂණ ඒකකයේ සාමාජිකයන් සහකාර අධ්‍යක්ෂ (පරීක්ෂණාගාර) ගේ අධීක්ෂණය යටතේ ප්‍රධානියා වශයෙන් එක් විශ්ලේෂකයෙකු (රසායනික/පළිබෝධනාශක) සහ එක් පරීක්ෂණාගාර සේවකයෙකුගෙන් යුක්ත වේ.

## 3.6 පරිපාලන අංශය

ශ්‍රී.ලං.තේ.ම. පරිපාලන අංශය මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සමපත් සංවර්ධන කටයුතු සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම් කිරීම, තොරතුරු තාක්ෂණ සේවා ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, මණ්ඩලයේ සැලසුම් කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ ඇගයුම් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම, සංඛ්‍යාලේඛනමය තොරතුරු බෙදාහැරීම, ශ්‍රී.ලං.තේ.ම. පුස්තකාලය පාලනය කිරීම සහ නඩත්තු කිරීම, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක හා ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරයි.

### 3.6.1. මානව සම්පත් කළමනාකරණය

වගුව 3.6: 2013 වර්ෂය අවසානයට කාර්යමණ්ඩලය

| ඛාණ්ඩය | සේවක සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 04 |
| තෘතියික මට්ටම | 49 | 24 | 73 |
| ද්විතීයික මට්ටම | 36 | 78 | 114 |
| ප්‍රාථමික මට්ටම | 61 | 04 | 65 |
| එකතුව | 149 | 106 | 255 |

### 3.6.2. මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී.ලං.තේ.ම. ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දින දෙකක බාහිර පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහනේ අරමුණ වූයේ සහභාගිවූවන්ට රැකියාවේ විෂය පථය, ප්‍රාදේශීය කළමනාකරණ ක්‍රම, කර්මාන්තයට අදාළ නීති සහ රෙගුලාසි, පරිපාලන රෙගුලාසි සහ මුදල් රෙගුලාසි යන කරුණු පිළිබඳ අවබෝධයක් ලබාදීම හා 2014 වර්ෂය සඳහා තේ කොමසාරිස්වරයාගේ අංශයේ ඉලක්ක සකස් කිරීමයි. ඉලක්කගත කණ්ඩායම තේ පරීක්ෂකවරු 58 දෙනෙකුගෙන් සහ ප්‍රාදේශීය කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සමන්විත වූ අතර වැඩසටහන දින දෙකක් තුළ පැවැත්විණි.

සේවකයෝ හතර දෙනෙක් විදේශ පුහුණු සඳහා සහභාගි වූහ. (තෘතියික මට්ටමේ 02ක් සහ ද්විතිය මටටමේ 02ක්)

වගුව 3.6: 2013 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩලය

| ඛාණ්ඩය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ට මට්ටම | - |
| තෘතියික මට්ටම | 19 |
| ද්විතියික මට්ටම | 31 |
| ප්‍රාථමික මට්ටම | - |
| එකතුව | 50 |

අටවෙනි ජාත්‍යන්තර පී.අයි පුහුණු වැඩසටහන ස්විස්ටර්ලන්තයේ At Le Courtil හිදී පවත්වන ලද අතර ඒ සඳහා තේ කොමසාරිස්වරයා සහභාගි විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙළඳ පොල විශ්ලේෂක ඉන්දියාවේ පැවැති තේ රසපරීක්ෂණය සහ තාක්ෂණය පිළිබඳ ත්‍රෛමාසික උසස් සහතිකපත්‍ර පාඨමාලාවට සහභාගවිය.



ඡායාරූපය 3.19. - අටවෙනි ජාත්‍යන්තර පී.අයි. පුහුණු වැඩසටහන- ස්විස්ටර්ලන්තය- 2013



ඡායාරූපය 3.20. - තේ රසපරීක්ෂණය සහ තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව- ඉන්දියාව

## 3.7. අභ්‍යන්තර විගණන ඒකකය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණනය යනු සියලුම කළමනාකරණ මට්ටම්වලට සේවාවක් වශයෙන් කටයුතු සමාලෝචනය කිරීම සඳහා වන ස්වාධීන ඇගයුම් කාර්යයකි. එය සංවිධානයක් තුළ සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගි කරගැනීමට දායකත්වයක් සපයන මූල්‍ය හා මූල්‍ය නොවන අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳ මිනුම්කරන, තක්සේරු කරන සහ වාර්තා කරන පාලනයකි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විගණන කමිටුව අභ්‍යන්තර විගණන වැඩසටහන් අනුමත කරන ලද අතර විශේෂ පැවරුම්/ පරීක්ෂණද ඇතුළුව අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කරන ලදී.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 3ක් පවත්වන ලද අතර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස වාර්තාවක්ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## 3.8. තොරතුරු තාක්ෂණ අංශය

2012/2013 කාලරිච්ඡේදය තුළදී තොරතුරු තාක්ෂණ අංශය තේ පද්ධති ව්‍යාපෘතියේ පළමු අදියර සම්පූර්ණ කළ අතර නඩත්තු ගිවිසුමකටද අත්සන් තැබීය. තවද මූල්‍ය පද්ධතියේ දෙවන අදියර නිම කරන ලද අතර මේ වනවිට ව්‍යාපෘතියේ අවසන් කොටස ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමත් සමඟ දූෂණය අවම කිරීමට අපට හැකිවන අතර බොහෝ ආදායම් උපයන තේ අපනයනකරුවන් පිළිබඳව වඩා විනිවිදභාවයකින් යුතුව විශ්ලේෂණ කිරීමටත් ශ්‍රී ලංකා තේවල ඉහළ ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාමටත් හැකියාව ලැබෙනු ඇත. ප්‍රධාන කාර්යාලයේ IISL සහ VPN සම්බන්ධතාවය දෙගුණ කළ අතර ශ්‍රී.ලං.තේ.ම. තො.තා. පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස ප්‍රාදේශිය කාර්යාලවල VPN සබඳතා 4

ගුණයකින් ඉහළ දමන ලදි. තවද ආරක්ෂක ගැටළු අවම කිරීම පිණිස ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ CCTV කැමරා පද්ධති සවිකරන ලදි. මෙහි අධීක්ෂණය ශ්‍රී.ලං.තේ.ම. අන්තර්ජාලය හරහා සිදුකරනු ඇති අතර ඉහළ කළමනාකරණයේ සිටින පරිපාලන බලධාරී සීමිත පිරිසකට වරප්‍රසාද ලබාදෙන ලදි. පසුගිය වර්ෂය තුළ දෛනික රාජකාරී කටයුතුවලදී එල්ලවන අභියෝග ජයගැනීම සඳහා සියලුම අංශවලට සහාය වෙමින් සහ උපදෙස් ලබාදෙමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් අසමසම කාර්යභාරයක් ඉටුකරන ලදි.

# 04. මූල්‍ය සමාලෝචනය

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන | 2013.12.31 දිනට රු. | 2012.12.31 දිනට රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 7 | 683,561,264 | 669,074,922 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම් | 13 | 2,935,383 | 3,007,283 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | 10,034,678 | 9,311,278 |
| මූල්‍ය වත්කම් | 8 | 4,813 | 4,813 |
| | | 696,536,138 | 681,398,296 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 9 | 63,651,786 | 19,948,861 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු | 10 | 54,293,751 | 39,019,571 |
| තැන්පතු සහ ගෙවීම් | | 26,400,861 | 13,111,889 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 11 | 4,032,781,237 | 2,804,609,593 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | | 51,290,662 | 42,831,205 |
| | | 4,228,418,297 | 2,919,521,119 |
| **මුළු වත්කම්** | | 4,924,954,435 | 3,600,919,416 |
| **හිමිකම් සහ වගකීම්** | **සටහන** | **2013.12.31 දිනට රු.** | **2012.12.31 දිනට රු.** |
| දායක ප්‍රාග්ධනය | | 652,067,602 | 652,067,602 |
| රඳවා ගත් ඉපැයුම් | | (374,108,286) | (399,284,580) |
| ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු | 16 | 3,898,124,564 | 2,710,683,852 |
| විශේෂ සංචිතය | 16 | 481,933,543 | 481,933,543 |
| මුළු හිමිකම් | | 4,658,017,423 | 3,445,400,417 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක වරප්‍රසාද බැඳීම් | 12 | 43,083,575 | 44,034,691 |
| | | 43,083,575 | 44,034,691 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්බිත ආදායම් අලුත් කිරීම් | | - | 7,233,260 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු | 15 | 223,853,438 | 104,251,048 |
| | | 223,853,438 | 111,484,308 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 4,924,954,435 | 3,600,919,416 |

පිටු අංක 86 සිට 97 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් නිර්මාණය කරයි.

මණ්ඩලය සඳහා සහ මණ්ඩලය වෙනුවෙන්

අත්සන් කළේ

සහකාර අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය)     අධ්‍යක්ෂ ජනරාල්     සභාපති

# ආදායම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| ආදායම | 03 | 303,887,127 | 271,879,671 |
| තේ ක්ෂේත්‍ර සංවර්ධන පිරිවැය | 04 | (36,676,467) | (27,934,212) |
| පරිපාලන වියදම් | 05 | (257,195,960) | (238,632,602) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 06 | (59,164) | (139,783) |
| මෙහෙයුම් ලාභ/ (පාඩු) | | 10,073,865 | (19,437,909) |
| මූල්‍ය වියදම් | | (75,738) | (194,353) |
| මූල්‍ය ආදායම් | | 9,073,109 | 8,241,826 |
| කාලපරිච්ඡේදය තුළ ලාභය/ (පාඩවු) | | 19,071,236 | (11,390,437) |
| ඉකුත් වර්ෂයට අදාළ පරිවර්තනය නොකළ ගැලපුම් | | - | - |
| **කාලපරිච්ඡේදය තුළ ලාභය/ (පාඩුව)** | | 19,071,236 | (11,390,437) |

# වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| කාලපරිච්ඡේදය තුළ ලාභය | 19,071,236 | (11,390,437) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - |
| **කාලපරිච්ඡේදය තුළ බදු අඩුකළ පසු මුළු විස්තීර්ණ ආදායම්** | 19,071,236 | (11,390,437) |

පිටු අංක 86 සිට 97 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් නිර්මාණය කරයි.

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය රු. | ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු රු. | විශේෂ සංචිත රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 2012 ජනවාරි 1 දිනට ශේෂය | 652,067,602 | 1,348,778,067 | - | 94,039,398 | 2,094,885,068 |
| ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු (සටහන - 16) | | 1,361,905,785 | | | 1,361,905,785 |
| වර්ෂය තුළ පාඩු | - | - | - | (11,390,437) | (11,390,437) |
| විශේෂ සංචිත (සටහන - 16) | - | - | 481,933,543 | (481,933,543) | - |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 652,067,602 | 2,710,683,852 | 481,933,543 | (399,284,582) | 3,445,400,415 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 652,067,602 | 2,710,683,852 | 481,933,543 | (399,284,582) | 3,445,400,415 |
| ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු (සටහන - 16) | - | 1,187,440,712 | - | - | 1,187,440,712 |
| රඳවාගත් ඉපැයුම් | | | | 6,105,060 | 6,105,060 |
| වර්ෂය තුළ ලාභය | - | - | - | 19,071,235.88 | 19,071,236 |
| විශේෂ සංචිත (සටහන - 16) | - | - | - | - | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 652,067,602 | 3,898,124,564 | 481,933,543 | (374,108,286) | 4,658,017,423 |

**පිටු අංක ............ සිට ........ දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් නිර්මාණය කරයි.**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| මෙහෙයුම්වලින් ලද ශුද්ධ ලාභය | 19,071,236 | (11,390,437) |
| ගැලපුම් | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම් | 27,001,289 | 26,904,372 |
| රඳවාගත් ඉපැයුම් සඳහා ගැලපුම් | 6,105,060 | - |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 3,434,335 | 5,859,469 |
| මූල්‍ය ආදායම් | (9,073,109) | (8,579,826) |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලත් ලාභය හෝ පාඩුව | 2,615,555 | 1,582,649 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | 71,900 | 71,900 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | 49,478,214 | 14,751,002 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු අඩු වීම් /(වැඩි වීම්) | (28,563,152) | 3,466,955 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු වැඩිවීම් /(අඩුවීම්) | 119,602,390 | 7,959,365 |
| විලම්භිත ආදායම් අලුත් කිරීම් වැඩිවීම්/ (අඩුවීම්) | (7,233,260) | (2,123,000) |
| භාණ්ඩ තොග අඩුවීම්/ (වැඩිවීම්) | (43,702,925) | 1,994,462 |
| **මෙහෙයුම්වලින් ජනිත මුදල්** | 89,581,267 | 26,048,784 |
| පොලී ගෙවීම් | (75,738) | (194,353) |
| පාරිතෝෂික ගෙවීම් | (4,385,452) | (7,465,493) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනිත ශුද්ධ මුදල් | 85,120,077 | 18,388,938 |
| **ආයෝජන කටයුතුවලදී (භාවිත) මුදල් ප්‍රවාහය** | | |
| මූල්‍ය ආදායම් ලැබීම් | 9,073,109 | 8,579,826 |
| ආයෝජන | (1,228,171,644) | (1,336,761,172) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම් | (899,611) | - |
| දේපල පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම් | (44,103,186) | (49,400,179) |
| **ආයෝජන කටයුතුවලදී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | (1,264,101,331) | (1,377,581,525) |
| මූල්‍ය කටයුතුවලදී භාවිත මුදල් ප්‍රවාහ | | |
| ඒකාබද්ධ අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - |
| ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු | 1,187,440,712 | 1,361,905,785 |
| **මූල්‍ය කටයුතුවලදී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහ** | 1,187,440,712 | 1,361,905,785 |
| **මුදල් සහ මුදල් සමාන වස්තු වල ශුද්ධ වැඩිවීම් (අඩුවීම්)** | 8,459,457 | 2,713,198 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | 42,831,205 | 40,118,006 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | 51,290,662 | 42,831,204 |

**පිටු අංක 86 සිට 97 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් නිර්මාණය කරයි.**

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

## 1.සංස්ථාපිත තොරතුරු

### සාමාන්‍ය කරුණු

1957 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය ස්ථාපිත කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන අතර මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි.

### ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ශ්‍රී ලංකා තේ (ලංකා තේ) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අභිමතාර්ථ වේ. තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේවතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යන තේ කර්මාන්තය ආශ්‍රිත කටයුතු නියාමනය කිරීම පිළිබඳ වගකීම දරනුයේද ශ්‍රී.ලං.තේ. මණ්ඩලයයි.

තවද තේ වෙන්දේසි පැවැත්වීම නියාමනය කිරීම, ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම සහ විකුණුම් නියාමනය කිරීම, අපනයන තැරැව්කරුවන්, ගබඩා සහ තේ නැව්ගත කිරීම ආදි කටයුතු නියාමනය කිරීම ද එමඟින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ අලෙවි මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

## 2.පිළියෙල කිරීම සඳහා පදනම

### 2.1 පිළියෙල කිරීමේ පදනම සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර සහ ලං.ගි.ප්‍ර.) අනුගමනය කිරීම

**2012 ජනවාරි 31 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළ වේ.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර. වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කොට ඇත.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය ද ඇතුළුව ඒ දක්වා වූ සියලුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් එහි මූල්‍ය වාර්තා 2011 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූලව පිළියෙල කොට ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිළියෙල කරන ලද මෙම මූල්‍ය වාර්තා 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන කාලපරිච්ඡේදය සඳහා බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද පළමු වාර්තා වේ.

### 2.2ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

## 3.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් භාවිතා කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

### 3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත හා උපකරණ කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිශ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දීර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත

සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවන විටදී ශ්‍රී.ලං.තේ. මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද පිරිවැයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනී.

## 3.3 ක්ෂයවීම්

ක්ෂයවීම් සමානුපාතික පදනම මත ගණනය කරනු ලැබේ. අපහරණය කරනු ලබන වර්ෂය තුළදී ක්ෂයවීම් අයකරනු නොලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 50යි |
| කාර්යාල උපකරණ | අවුරුදු 2 - 20 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | අවුරුදු 1 - 20 |
| මෝටර් රථ | අවුරුදු 10 |
| පරිගණක උපාංග | අවුරුදු 5යි |
| පුස්තකාල පොත් | අවුරුදු 5යි |
| පරීක්ෂණාගාර උපකරණ | අවුරුදු 3 - 10 |

## 3.4 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළදී දරන ලද ශේෂ පත්‍ර දිනය වනවිට ප්‍රාග්ධනිත කර නොමැති ප්‍රාග්ධන පිරිවැය කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වනු ලබන අතර වර්ෂය තුළදී ප්‍රාග්ධනිත කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණවලට මාරු කරනු ලැබේ.

## 3.5 බදු ඉඩම්

පරීක්ෂණය දිනය වනවිට ගිවිසුමෙහි සඳහන් කරුණු මත පදනම්වන බදු ගිවිසුමක් ද, ගිවිසුම සපුරාලීම නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතා කරන අයුරු මත රඳාපවතිද යන්න හා ගිවිසුමේ නිශ්චිතවම වත්කම් භාවිතය සඳහා වන අයිතිය පිළිබඳ සඳහන්කොට නොමැති වුවද වත්කම් භාවිතය සඳහා ගිවිසුම මඟින් අයිතිය පවරනු ලබයිද යන කරුණු නිශ්චය කෙරේ. බදු වත්කම්වල ඇස්තමේන්තු ගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

බදු ඉඩම් - අවුරුදු 50යි

## 3.6 අස්පෘශ්‍ය වත්කම්

වෙනවෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂයට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

පරිගණක මෘදුකාංග - අවුරුදු 15යි

## 3.7 මූල්‍ය නොවන වත්කම් හානිවීම්

සෑම වාර්තාකරණ දිනයක් වන විට වත්කමක් හානිවන බවට යම් සඳහනක් තිබේද යන්න පිළිබඳව ශ්‍රී.ලං.තේ. මණ්ඩලය තක්සේරු කරයි. එබඳු කිසියම් සඳහනක් තිබේනම් හෝ කිසියම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානි පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය වේනම් ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් වත්කමෙහි අයකරගත හැකි වටිනාකම තක්සේරු කරනු ලබයි. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය වූ කලී වත්කමක අයකරගත හැකි ඉහළම අගය වන අතර වත්කමක් අනෙකුත් වත්කම් හෝ වත්කම් ඛාණ්ඩවලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ප්‍රවාහයක් උත්පාදනය නොකරන්නේනම් මිස එම වත්කම කේවල වත්කමක් ලෙසට තීරණය කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවා යනවිට වත්කම හානිවූවා සේ සලකනු ලබන අතර එහි අයකරගත හැකි අගයට අඩුකරනු ලැබේ. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී වත්කමේ නිශ්චිත අවධානම සහ මුදල්වල කාලීන වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළඳපොල තක්සේරුව පිළිබිඹු කරන බදු පූර්ව මට්ටම් අනුපාතයක් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී මෑතකාලීන වෙළඳපොල ගනුදෙනු වෙතොත් ඒවා සැලකිල්ලට ගනු ලබන අතර එවැනි ගනුදෙනු හඳුනාගැනීමට නොහැකි වුවහොත් යෝග්‍ය තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කරනු ලැබේ.

### 3.8 බදුකරණය

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය බදුගෙවීම සඳහා බැඳීමක් නොමැති හෙයින් බදු සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 3.9 භාණ්ඩ තොග

පළමු ගැනුම් පළමු නිකුතු පදනම යටතේ යල්පැනගිය සහ අඩු චලනයක් සහිත අයිතම සඳහා නියමිත දිමනා ගෙවීමෙන් අනතුරුව භාණ්ඩ තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් අඩු අගය මත හඳුනාගනී.

### 3.10 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති සහ බැංකුවේ ඇති මුදල්, භාණ්ඩාගාර බිල්පත් ආයෝජන,මූලික පරිණත වීම මාස තුනක් හෝ ඊට වඩා අඩු කාලපරිච්ඡේදයක් තුල වන අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ ණයගැනීම් තුළ දක්වනු ලැබේ.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### 4.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී.ලං.තේ. මණ්ඩලය බැඳී සිටී.
සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් වගකීමක් ඇති වන්නේ එකී සේවකයා ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ අඛණ්ඩව
වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. මෙම වගකීම සපුරාලීම සඳහා ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදන ඉදිරියට රැගෙන එනු ලැබේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට රැගෙන ආ ප්‍රතිපාදනයේ සහ වර්ෂය අවසානයේදී ඉදිරියට රැගෙන ගිය ශේෂය අතර වෙනස සම්බන්ධයෙන් මූලය ප්‍රකාශනයේදී කටයුතු කරනු ලැබේ.

ගණනයේදී භාවිතා කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක ප්‍රමාණය | 1.1% සිට 1.03% |
| වට්ටම් අනුපාතය/පොලී අනුපාතය | 12.16% |
| කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය | 6% |

මෙම වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීමක් සිදු නොවේ. මෙය ශේෂ පත්‍රය තුළ ජංගම නොවන වගකීම් යටතේ බාණ්ඩගත කරනු ලැබේ.

#### 4.1.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

අදාළ රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් සපයයි. සේවකයින් ආවරණය වන සැලසුම්වලට දායක මුදල් සැපයීමේ බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

##### සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය හා සේවකයින් විසින් සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 15% ක් හා 10% ක් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

##### සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් සේවක දළ වැටුපෙන් 3% කට සමාන ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

## 5. ආදායම් ප්‍රකාශනය

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා පිරිවැය ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය සංස්ථාපිත කාර්යසාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය වන පරිදි අනුගමනය කරනු ලැබේ.

### 5.1 ආදායම් හඳුනාගැනීම

ශ්‍රී.ලං.තේ. මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා යා හැකි ප්‍රමාණයට සහ ගෙවීම් සිදුකිරීමේදී ඒ පිළිබඳ නොසලකා ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් පිළිබඳ නියමයන් සැලකිල්ලට ගෙන ලැබුණ හෝ ලැබිය යුතු මුදල්වල සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායකද සපුරාලිය යුතුය.

#### භාණ්ඩ විකිණීම

සාමාන්‍යයෙන් භාණ්ඩ සැපයීමේදී භාණ්ඩ හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ ගැනුම්කරු වෙත හිමිවන අවස්ථාවේදී භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම හඳුනාගනී.

#### සේවා සැපයීම

සේවය සැපයූ හෝ ඉටුකරනු ලැබූ කාලපරිච්ඡේදයේදී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනාගනී.

#### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී.

#### පොළී ආදායම්

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන අතර පොලී දරන මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. පොළී ආදායම හෝ වියදම මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයුකාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් උචිත පරිදි මූල්‍ය වත්කමේ හෝ ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන සැබෑ අනුපාතය වන ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ. පොලී ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමක් ලෙස දක්වනු ලැබේ.

## 5.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායමට එක්කර ඇත. අලුත්වැඩියා සහ අලුත්කිරීම් එම වියදම දරන ලද වර්ෂය තුළදී ලාභයට හා පාඩුවට ගණනය කරනු ලැබේ.

## 6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසු ගණනය කිරීම්

### 6.1 මූල්‍ය වත්කම්

#### 6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ලං.ගි.ප්‍ර.39 විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභ හා පාඩු, ණය සහ ලැබිය යුතු, පරිනතිය සඳහා තබා ඇති ආයෝජන සහ විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම් වශයෙන් වර්ග කරනු ලබන අතර මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර වත්ක්ම ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට නොමැති කල්හි සෘජුවම ගණුදෙනු පිරිවැයට හඳුනාගැනේ.

ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ මූල්‍ය වත්කම් යන්නට මුදල් සහ කෙටිකාලින ආයෝජන, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු සහ කාර්යමණ්ඩල ණය සහ අනෙකුත් ලැබියයුතු දෑ ඇතුළත් වේ.

#### 6.1.2 පසු ගණනය කිරීම්

මූල්‍ය වත්කම්වල පසු ගණනය කිරීම් පහත සඳහන් පරිදි ඒවායේ වර්ගකිරීම් මත පදනම් වේ.

##### 6.1.2.1 මූල්‍ය වත්කම් ලාභ හා පාඩු තුළින් සාධාරණ අගයට ගණනය කිරීම

ලාභ හා පාඩු තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් යන්නට වෙළඳාම සඳහා තබාගන්නා ලද මූල්‍ය වත්කම් සහ මූලික හඳුනාගැනීම මත ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් ලෙස තීරණය කරන ලද වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් විකිණීම සඳහා හෝ ආසන්න කාලයේදී නැවත මිලදී ගැනීම සඳහා ඇතුළත් කරගන්නේ නම් ඒවා වෙළඳාම සඳහා ලබාගන්නා ලද වත්කම් ලෙස වර්ග කරනු ලැබේ.2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ශ්‍රී.ලං.තේ. මණ්ඩලය සතුව පරිනත වීම සඳහා තබාගන්නා ලද ආයෝජන නොතිබුණි.

##### 6.12.2 ණය සහ ලැබියුතු

ණය සහ ලැබියුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳපොලේදී මිල නියම නොකරන ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් හානිවීම් අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. කිසියම් වට්ටමක් හෝ අත්පත් කරගැනීමක් මත වන වාරික සහ ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයේ අවියෝජනීය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය වේ නම් ඒ පිළිබඳ සැලකිල්ල යොමුකොට ක්‍රමක්ෂය පිරිවැය ගනනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය මත ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය

ආදායම්වල ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුළින් සිදුවන පාඩු ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනී.

### 6.12.3 ආයෝජන පරිනතිය සඳහා තබාගැනීම

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර පරිනතයන් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පරිනතයන් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පරිනත වීම සඳහා තබාගැනීම පිණිස සාධනිය අභිප්‍රායක් සහ සබ්‍යතාවක් ශ්‍රී.ලං.තේ. මණ්ඩලය සතු වනවිට පරිනතිය සඳහා තබාගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායි පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් හානිවීම් අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. කිසියම් වට්ටමක් හෝ අත්පත් කරගැනීමක් මත වන වාරික සහ ඵලදායි පොලී අනුපාත ක්‍රමවේදයේ අවියෝජනීය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය වේ නම් ඒ පිළිබඳ සැලකිල්ල යොමුකොට ක්‍රමක්ෂය පිරිවැය ගනනය කරනු ලැබේ. ඵලදායි පොලී අනුපාත ක්‍රමවේදය මත ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම්වල ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුළින් සිදුවන පාඩු ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනී.

### 6.12.4 මූල්‍ය ආයෝජන විකිණීම සඳහා තැබීම

විකිණීම සඳහා තබන මූල්‍ය ආයෝජන යන්නට හිමිකම් සහ ණය සුරැකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා තබන ලදැයි වර්ගීකරණය කරන ලද හිමිකම් ආයෝජන යනු වෙළඳාම සඳහා තබන ලදැයි වර්ගීකරණය නොකරන ලද සහ ලාභ අලාභ තුළින් සාධාරණ අගයට ගණනය නොකරන ලද ආයෝජනයන්ය. මෙම බාණ්ඩයේදී ණය සුරැකුම් යනු අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරන ද්‍රවශීල අවශ්‍යතා හෝ වෙනස්වන වෙළඳපොල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් විකිණිය හැකි දැය. මූලික ගණනය කිරීම්වලින් අනතුරුව විකිණීම සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන පසුව අනෙකුත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනාගනු ලබන උපලබ්ධි නොවූ ලාභ හා පාඩු සහිත සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. විකිණීම් සඳහා තබා ඇති ණය සුරැකුම් මත පොළී ගණනය කිරීම ඵලදායි පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් සිදුකරනු ලබන අතර ලාභ හා අලාභවලදී හඳුනාගැනේ. 2012 සහ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ තුළ ශ්‍රී.ලං.තේ. මණ්ඩලය සතුව විකිණීම සඳහා තබන ලද මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.2.5 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් (අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ මූල්‍ය වත්කම්වලට සමාන බාණ්ඩයක කොටසක්)
පහත සඳහන් අවස්ථාවලදි හඳුනානොගැනේ.

1- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය අවසන් වී ඇතිවිට

2- ශ්‍රී.ලං.තේ.ම. විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය පවරනු ලැබ ඇතිවිට හෝ හුවමාරු ගිවිසුමක් යටතේ සැලකියයුතු තරමේ ප්‍රමාදයකින් තොරව ලැබී ඇති මුදල් ප්‍රවාහ තෙවන පාර්ශ්වයකට ගෙවීම සඳහා බැඳීමක් භාරගෙන ඇතිවිට සහ

(අ) ශ්‍රී.ලං.තේ.ම. විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ ඇතිවිට හෝ

(ආ) ශ්‍රී.ලං.තේ.ම. විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ හෝ රඳවාගෙන නොමැති වුවත් වත්කමේ පාලනය පවරනු ලැබ ඇතිවිට

### 6.1.2.6 මූල්‍ය වත්කම් හානිවීම්

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයක් වනවිට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් බාණ්ඩයක් හානිවී ඇති බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේද යන්න පිළිබඳ තක්සේරු කරයි. වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමක් හෝ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් හානිවීම සිදුවී ඇති බවට සහ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට එකී පාඩු සිදුවීම බලපෑමක් එල්ලකර ඇති බවට වාස්තවික සාක්ෂියක් තිබේනම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවූවා සේ සලකනු ලැබේ.

හානිවීමක් සිදුවී ඇති බවට වන සාක්ෂි යන්නට ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් මූල්‍ය දුෂ්කරතානවයකට, ගෙවීම් හෝ රාජකාරී පැහැරහැරීම්වලට ලක්වී ඇති බවට, ඔවුන් බංකොලොත්භාවයට පත්වීමට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීමට ඉඩ ඇති බවට සහ පැහැර හැරීම් හා සම්බන්ධ හිග මුදල් හෝ ආර්ථික තත්ත්වයන් වෙනස්වීම වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ ගණනය කළ හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළහැකි දත්ත මගින් පෙන්නුම් කරන කරුණු ඇතුළත් වේ.

### 6.1.2.7 මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීම

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීමේදී ශ්‍රී.ලං.තේ.ම. පළමුව කේවල වශයෙන් වැදගත්කමක් ගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිවීම් පිළිබඳ වෙනම සාක්ෂි පවතිද යන්න හෝ කේවල වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් වාස්තවික සාක්ෂි පවතිද යන්න පිළිබඳ තක්සේරු කරයි. කේවල වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිවීම් සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂි නොමැති බවට ශ්‍රී.ලං.තේ. මණ්ඩලය තීරණය කරනු ලැබුවහොත් වැදගත් වුවද නොවුවද, එම වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් තුළට ඇතුළත් කරනු ලබන අතර ඒවා හානිවීම් සඳහා සාමූහික වශයෙන් තක්සේරු කරයි.
හානි පාඩුවක් පවතින බවට හෝ අඛණ්ඩව පවතින බවට හඳුනාගන්නා ලද හානිවීම් සඳහා කේවල වශයෙන් තක්සේරු කරනු ලබන වත්කම් සාමූහික හානිවීම් තක්සේරුව සඳහා ඇතුළත් නොකරයි. හානි පාඩුවක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි පවතිනම් එම පාඩුවේ ප්‍රමාණය වත්කම්වලට ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ (මෙතෙක් සිදුවී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය පාඩු හැර) අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ මූලික ඵලදායි පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ.

### 6.2 මූල්‍ය වගකීම්

#### මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ලං.ගි.ප්‍ර. 39හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් උචිත පරිදි ලාභ හා පාඩු තුළින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වගකීම්, ක්‍රමක්ෂයට පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වගකීම් හෝ ඵලදායි ඉදිරි රැකුමක් තුළ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම්කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී.ලං.තේ.ම. මූල්‍ය වගකීම්වල වර්ගීකරණ ඒවායේ මූලික හඳුනාගැනීමේදී තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් වන කල්හි ක්‍රමක්ෂය පිරිවැයට ගනනය කරයි. සෘජුව ආරෝපණය කළහැකි ගණුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. ශ්‍රී.ලං.තේ.ම. මූල්‍ය වගකීම් යන්නට වෙළඳ සහ අනෙකුත් ගෙවීම් ඇතුළත් වේ.

#### පසු ගණනය කිරීම්

මූල්‍ය වගකීම්වල පසු ගණනය කිරීම් ක්‍රමක්ෂය පිරිවැයට සිදු කරනු ලැබේ.

#### හඳුනා නොගැනීම

වගකීම් යටතේ වන බැඳීම් ඉවත්වන, අවලංගු වන හෝ අවසන් වනවිට මූල්‍ය වත්කමක් හඳුනා නොගනී.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| 3.ආදායම | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| ආදායම - භාණ්ඩාගාරය | 120,000,000 | 117,110,000 |
| ආදායම - සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාරය | 35,240,241 | 23,669,759 |
| පරීක්ෂණාගාර ආදායම් | 3,404,300 | 2,788,300 |
| ලියාපදිංචි සහ අලුත් කිරීමේ ආදායම් | 137,261,250 | 129,036,431 |
| වානිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය (සටහන 3.1) | 7,981,336 | 6,857,414 |
| | 303,887,127 | 279,461,904 |

| 3.1වානිජ කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය | 31.12.2013 රු. | 31.12.2012 රු. |
|---|---|---|
| තේ විකුණුම් | 11,730,035 | 13,436,220 |
| අපනයන ඇසුරුම් විකුණුම් මත කොමිස් | 5,407,891 | 2,288,736 |
| ස්වාධිකාර කුලී | 1,300,000 | - |
| අනෙකුත් විකුණුම් | 52,730 | 17,450 |
| | 18,490,656 | 15,742,406 |
| අඩුකළා : විකුණුම් පිරිවැය | (10,509,320) | (8,884,992) |
| වානිජ කටයුතුවලින් ශුද්ධ ලාභය | 7,981,336 | 6,857,414 |

| 4. තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| නිෂ්පාදන තත්ත්ව සහතික ක්‍රමයක් ස්ථාපිත කිරීම | 496,806 | - |
| කර්මාන්තශාලා නවීකරණය | 17,964,807 | 10,357,381.00 |
| තේ නැවතවගා සහනාධාර යෝජනා ක්‍රමය | 14,370,667 | 13,312,378.00 |
| පසු අස්වනු හානි අවම කිරීම | 1,417,616 | - |
| ය.නි.පි. | 2,426,572 | - |
| නි.වෙ.ගි/IGG | - | - |
| | 36,676,467 | 23,669,759.00 |

| 5.පරිපාලන වියදම් | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 162,154,729 | 161,749,027 |
| අනෙකුත් වියදම් | 2,755,745 | 4,405,218 |
| ගමන් වියදම් | 4,894,297 | 14,443,513 |
| සැපයුම් සහ ආවශ්‍යක | 9,344,183 | 8,536,823 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 14,246,006 | 17,196,468 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | 27,001,289 | 26,904,372 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 176,210 | 108,522 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් බදු අයිතිය ක්‍රමක්ෂය | 71,900 | 71,900 |
| උපයුක්ත සහ වෙනත් වියදම් | 36,551,602 | 40,031,362 |
| | 257,195,960 | 273,447,205 |

| 6.අනෙකුත් මෙහෙයුම් වියදම් | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| වට්ටම් | 267,434 | 158,144 |
| විදෙස් මුදල් ඒකක මත විකිණීම්වල පාඩු | 783 | 604 |
| හුවමාරු වෙනස්කම් - පාඩු | (327,382) | 1,624,103 |
| | (59,164) | 1,782,851 |

7 දේපල, පිරියත සහ උපකරණ

| | 2013.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතු කිරීම් | අපහරණ | ගැලපුම් | 2013.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 350,241,280 | - | - | - | 350,241,280 |
| ගොඩනැගිලි | 249,327,095 | - | - | 2,371,076 | 246,956,019 |
| පිරියත සහ උපකරණ | 49,136,163 | 5,253,380 | 3,445,454 | - | 50,944,089 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 21,768,148 | 1,985,645 | 243,093 | 185,600 | 23,325,100 |
| මෝටර්රථ සහ අනෙකුත් වාහන | 42,918,419 | 9,916,736 | 20,000 | - | 52,815,155 |
| පුස්තකාල පොත් | 383,044 | - | - | - | 383,044 |
| පරිගණක - දෘඩාංග | 24,950,858 | 7,227,650 | 413,702 | - | 31,764,806 |
| පරීක්ෂණාගාර උපකරණ | 89,400,053 | 378,560 | - | - | 89,778,613 |
| | 828,125,061 | 24,761,971 | 4,122,248 | 2,556,676 | 846,208,107 |
| කෙරීගෙන යන වැඩ | | | | | |
| ගොඩනැගිලි | - | 19,341,215 | - | - | 19,341,215 |
| පරිගණක මෘදුකාංග | 1,056,519 | - | - | - | 1,056,519 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1,056,519 | 19,341,215 | - | - | 20,397,734 |
| | 829,181,580 | 44,103,186 | 4,122,248 | 2,556,676 | 866,605,841 |
| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 1-1-2013 දිනට සමුච්චිත ක්ෂයවීම් | වර්ෂයතුළ වෙනස්වීම | අපහරණ | ගැළපුම් | 31-12-2013 දිනට සමුච්චිත ක්ෂයවීම් |
| ගොඩනැගිලි | 22,827,722 | 4,988,897 | - | | 27,816,619 |
| පිරියත සහ උපකරණ | 37,875,204 | 3,521,081 | 3,425,509 | - | 37,970,775 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 11,403,253 | 1,596,342 | 219,656 | - | 12,779,939 |
| මෝටර්රථ සහ අනෙකුත් වාහන | 10,032,903 | 4,867,137 | 4,500 | - | 14,895,540 |
| පුස්තකාල පොත් | 361,174 | 17,881 | - | - | 379,055 |
| පරිගණක - දෘඩාංග | 20,829,856 | 2,557,695 | 413,702 | - | 22,973,849 |
| පරීක්ෂණාගාර උපකරණ | 56,776,544 | 9,452,256 | - | - | 66,228,800 |
| | 160,106,656 | 27,001,289 | 4,063,367 | - | 183,044,577 |
| ශුද්ධ පොත් අගය | 669,074,924 | | | | 683,561,264 |

| 8 මූල්‍ය වත්කම් | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| වෙනත් | 4,813 | 4,813 |
| | 4,813 | 4,813 |

| 9.භාණ්ඩ තොග | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| පරීක්ෂණාගාර සහ අනෙකුත් ද්‍රව්‍ය | 12,639,602 | 6,527,173 |
| තේ | 2,651,000 | 2,919,562 |
| පරිභෝජන ද්‍රව්‍ය | 9,451,093 | 2,040,555 |
| වෙනත් | 38,910,090 | 8,461,572 |
| | 63,651,786 | 19,948,861 |

| 10.වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු | 2013.12.31 රු. | 2012.12.31 රු. |
|---|---|---|
| වෙළඳ ලැබියයුතු | 7,732,541 | 961,175 |
| කර්මාන්තශාලා නවීකරණය සහ නැවත වගාකිරීම් සහනාධාර ලැබියයුතු | - | 2,669,759 |
| කාර්යමණ්ඩලයෙන් ලැබියයුතු සහ වෙනත් අත්තිකාරම් | 30,916,725 | 31,760,973 |
| ලැබියයුතු - ජ.ව.සං.ම. | 25,000,000 | 25,000,000 |
| කාර්යමණ්ඩල වියදම් පෙර ගෙවුම් | 2,637,639 | 2,637,639 |
| අත්තිකාරම් සහ වෙනත් | 13,006,847 | 990,025.00 |
| අඩුකළා: | | |
| බොල් ණය සහ අවිනිශ්චිත ණය ප්‍රතිපාදන | (25,000,000) | (25,000,000) |

| | | |
|---|---|---|
| | 54,293,751 | 39,019,571 |
| **11.අනෙකුත් මූල්‍ය වත්කම්** | 2013.12.31 රු. | 2012.12.31 රු. |
| කෙටිකාලීන ආයෝජන | 4,032,781,237 | 2,804,609,593 |
| | 4,032,781,237 | 2,804,609,593 |
| **12.සේවක ප්‍රතිලාභ බැඳීම්** | 2013.12.31 රු. | 2012.12.31 රු. |
| පාරිතෝෂික ආරම්භක ශේෂය | 44,034,691 | 45,640,715 |
| වර්ෂය තුළ පාරිතෝෂික ගාස්තු | 3,434,335 | 5,859,469 |
| වර්ෂය තුළ ගෙවන ලද/ ගෙවිය යුතු ප්‍රතිලාභ | (4,385,452) | (7,465,493) |
| | 43,083,575 | 44,034,691 |
| **13.ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම්** | 2013.12.31 රු. | 2012.12.31 රු. |
| ආරම්භක ශේෂය | 3,007,283 | 3,079,183 |
| ක්‍රමක්ෂය | (71,900) | (71,900) |
| අවසාන ශේෂය | 2,935,383 | 3,007,283 |
| **14.අස්පෘශ්‍ය වත්කම්** | 2013.12.31 රු. | 2012.12.31 රු. |
| මෘදුකාංග | 1,157,598 | 1,077,307 |
| කෙරීගෙන යන මෘදුකාංග වැඩ | 8,877,081 | 8,233,971 |
| | 10,034,678 | 9,311,278 |
| **15.වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු** | 2013.12.31 රු. | 2012.12.31 රු. |
| වෙළඳ සහ ගෙවියයුතු | 98,087,455 | 41,016,920 |
| අනෙකුත් ගෙවියයුතු | 102,946,581 | 51,128,665 |
| උපචිත වියදම් | 22,819,401.67 | 12,105,463 |
| | 223,853,438 | 104,251,048 |

## 16 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන සංචිත

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළදී අනුමත කළ ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

### දායක ප්‍රාග්ධනය

2013 දෙසැම්බර් 31 දිනය වනවිට රු.652,067,602 ක්වූ රජයේ ප්‍රදානවලන් දායක ප්‍රාග්ධනය සකස් වී තිබුණි.

### ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ අපනයනය සඳහා අවසර ලබා දෙමින් CUDEC සඳහා අනුමැතිය ලබාදුන් පසු සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකු විසින්ම සෑම තේ කිලොග්‍රෑම් එකකට රු. 3.50 ක් බැගින් වූ බද්දක් ගෙවියයුතුය. රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව එකතු කරනු ලබන සියලුම මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමිත ගිණුමකට බැර කළ යුතු අතර එමගින් මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලේ කොටසක් සකස් වේ.

මෙම රෙගුලාසි ක්‍රියාවට නැංවීමේදී නියමිත ගිණුමේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බැර වී ඇති සියලුම මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හා බැහැරව සිදුකරනු ලබන ප්‍රවර්ධන හා අලෙවිකරණ කටයුතුවලට අදාළ කාර්යයන් සඳහා පමණක් භාවිතා කළ යුතුය.

| | 31.12.2013 දිනට<br>රු. | 31.12.2012 දිනට<br>රු . |
|---|---|---|
| ආරම්භක ශේෂය | 2,710,683,851 | 1,348,778,067 |
| අපනයනවලින් රැස්කර ගත් මුදල් | 1,156,368,343 | 1,186,445,976 |
| ආයෝජන මත පොලි | 363,797,757 | 211,481,173 |
| ක්‍රිකට් ටී ෂර්ට් විකිණීම | 3,521,500 | - |
| විශ්ව අලෙවිකරණ ප්‍රචාරණ | 75,000.00 | - |
| | 4,234,446,451 | 2,746,705,216 |
| ප්‍රවර්ධන කටයුතු | 850,809 | 45,310 |
| ප්‍රචාරණය, දේශීය මාධ්‍යවල පළ කිරීම් | 1,736,255 | 221,758 |
| ධූත මණ්ඩල සඳහා තිළිණ තේ, අනෙකුත් ත්‍යාග තේ සහ පරිත්‍යාග | 3,447,419 | 3,036,776 |
| විශේෂ ප්‍රවර්ධන ව්‍යාපාර | 1,678,787 | 2,297,111 |
| දේශීය ප්‍රදර්ශන සහ වෙළඳපොලවල්වලට සහභාගි වීම | 5,113,668 | 2,901,453 |
| තේ විදේශීයව/ දේශීයව ප්‍රවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ/ වැඩමුලු පැවැත්වීම | 253,389 | 942,509 |
| ප්‍රවර්ධන පත්‍රිකා, පෝස්ටර් සහ අත්පත්‍රිකා මුද්‍රණය | 2,903,205 | 831,170 |
| ජාත්‍යන්තර වෙළඳපොලවල් සහ ප්‍රදර්ශනවලට සහභාගි වීම | 15,437,560 | 7,650,352 |
| විදේශීය යුනි - නැෂනල් ප්‍රවර්ධන | 42,185,553 | 2,416,398 |
| ජාත්‍යන්තර තේ සභා/ සංගම් සඳහා දායකත්වය | 1,854,270 | 2,900,111 |
| සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ අලුත් කිරීම | 4,341,507 | 8,243,308 |
| වෙළඳපොල දැනුම සහ පර්යේෂණ | 3,866,148 | 709,813 |
| ජාත්‍යන්තර තේ නිෂ්පාදන සංසදය | 5,593,116 | - |
| ලංකා තේ ගෝලීයව ප්‍රවර්ධනය | 2,175,005 | - |
| බැංකු ගාස්තු | 760,213 | - |
| ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට අනුග්‍රාහකත්වය | 207,959,798 | - |
| ටී හවුස් මෙහෙයුම් | 1,819,734 | - |
| G.I. ලියාපදිංචිය | 975,293 | 3,825,294 |
| තේ කෞතුකාගාරය සඳහා ප්‍රදානය | 1,500,000 | - |
| වියදම් - තේ.ම. මොස්කව් | 6,266,849 | - |
| වියද්ම - තේ.ම. එ.අ.එ. | 10,129,752 | - |
| ගමන් වියදම් - විදේශීය | 15,473,557 | - |
| | 336,321,888 | 36,021,365 |
| | 3,898,124,563 | 2,710,683,851 |

විශේෂ සංචිත

රු.481,935,543 ක විශේෂ සංචිත ඇතිකිරීමට මණ්ඩලය තිරණය කර ඇති අතර යෝග්‍ය පරිදි එහි භාවිතය පිළිබඳව මණ්ඩලය විසින් තිරණය කරනු ඇත.

## 17. බැරකම් සහ ප්‍රතිපාදන

සමාලෝචිත වර්ෂයේදී බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් අසන ලද නඩුවකදී රු. 15,556,335 ක මුදලක් ගෙවන ලෙස ශ්‍රී.ලං.තේ. මණ්ඩලයට එරෙහිව තීන්දුවක් ලබාදෙන ලදි. කෙසේනමුත් මෙම තීන්දුවට එරෙහිව ශ්‍රී.ලං.තේ. මණ්ඩලය විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර නඩුව තවදුරටත් ක්‍රියාත්මක වේ.

2012 දෙසැම්බර් 31 දින වනවිට ඉහත නඩුව ද ඇතුලුව ආයතනයට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් නීති සභාව ශ්‍රී.ලං.තේ. මණ්ඩලයට උපදෙස් දී තිබුණේ බොහෝවිට එම නඩුවලින් තේ මණ්ඩලයට වාසිදායක වියහැකි බවයි.
ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශනයේ ඒ සම්බන්ධයෙන් ප්‍රතිලාදන සලසා නොමැත.

## 18. මූල්‍ය අවදානම් කළමනාකරණය, අභිමතාර්ථ සහ ප්‍රතිපත්ති

මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය වගකීම වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ වලින් සමන්විත වේ. මූල්‍ය වගකීම්වල ප්‍රධාන කාර්යය වනුයේ ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ මෙහෙයුම් සඳහා මුදල් සම්පාදනය කිරීමයි. ශ්‍රී.ලං.තේ. මණ්ඩලය සතුව එහි මෙහෙයුම්වලින් සෘජුවම ලැබෙන වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ, මුදල් සහ කෙටිකාලීන තැන්පතු පවතී. ශ්‍රී.ලං.තේ. මණ්ඩලය ද්‍රවශීල අවදානමකට ලක්වී ඇත. ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය මෙම අවදානම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු සොයා බලයි. මණ්ඩලයේ සමාජිකයෝ පහතින් සාරාංශ කොට දක්වා ඇති එකී අවදානම් කළමනාකරණය කිරීම සඳහා අදාළ වන ප්‍රතිපත්ති සමාලෝචනය කර ඊට එකගතාවය වල කරයි.

ද්‍රවශීල අවදානම

ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ අරමුණ වනුයේ අරමුදල් සම්පාදනය තුලිතව අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
කොන්ත්‍රාත්මය වට්ටම්ගත ගෙවීම් මත පදනම් වූ ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ මූල්‍ය වගකීම් පිළිබඳ පරිණත පැතිකඩ පහත වගුවේ සාරාංශ කොට දක්වා ඇත.

## 19. අදාළ පාර්ශ්ව ගණුදෙනු

19.1 රාජ්‍ය සහ රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන සමග ගණුදෙනු සිදු කිරීම

ශ්‍රී.ලං.තේ. මණ්ඩලය එහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතුවලදී අදාළ පාර්ශ්ව සමග ගණුදෙනුවලට එළඹේ. අදාළ පාර්ශ්ව යන්නට ශ්‍රී ලංකා රජය (රාජ්‍ය: ශ්‍රී.ලං.තේ.ම. අයිතිකරු වශයෙන්), රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ රජයේ පාලනය යටතේ පවතින ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත්කමක් ගන්නා වූ අනෙකුත් ගණුදෙනු සම්බන්ධයෙන් තනි තනි වශයෙන් නොව සාමූහික වශයෙන් වැදගත් වන්නාවූති ගණුදෙනුවලට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රාජ්‍ය සහ රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන සමග එළඹි ගණුදෙනු සහ වැඩපිළිවෙලවල් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| ගණුදෙනුවේ ස්වභාවය | 31.12.2013 දිනට රු. | 31.12.2012 දිනට රු. |
|---|---|---|
| ගණුදෙනු | | |
| ආදායම | 120,000,000 | 117,110,000 |
| උපයෝගි වියදම් | 19,338,503 | 17,880,913 |
| හිඟහිටි ශේෂ ලැබියයුතු | | |
| ජ.න.ව.ස.ම. (වැවිලි අමාත්‍යාංශය) | 25,000,000 | 25,000,000 |

19.2 ප්‍රධාන කළමනාකරණ සංයුතිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වේ.

| | 31.12.2013 දිනට රු. | 31.12.2012 දිනට රු. |
|---|---|---|
| කෙටිකාලින රැකියා ප්‍රතිලාභ | 776,479 | 750,000 |

## 20. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසු සිදුවූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල උචිත ගැලපුම් සහ අනාවරණ කිරීම් සිදුකර ඇත.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල

ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574,
ගාලු පාර,
කොළඹ 03,
ශ්‍රී ලංකාව.

තැ.පෙ. 1750, කොළඹ, ශ්‍රී ලංකාව.
දු.ක. 011-2582121 / 0112-2583687
ක්ෂණික ඇමතුම් - 0112-587814
ෆැක්ස් - 0112-582122
විද්‍යුත් තැපැල - teaboard@pureceylonte. com
අන්තර්ජාලය - www. pureceylontea.com

ප්‍රධාන කාර්යාලය
සභාපති
දු.ක. 0112-587814 / 2590968
ෆැක්ස් - 0112-585701
විද්‍යුත් තැපැල - Chairman@pureceylontea.com

අධ්‍යක්ෂ ජනරාල්
දු.ක. 0112-5878814 / 2508991
ෆැක්ස් - 0112-582122
විද්‍යුත් තැපැල - dgsltb@pureceylontea.com

තේ කොමසාරිස්ගේ අංශය
තේ කොමසාරිස්
දු.ක. 0112-580182/2580152/2502485/2584845/2587814/2587773
ෆැක්ස් -0112-580161
විද්‍යුත් තැපැල - tcd@pureceylontea.com

තේ ප්‍රවර්ධන අංශය
අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දු.ක. 0112-583343/2587814/2581418/2580169
ෆැක්ස් - 0112-587341
විද්‍යුත් තැපැල - promotion@pureceylontea.com

තේ අපනයන අංශය
නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දු.ක. 0112-502485/2584845/2587814/2504090/2587773
විදුලි පණිවිඩ :
ෆැක්ස් - 0112-584844
විද්‍යුත් තැපැල - exports@pureceylontea.com

## විශ්ලේෂණ පරීක්ෂණාගාරය

අධ්‍යක්ෂ (පරීක්ෂණාගාර)
දු.ක. 0112-587814/2581576
ෆැක්ස් - 0112-581576
විද්‍යුත් තැපෑල - lab@pureceylontea.com

## ප්‍රාදේශීය කාර්යාල

ගම්පොල
සහකාර තේ කොමසාරිස් ප්‍රාදේශීය කාර්යාලය,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
140, අඹගමුව පාර,
ගම්පොල.
දු.ක. / ෆැක්ස් - 081-2352279
විද්‍යුත් තැපෑල - atcgp@pureceylontea.com

මතුගම
සහකාර තේ කොමසාරිස් ප්‍රාදේශීය කාර්යාලය,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
281, අගලවත්ත පාර,
මතුගම.
දු.ක. 034-2247444
විද්‍යුත් තැපෑල - atcgl@pureceylontea.com

මාතර
සහකාර තේ කොමසාරිස් ප්‍රාදේශීය කාර්යාලය,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
46, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත,
කොටුව, මාතර.
දු.ක. / ෆැක්ස් - 041-2222636
විද්‍යුත් තැපෑල - atcmt@pureceylontea.com

රත්නපුර
61/1, නව නගරය,
රත්නපුර.
දු.ක. / ෆැක්ස් - 045-2222136
විද්‍යුත් තැපෑල - atcrt@pureceylontea.com

බණ්ඩාරවෙල
විශාඛා මාවත,
නව බදුල්ල පාර,
බණ්ඩාරවෙල.
දු.ක./ෆැක්ස් - 057-2222812
විද්‍යුත් තැපෑල - atcbw@pureceylontea.com

ගාල්ල
20,පහළ ඩික්සන් පාර,
ගාල්ල.
දු.ක./ෆැක්ස් - 091-2232052
විද්‍යුත් තැපෑල - atcgl@pureceylontea.com

විදේශීය ශාඛා

**ලංකා තේ ප්‍රවර්ධන ඒකකය**
**එක්සත් අරාබි එමීර් රාජ්‍යය**
**අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)**
**තේ ප්‍රවර්ධන ඒකකය**
**ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදි ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය**
**තැ.පෙ. 51528**
**ඩුබායි - එ.අ.එ.**
**දු.ක. 0097143987871**
**දු.ක. (සෘජු) - 0097143989349**
**ෆැක්ස් - 0097143987872**
**විද්‍යුත් තැපැල -** ctbureau@emirates.net.ae / ceylonte@eim.ae

**ලංකා තේ ප්‍රවර්ධන ඒකකය**
**රුසියාව/ පො.ස්වා.රා.**
**තේ ප්‍රවර්ධන නිලධාරී**
**තේ ප්‍රවර්ධන ඒකකය**
**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ තානාපති කාර්යාලය**
**යුලිට්ස්සා ස්චෙප්කිනා - 24**
**මොස්කව්, රුසියාව.**
**දු.ක. 0074956881620/4956881661/4956881463**
**ෆැක්ස් - 0074956881757**
**විද්‍යුත් තැපැල -** tea@srilankaembassy.org

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්පී/අයි /එස්එල්ටීබී/1/13/07 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 මැයි 27 දින

සභාපති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය .

**ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 දරන 38 මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං මු වා ප්‍ර / ශ්‍රී ලං ගි ප්‍ර )

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

(i) ප්‍රමිතියේ ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබූ බැවින් සමහර ස්ථාවර වත්කම්වල සාධාරණ අගය වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වී නොතිබුණි. තවද, ගම්පොළ ප්‍රාදේශීය කාර්යාලයේ ඉඩමේ වටිනාකම රු.17,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවල අඛණ්ඩව භාවිතා කරන ලද රු.මිලියන 68.13 ක පිරිවැයකට මිලදී ගන්නා ලද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(iii) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ - හඳුනා ගැනීම හා මිණුම්කරණය

අයකර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගැනීමෙන් තොරව 1995 වර්ෂයේ සිට තේ කම්හලකින් ලැබිය යුතු රු.4,329,769 ක මුදලක් ගිණුම්වලට ගෙන තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) 2010,2011 හා 2012 වර්ෂවල එකතුව රු.693,257 ක් වූ මාර්ගස්ථ බඩු පසුව ලැබී තිබුණද, ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ හා ණයහිමියන් යටතේ මතුගම ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිකිරීම් වැඩ ලෙස රු.8,000,000 ක මුදලක් දක්වා තිබුණද, මෙම ඉදිකිරීම් වැඩ සඳහා කිසිදු ගෙවීමක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණි. තවද, මෙම ඉදිකිරීම් වැඩ සඳහා 2014 ජනවාරි 08 දින ගිවිසුමකට එළඹ තිබුණද, මෙම ගනුදෙනුව සමාලෝචිත වර්ෂයට අදාළ නොවීය.

(ඇ) රු 224,280 ක් වූ බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලයේ කල් බදු ඉඩමේ වටිනාකම කල්බදු ඉඩම් යටතේ දක්වනු වෙනුවට සින්නක්කර ඉඩම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත ලැබිය යුතු රු.97,368 ක් වූ පොලිය ගිණුම්වලට ගෙන නොතිබූ අතර , ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා රු.22,896,392 ක් වූ පොලී ආදායම මත රඳවා ගැනීම් බදු ගිණුම් වලින් අත්හැරී තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ජංගම වත්කම් හා අතිරික්තය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) " ටී හවුස් " සඳහා මිලදී ගන්නා ලද රු.344,321 ක් වටිනා එල් පී ගෑස් නලය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව ප්‍රවර්ධන ගාස්තු වියදම් ලෙස සලකා තිබුණි.

(උ) සමාගම් 13 කින් තනි අයිති කුලී (monopoles rental) ලෙස කලින් ලැබුණු රු.900,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඍ) 2013 ජුනි සිට 2014 මැයි දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.205,060,800 ක මුදලක් අනුග්‍රාහක ගාස්තු ලෙස මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා ගෙවා තිබුණි. රු.85,442,000 ක් පූර්ව ගෙවීමක් ලෙස දක්වනු වෙනුවට සම්පූර්ණ මුදලම සමාලෝචිත වර්ෂය සඳහා වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(එ) තොග සත්‍යාපනයට අනුව ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.1,392,775 ක් වුවද එය රු.3,178,836 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් ලිපිද්‍රව්‍ය තොගය රු.1,786,061 කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාණ්ඩ ඇණවුම් කර නොතිබුණ ද, මාර්ගස්ථ භාණ්ඩ ලෙස රු.35,986,763 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්වලට ගෙන තිබුණි.

(ඔ) මොස්කව් හා ඩුබායි තේ ප්‍රවර්ධන ඒකකවල රු.403,153 ක් හා රු.801,119 ක් වූ පිළිවෙලින් ජංගම වත්කම් හා ජංගම වගකීම් ගිණුම්වලට ගෙන නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු 2012 වර්ෂය සඳහා තාවකාලික අතිරික්ත භාර අරමුදල මත රු.16,930,787 ක් වූ පොලිය සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස ගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි

(ක) ප්‍රමිතිමිලදී ගැනීම්වලට අදාළව රු.363,851 ක් වූ පොලී ආදායම මත උපකල්පිත බදු (Notional tax) ආදායමට ගෙන නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ පහකට වැඩි කාලයක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දැක්වෙන රු.මිලියන 25 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද අයකර ගැනීම සැක සහිත වූ බැවින් බොල් හා අඩමාන ණය යටතේ සමාන

මුදලකින් ප්‍රතිපාදනයක් කර තිබුණි. තවද, 2012 ජූනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ සටහන් අනුව, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් රු.මිලියන 16 ක් වටිනා හන්තාන පිහිටි " සිලෝන් ටී මියුසියම් " හි අයිතිය අත්කර ගැනීම හා රු.මිලියන 8 ක ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබුණි. කෙසේ වුවද මෙම ක්‍රියාවලිය 2014 ඔක්තෝබර් 31, විගණන දිනය දක්වාම අවසන් කර නොතිබුණි.

(ආ) රු.4,225,671 ක් වූ හරිත තේ සපයන්නන්ගේ තැන්පතු නිරවුල් කිරීමට 2006 වර්ෂයේ සිට පියවර ගෙන නොතිබුණි. ආරවුලක් ඇති වූ විට ගෙවීම සඳහා තබා ගත යුතු බැවින් ඉන් රු.2,599,793 ක මුදලක් ආපසු ගෙවිය නොහැකි බව මේ සම්බන්ධයෙන් සභාපති විසින් දන්වා තිබුණි.

(ඇ) සිරියාවේ " FODEXPO " වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා 2011 වර්ෂය තුළදී මණ්ඩලය විසින් ගෙවන ලද රු.631,737 ක අත්තිකාරමක් එය නොපැවැත්වීම හේතුවෙන් ආපසු අයකර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයේදී පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | සනාථ කිරීම්/ අදාළ ලේඛන/උපලේඛන අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ණය හිමියන් (නිල තේ අසුරන්නන්) | 7,878,879 | 3,961,506 | 3,917,373 |
| රඳවා ගන්නා ලද මුදල් | 4,171,495 | 1,270,371 | 2,901,124 |
| මුදල් හා බැංකු ශේෂ (ඩුබායි හි තේ ප්‍රවර්ධන ඒකකය) | 1,003,151 | 1,371,000 | 367,949 |
| හරිත තේ බෙදාහරින්නන්ගේ තැන්පතු | 15,195,743 | 15,060,580 | 135,163 |

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | ආපසු ගෙවිය යුතු තැන්පතු | | 316,493 | උපලේඛන හා ආධාරක ලියකියවිලි |
| (ආ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලයේ ඉඩම | | 224,800 | කල්බදු ගිවිසුම |
| (ඇ) | මතුගම ප්‍රාදේශීය කාර්යාලයේ ඉඩම | | - | ඉඩමේ ඔප්පු |
| (ඈ) | පොදු තැන්පතු | | 74,383 | උපලේඛන හා ආධාරක ලියකියවිලි |
| (ඉ) | සේවක තේ අයකර ගැනීම් | | 257,382 | |
| (ඊ) | කලින් ගෙවීම් | | 7,105,299 | |
| (උ) | තැන්පතු හා පූර්ව ගෙවීම් | | 207,360 | |
| (ඌ) | බැංකු ශේෂය - | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 1,003,151 | බැංකු සනාථ කිරීම් |
| | | මොස්කව් | 416,229 | |
| (එ) | තානාපති කාර්යාල ගිණුම | එක්සත් රාජධානිය | 16,566 | |
| | | කැනඩාව | 134,377 | |
| | | පෝලන්තය | 135,426 | |

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) (i) 1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වගන්තිය හා 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 25(3) වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව හා පනතට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් තොරව ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචි අලුත්කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු 2010 ජූලි 29 දින මණ්ඩලය විසින් වැඩිකර තිබුණි. |

| | |
|---|---|
| (ii) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පනතේ 13 හා 14 වගන්ති | සෙස් අරමුදල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ විධිවිධානවලට සංශෝධන සිදුකර නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 132 වගන්තිය | 2012 අගෝස්තු 02 සිට 2013 අගෝස්තු 01 දක්වා කාල පරිච්ඡේදය සඳහා තේ ප්‍රවර්ධන අංශයට පත්කරන ලද ව්‍යාපෘති උපදේශකවරයාට ගෙවන ලද රු.1,560,000 ක් වූ මුළු වැටුප්වලින් උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) රජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 507 | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් පිළිබඳ පොත්වල ශේෂයන් හා වටිනාකම් සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට ගෙන නොතිබුණි. එබැවින් පොත්වල සටහන් කර තිබූ ප්‍රමාණයන් හා භෞතිකව තිබූ ශේෂයන් අතර වෙනස්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල දක්වා නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමීක්ෂණ මණ්ඩලයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඉ) 2012 දෙසැම්බර් 24 දිනැති අංක 2012 එම්එස්ඩී 49 සහ 2013 දෙසැම්බර් 09 දිනැති අංක 01/2013 (i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමෙන් තොරව 2012 හා 2013 වර්ෂ සඳහා වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.19,071,236 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,390,437 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.30,461,673 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ලියාපදිංචි හා අළුත් කිරීමේ ආදායම වැඩිවීම සහ පරිපාලන හා මෙහෙයුම් වියදම් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මූල්‍ය හා භෞතික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම.

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රගති වාර්තාවලට අනුව ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පහත දැක්වේ.

(අ) සංවර්ධන කාර්යයන්

| | කාර්යය | වෙන්කිරීම | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | භෞතික ඉලක්කය | මූල්‍ය ඉලක්කය | භෞතික ඉලක්කය |
| | | රු.මිලියන | | රු.මිලියන | |
| i | කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය | 16 | කම්හල් 65 | 17.96 | කම්හල් 39 |
| ii | තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය | 16 | හෙක්ටයාර් 250 | 14.36 | හෙක්ටයාර් 259 |

| | | | | | |
|---|---|---|---|---|---|
| iii | පසු අස්වනු හානි අවම කිරීම. | 12 | කම්හල් 35 | 1.42 | කම්හල් 15 |
| iv | SLSI/SLTB තත්ත්ව නිෂ්පාදන සහතිකය | 01 | වැඩසටහන් 35 | 0.46 | - |
| v | කම්හල් පදනම් තේ සංවර්ධන වැඩසටහන් | 0.30 | වැඩසටහන් 35 | 1.79 | වැඩසටහන් 15 |
| | එකතුව | 45.30 | | 36.00 | |

ඉහත තොරතුරු අනුව, තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමයේ කාර්යය පමණක් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර තිබුණි.සමාලෝචිත වර්ෂය තුළ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නවීකරණය කිරීම සඳහා කම්හල් 65 ක් ඉලක්ක කර තිබුණද රු.මිලියන 1.96 කින් මුදල් වෙන් කිරීම ඉක්මවමින් කම්හල් 39 ක් පමණක් නවීකරණය කර තිබුණි.

(ආ) ගොඩනැගිලි හා ව්‍යුහයන්

| | කාර්යය | ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | වෙන්කිරීම | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| i | ශ්‍රවනාගාර හා ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම. | 20 | - | - |
| ii | කළුතර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම. | 08 | - | - |
| iii | නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම. | 12 | 0.05 | ප්‍රගතියේ පවතී. |
| | එකතුව | 40.0 | 0.05 | |

ඉහත කාර්යයන් ද සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පරිදි නිමකර නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. සභාපතිගේ පිළිතුරට අනුව, " ශ්‍රවනාගාර ඉදිකිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට, මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර අනුමැතිය සඳහා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා දී නොතිබුණු බැවින් ඉදිකිරීම සිදුකිරීමට නොහැකි විය " යනුවෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම.

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම අනුව, පහත සඳහන් වත්කම් සැලසුම් කළ පරිදි මිලදී ගෙන නොතිබුණි.

| වත්කම | වටිනාකම |
|---|---|
| | රු.මිලියන |
| තොරතුරු තාක්ෂණ ඒකකය සඳහා උපකරණ | 12.11 |
| රසායනාගාර උපකරණ | 7.80 |
| | 19.91 |

## 4.2 තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා ගාස්තු

තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම ප්‍රකාරව අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑම් එකකට රු.3.50 බැගින් තේ අපනයනකරුවන්ගෙන් එකතු කරන ලද ගාස්තු සහ මණ්ඩලය විසින් 2010 නොවැම්බර් 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ තේ ප්‍රවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම් පහත දැක්වේ.

| වර්ෂය | අයකරන ලද ගාස්තු | ආයෝජන මත පොලිය | වෙනත් ආදායම | මුළු ආදායම | මුළු වියදම |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2013 | 1,156.37 | 363.80 | 3.60 | 1,523.76 | 336.32 |
| 2012 | 1,186.45 | 211.48 | - | 1,397.93 | 36.02 |
| 2011 | 1,113.81 | 66.44 | - | 1,180.26 | 25.76 |
| 2010 | 194.28 | - | - | 199.28 | - |
| එකතුව | 3,650.91 | 641.72 | 3.60 | 4,296.23 | 398.10 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් සැලැස්මක් හා කළමනාකරණයක් නොමැතිවීම හේතුවෙන් රු.මිලියන 4,296.23 ක් වූ මුළු ආදායමෙන් රු.මිලියන 398.10 ක මුදලක් හෙවත් සියයට 9.27 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රවර්ධන හා වෙළඳපොල උපාය මාර්ග සඳහා උපයෝජනය කර තිබුණි.

(ආ) ගාස්තු එකතු කිරීමේ ප්‍රධාන අරමුණ තේ ප්‍රවර්ධන හා වෙළඳපොල උපාය මාර්ග සඳහා උපයෝජනය කිරීම සඳහා වුවද, ප්‍රවර්ධන කාර්යයන් සිදුකිරීම ප්‍රමාද වීම හේතුවෙන්, එම මුදල් කෙටිකාලීනව ආයෝජනය කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ පොලී ලෙස රු.මිලියන 641.72 ක මුදලක් උපයා තිබුණි.

(ඇ) 2013 වර්ෂය සඳහා අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම අනුව, වෙළඳපොල බුද්ධිමය තොරතුරු කාර්යයන් සඳහා රු.මිලියන 19.95 ක මුදලක් වෙන්කර තිබුණි.එසේ වුවද 2013 වර්ෂය සඳහා යුරෝ මොනිටර් ගෝලීය පර්යේෂණ දත්ත රැස්කිරීම (Euro Monitor Global Research Data Collection) සඳහා කරන ලද රු.මිලියන 2.45 ක ගෙවීම හැර සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පර්යේෂණ කාර්යයක් සිදුකර නොතිබුණි.තවද, යෝජිත ගෝලීය ව්‍යාපාර සඳහා නව වෙළඳපොල කුටියට ව්‍යාපෘති උපදේශකවරයකු හා " ග්‍රැෆික් ඩිසයිනර් " වරයකු කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් රු.130,000 ක හා රු.31,500 ක මාසික වැටුපකට 2012 අගෝස්තු 02 දින පත්කර තිබුණි.කෙසේ වුවද මෙම කාර්යයද 2013 අගෝස්තු 30 දක්වා ක්‍රියාත්මක කර නොතිබූ අතර රු.1,406,391 ක මුදලක් වර්ෂය තුළ වැටුප් ලෙස ගෙවා තිබුණි. ව්‍යාපෘති උපදේශකවරයා ඔහුගේ කොන්ත්‍රාත් කාලය අවසන් වූ 2013 අගෝස්තු 01 දින සේවයෙන් ඉවත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රවර්ධන හා වෙළඳපොළ උපාය මාර්ග වෙනුවෙන් රු.මිලියන 1,995 ක අයවැය ප්‍රතිපාදනයක් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 336.32 ක මුදලක් හෙවත් සියයට 16.85 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඉ) රටවල් 28 ක ඒක ජාතීය කාර්යයන් (Uni – National Activities) සඳහා රු.මිලියන 1,197 ක මුදලක් වෙන් කර තිබුණද, එම කාර්යය යටතේ රු.මිලියන 42.18 ක මුදලක් (සියයට 3.5 ක්) පමණක් වැය කර තිබුණි. 2013 වර්ෂයේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය ප්‍රධානීන්ගේ (C H O G M) රැස්වීම්වලට එක්සත් ජාතීන්ගේ කාර්යයන් යටතේ ගෙවීම් වලින් වැඩි ප්‍රමාණයක් සිදු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) කොළඹ තුරඟ තරඟ පිටිය ගොඩනැගිල්ලේ " ටී හවුස් " මධ්‍යස්ථානයක් කුලී පදනම මත ස්ථාපනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් වියදම් දරා තිබූ අතර 2014 පෙබරවාරි 28 දිනෙන් ආරම්භ වන වර්ෂ 10 ක් සඳහා ආපසු නොගෙවන කුලී තැන්පතු වලින් සියයට 50 ක්ද ගෙවා තිබුණි.

| | රු. |
|---|---:|
| වර්ෂ 10 ක් සඳහා ආපසු නොගෙවන කුලී තැන්පතු වලින් සියයට 50 ක් | 8,571,360 |
| ඉදිකිරීම සහ අභ්‍යන්තර වැඩ (ආලෝකකරණය, බිම කොන්ක්‍රීට් කිරීම හා කාපට් කිරීම,ජලනල එළිම,තීන්ත ගෑම ආදිය) | 11,934,325 |
| මුළුතැන්ගෙයි උපකරණ මිලදී ගැනීම | 6,635,547 |
| වායු සමීකරණ සවිකිරීම. | 1,482,819 |
| ලී බඩු හා මුළුතැන්ගෙයි විෂයයන්ට අදාළ මාර්ගස්ථ භාණ්ඩ | 16,813,383 |
| | 45,437,434 |

ඉහත වියදම් වලට අමතරව, ආරම්භක අරමුදල, මාසික කුලිය, මාසික කළමනාකරණ ගාස්තු ලෙස පිළිවෙලින් රු.4,000,000 ක්, රු.270,000 ක් සහ රු.300,000 ක් " ටී හවුස් " ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවා තිබුණි. කෙසේ වුවද " ටී හවුස් " ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 මාර්තු සිට ඔක්තෝබර් දක්වා පළමු මාස 6 ක කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 4.59 ක පාඩුවක් දරා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙනුවෙන් රු.මිලියන 665 ක මුදලක් වෙන්කර තිබුණද, මෙම කාර්යය සඳහා රු.මිලියන 207.96 ක් පමණක් වර්ෂය තුළ වැයකර තිබුණි.ඒ අනුව රු. මිලියන 457 ක අධි ප්‍රතිපාදනයක් මේ සම්බන්ධයෙන් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඌෟ) ක්‍රිකට් අනුග්‍රාහක ගිවිසුම අනුව, ටී ෂර්ට් 9943 ක් මිලදී ගැනීම සඳහා රු.9,943,000 ක මුදලක් වැයකර තිබුණි.කෙසේ වුවද මෙම ටී - ෂර්ට් වර්ෂය තුළ අපේක්ෂිත පරිදි විකුණා නොතිබුණි.ටී - ෂර්ට් විකිණීම මත ලාභය ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.3,521,500 ක මුදලක් දක්වා තිබුණද 2014 වර්ෂයේදී රු.1,229,000 ක් පිරිවැය වූ ටී - ෂර්ට් 1,229 ක් ආපසු යවා තිබුණි. එබැවින් ටී - ෂර්ට් විකිණීම මත ලාභය රු.1,711,200 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ලෝක තේ අපනයන රටවල් අතරින් ලෝක වෙළඳපොළේ ලංකා තේ වල තත්ත්වය පසුගිය වර්ෂ 5 ක් සඳහා අඛණ්ඩව තුන්වැනි තැනට පත් වී තිබුණු අතර අරමුදල් තිබියදීත් මණ්ඩලය විසින් විධිමත් ප්‍රවර්ධනාත්මක කාර්යයන් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (පරිපාලන හා මුදල් ) නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) නියෝජ්‍ය හා සහකාර තේ කොමසාරිස් (ප්‍රාදේශිය), ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ තේ පරීක්ෂකවරු / උපදේශකවරු 34 ක්, කාර්මික සහකාර (රසායනාගාර) 08 ක් ඇතුළත්ව 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 79 ක් පැවතුණි. තවද, නිෂ්කාර්ය තනතුරු 33 ක් තථ්‍ය කාර්ය මණ්ඩලයට ඇතුළත් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බඳවා ගැනීම් යෝජනා ක්‍රමයේ 5.4 ඡේදය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ කළමනාකාර සහකාරවරුන් 14 ක් පත්කර තිබුණි. තවද මෙම පත්කිරීම් සඳහා 5.4.1 ඡේදය ප්‍රකාරව පරිගණක දැනුම පිළිබඳ පරීක්ෂණයක් ද පවත්වා නොතිබුණි.

(ii) 2012 වර්ෂයේදී පත්කරන ලද කළමනාකාර සහකාරවරුන් 09 දෙනෙකු අතුරින් 05 දෙනෙකු බඳවා ගැනීම් යෝජනා ක්‍රමයේ 5.3.1 ඡේදය ප්‍රකාරව අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු අතර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමෙන් තොරව ඔවුන් දැනටත් සේවයේ නිරත වී සිටී.

(iii) අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන) තනතුර වෙනුවෙන් බඳවා ගැනීම සඳහා 2013 අප්‍රේල් 07 දින රු.87,024 ක පිරිවැයකට පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණි.එසේ වුවද කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබු අතර දැන්වීම සඳහා වැය කරන ලද මුදල් ඵලරහිත වියදමක් බවට පත්ව තිබුණි.

(iv) විධිමත් කාර්ය මණ්ඩලය මාරුකිරීමේ ක්‍රමයක් මණ්ඩලය විසින් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය.

## 4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ල 2002 දෙසැම්බර් 31 දින සිට හිස් වී තිබුණු අතර, පරිශ්‍රයේ අයිතිකරු වෙත තැන්පත් කරන ලද රු.මිලියන 2.4 ක කුලී අත්තිකාරම 2005 වර්ෂයේ සිට 2011 මැයි දක්වා රු.මිලියන 2.8 ක මුදලක් වැය කර තීරකවරයෙක් මඟින් මණ්ඩලය විසින් අය කර ගෙන තිබුණි.කෙසේ වුවද පරිශ්‍රයේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා 2003 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කුලියට දීම සඳහා ගොඩනැගිලි භූමිය ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමට නොහැකි වීම වෙනුවෙන් සියයට 20 ක පොලිය හා සියයට 15 ක එකතු කළ අගය මත බදු සමඟ රු.මිලියන 4.9 ක මුදලක් ඉල්ලමින් 2008 ඔක්තෝබර් මාසයේ දී මණ්ඩලයට එරෙහිව තීරකවරයෙක් පත්කර තිබුණි. මණ්ඩලය මෙම නඩුවට එරෙහිව අභියාචනයක් කර ඇති අතර නඩුව ක්‍රියාත්මක වෙමින් පවතී.සභාපතිගේ පිළිතුරට අනුව, අයිතිකරුට ගෙවිය යුතු මුළු ගෙවීම රු.මිලියන 14 ක් විය හැකි බව උපකල්පනය කෙරේ.කෙසේ වුවද මෙම තීරණයට එරෙහිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අභියාචනයක් ගොනු කර තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී මිලදී ගත් රු.මිලියන 32 ක් වටිනා රසායනාගාර උපකරණ (LCMC) 2014 ජූලි 14, විගණන දිනය දක්වා නිෂ්කාර්යව පැවතුණි. උපකරණ දැනට විධිමත්ව ක්‍රියාකරන බවත්, පරීක්ෂණ වාර්තා එයින් ලබාගන්නා බවත් සභාපති විසින් දන්වා තිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිනිය වෙත වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඈ) ප්‍රවර්ධනාත්මක කාර්යයන්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)